ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2023 අගෝස්තු 30 වන බදාදා
3 කාණ්ඩය 39 කලාපය
මිල රු. 80 යි

විශේෂ
අතිරේකයක්
නොමිලේ

කොච්චර ලස්සන වුණත් නන්දා මාලනී විකුණන්න බෑ

මී හරකෙක් ඉන්න කේක් එකක් මුලින්ම හැදුවෙ මමයි

වෛද්‍ය
ප්‍රියා සම්මානි

ඡායාරූපය - සිතුප ජයමාන්න
හැඩගැන්වීම - සනාරි අයාමා Kalopsia Beauty Lounge- මහරගම
පසුතලය - සෝලිස් හොටෙල්, පිටකෝට්ටේ

ධරණී කූපනය පුරවා විදුලි බිලෙන් නිදහස් වෙන්න

විදුලි බිල නිසා උදහස් වෙලාද?

නිදහස් කරන්න ධරණී සූදානම්

ඔබ කළ යුත්තේ කූපනය පුරවා එහි ඡායාරූපයක් සහ ජූලි මාසයේ විදුලි බිලේ ඡායාරූපයක් සමඟ

0765 120 148 වට්ස්ඇප් කිරීම පමණයි

සැ.යු.

ඔබ අප වෙත එවන විදුලි බිලේ මෙම මාසයට අදාළව ගෙවිය යුතු මුදල සහ විදුලි ගිණුම් අංකය අපැහැදිලිනම් එය ප්‍රතික්ෂේප වනු ඇත.
විදුලි බිලේ සඳහන් විදුලි ගිණුම් අංකය පැහැදිලිව දිස්විය යුතු අතර ඔබේ කූපනයේද එය පැහැදිලිව සඳහන් කළ යුතුය.

අංක 03

දිරිය ධරණී

විදුලි බිලෙන් නිදහස් කරන ධරණී

සම්පූර්ණ නම..

....

ලිපිනය..

....

....

ජා.හැ. අංකය...

දුරකථන අංකය ....

විදුලි ගිණුම් අංකය
(විදුලි බිලේ සඳහන් ගිණුම් අංකය

....

උපරිමය රු. 10.000ට නොවැඩි විය යුතුයි (කොන්දේසි සහිතයි)

2023.08.23 ධරණී පුවත්පතේ පළවූ කූපනය පුරවා එවා විදුලි බිලෙන් නිදහස් වූ ජයග්‍රාහකයෝ

01. **දඩල්ලගේ ප්‍රේමාවතී**
නො.08, වන පියස අසල,
නව නගරය, ඇඹිලිපිටිය.

02. **S.S.වසන්ත කුමාර**
මහයාය, පහළ කුරුවිට, කුරුවිට.

03. **හේන්පිට ගමගේ සෝමලතා**
නො.85/4, උඩුගම පාර, ගාල්ල.

04. **E.P.කරුණාරත්න**
'රත්න නිවස', මැණික්කඩවර,
තුංතොට.

05. **ගීකියනගේ චමරී දිල්රුක්ෂි**
194, රඹුක්කනගොඩ, පැළෑඳ.

06. **සුනිල් ජයන්ත වැලිකල**
38/100, ගාලබැඳිහේන,
වෙන්දේසිවත්ත, වටරැක, මීගොඩ.

07. **විජේසුන්දර පතිරන්නැහැලගේ නාලනී නිව්පින්**
නො.33A, කඳඹඑවාව, බෙම්මුල්ල.

08. **කිතුල්හේනේ ගෙදර දමයන්ති**
413/සුබෝධාරාම පාර, පේරාදෙණිය.

09. **දිසානායක මුදියන්සේලාගේ නීල්**
93/2, කලුගලයාය, මදුරුකැටිය,
මොනරාගල.

10. **G.ඉනෝකා නිල්මිණී කුමාරි**
නො.1490, ට්‍රැක් 8, පදවි-ශ්‍රීපුර

11. **පැලවත්ත අතුකෝරල පියදාස**
මොට්ටුන්න, වේයන්ගොඩ.

12. **ගංගොඩ ගමාච්චිගේ නයනා**
සුරංගිකා සිරිවර්ධන
නො.1/5, කොටිගල, දික්කුඹුර.

13. **සෝමරත්න ජයසිංහ**
මාපලාන, කඹුරුපිටිය.

14. **මද්දුම ගමගේ පියතිස්ස**
පැලපොල්වත්ත, දියලපේ,
අකුරැස්ස.

15. **W.J.G.S.C.රුවිරාණි ප්‍රනාන්දු**
නො.105, ශාන්ත අන්තෝනි පාර,
කඩලාන, මොරටුව.

16. **සෙම්බකුට්ටි රෝහිත සිල්වා**
නො.10/1බී, එඬේරමුල්ල, අම්බලන්ගොඩ.

17. **B.A.නිලූකා සාරාංගනී**
100/A, මාවතගම, පාදුක්ක.

18. **L.B.D.සිල්වා**
ශාන්ති නිවස, ශුද්ධ නගරය, පොලොන්නරුව.

19. **අබේපිටියගේ දොන් නිමල් රත්නසිරි**
157, දැහැමි, ඕර්චඩ්වත්ත, නිට්ටඹුව.

20. **N.H.මාර්ටින් සිඤ්ඤෝ**
නො.225, දික්හේනගම,
මූනගම, හොරණ.

21. **උඩතැන්නේ ගෙදර ජයසිංහ**
අංක 240, නුවරඑළිය පාර,
කටුකිතුල.

දුවගෙ අතපය කඩා වැටෙද්දිවත් ඒ දොස්තර අපිට ඉස්පිරිතාලෙට යන්න දුන්නෙ නෑ

ඇමරිකානු නවකතාකරු ඒනස් එමන්වේගේ කතාවක් තියෙනවා 'මහල්ලා සහ මුහුද' කියලා. ඕකෙ ඉන්නවා මහලු තාත්තා කෙනෙකුයි රෝගයක් නිසා එක්තැන් වුණ පුතෙකුයි. ඒ තාත්තා රස්සාවට කියලා කළේ මුහුදු යන එක. ඒ නිසාම මේ දෙන්නා ජීවත්වුණොත් මුහුද අයිනේ පුංචි අතුපැලක. මොන ප්‍රශ්නෙ තිබුණත් මේ තාත්තාට තිබුණෙ එකම එක බලාපොරොත්තුවයි. ඒ තමන්ගේ අන්තිම හුස්ම යන්න කලින් පුතාට බෙහෙත් කරලා සුව කරගන්න එක.

අර කතාවටත් කියනවානේ ගහේ ගෙඩි ගහට බර නැතත් වටේපිටේ උන්ට බරයි කියලා. ඒ විදියට කාලයක් යනකොට තාත්තාට බරක් වුණ කාලකණ්ණියා කියලා රට්ටු අර පුතාට පදපලිච්චි කියන්න ගත්තා. ඒ නිසා ඔහු ජීවත්වුණේ ඒ ගැන දැඩි හිත් වේදනාවකින්. ඒ වෙලාවට අර මහලු තාත්තා කළේ පාළු මුහුද ළඟට වෙලා පුතාගේ හිත හැදෙන විදියේ කතන්දර කියපු එක.

දවසක් මේ මහලු පියා පුතාට මෙන්න මෙහෙම කතාවක් කියනවා.

"පුතේ දවසක මට ඔයාව හොඳ කරන්න මේ මුහුදෙ ඉන්න ලොකුම මාළුවව අල්ලගෙන එන්න වුණොත් මම ඒකත් කරන්න දෙපාරක් හිතන්නෙ නැහැ" කියලා.

ඒ වෙලාවෙ අර පුතා කියනවා **"නිකමටවත් තාත්තා එහෙම කළොත් ඒ සතුටටම මගේ කකුල් දෙකට ඉබේටම පණ ඒවි"** කියලා.

ඒ වෙලාවේ මේ පුතා කියපු කතාව මේ මහලු පියාගේ හිතට තදින්ම කාවදිනවා. පුදුමේ කියන්නෙ ඔහු ඊට පහුවදම මුහුදෙ ඉන්න ලොකුම මාළුවව ගේන්න මුහුදු යනවා.

ඒ ගියාට මොකද ඒක කරන්නෙ කොහොමද කියන එක ගැන හරි අදහසක් ඔහුට තිබුණේ නැහැ. ඔහොම ටිකෙන් ටික මුහුද මැදට යනකොට ඇතෙක් තරම් ලොකු තල්මහෙක් බෝට්ටුව වටේට කැරකෙන්න ගත්තා. ඒක දැකපු මහල්ලා බෝට්ටුවෙ තිබුණ යකඩ පොල්ලක් අරන් අර තල්මහගේ ඔලුවට ගැහුවා. තනි මිනිහෙකුට තල්මහෙක් එක්ක ඔට්ටු වෙනවා කියන එක ලේසි නෑනේ. එහෙමයි කියලා මිනිහා වැඩේ අතෑරියෙ නැහැ. එකදිගට දවස් තුනක් මහ මුහුදත් එක්ක ඔට්ටු වෙලා අර තල්මහව මරාගෙන කඹේකින් ගොඩබිමට අරන් ආවා.

අන්තිමට වයසක මිනිහෙක් තල්මහෙක් අල්ලගෙන ඇවිත් කියලා වැල්ලෙ එකම ගාලගෝට්ටියයි. අහල ගම් හතේම උන් එක පොදියට තල්මහව බලන්න වැල්ලට ආවා. ඒ අස්සෙ තාත්තා මුහුදෙ ඉන්න ලොකුම මාළුවව ගෙනැල්ලා කියලා පුතාගෙ කනටත් යනවා. අන්තිමට ඔය කතාව ඉවර වෙන්නෙ අර කියපු විදියටම පුතාගෙ කකුල් දෙකට පණ ඇවිල්ලා හිටු කියලා වැල්ලට දුවන තැනින්.

දෙමව්පියෝ එහෙමයි. තමන්ගේ දරුවෙක්ගේ ලෙඩදුක් නිවාරණය වෙනවා, දරුවොන්ට හොඳ කලක් යනවා කිව්වොත් මුහුදත් එක්ක විතරක් නෙවෙයි මුළු ලෝකෙත් එක්ක වුණත් හැප්පෙයි. මොරතොට ඕපනායක පදිංචි ඩී.කේ. කුමාරයි, අයෝමි උත්පලයි කියන්නෙත් ඒ වගේ දෙමව්පියෝ දෙන්නෙක්.

දොස්තර මහත්තෑන් කෙනෙක්ගෙන් වුණාය කියන අත්වැරදීමක් නිසා අසාධ්‍ය තත්ත්වෙන් ඉන්න තමන්ගේ දුවව ගොඩදාගන්න මේ අම්මයි තාත්තයි ගන්න වෙහෙස දැක්කහමයි අර මහලු මනුස්සයගේ කතාව මතක් වුණේ.

පහුගිය අප්‍රේල් හයවැනිදා කුමාරයි, අයෝමියි එයාලගේ එකම දුව නිමන්සාව මොරතොට බෙහෙත්ශාලාවකට එක්කගෙන ගිහින් තිබුණේ උණට බෙහෙත් ටිකක් අරගෙන දෙන්න. හැබැයි කියන විදියට එතැනදි ඒ අයට වෙලා තියෙන්නෙ වළින්න ගිය දේවාලෙටම යට වෙන්න.

"එදා දුවට හොඳටම උණ තිබුණා. වෛරස් උණක් නිසා අපි එයාට මොරතොට හන්දියේ පෞද්ගලික බෙහෙත්ශාලාවකින් බෙහෙත් අරන් දුන්නා. ඒක කහවත්ත මූලික රෝහලේ වැඩ කරන දොස්තර මහත්තයෙක්ට අයිති බෙහෙත්ශාලාවක්."

නිමන්සා හුණුවල ධර්මරාජ විද්‍යාලයේ ඉගෙනගත්තු වයස අවුරුදු 11ක දුවෙක්. අධ්‍යාපන කටයුතුවලට වගේම බාහිර වැඩවලටත් දක්ෂ නිසා පාසලේ ශිෂ්‍ය නායිකාවක් විදියටත් කටයුතු කළාලු.

"06 වැනිදා හවස ගත්ත බෙහෙත්වලින් අපි දුවට දුන්නෙ රෑට දෙන්න තිබුණ බෙහෙත්වේල විතරයි. පහුවදා උදේ දුව නැගිටිනකොට එයාගේ මුළු ඇඟ පුරාම රතුම රතු පාට බිබිලි ගොඩක් දාලා තිබුණා. ඒ වෙලාවේ අපි හොඳටම බයවෙලා ආපහු සැරයක් අර ඩොක්ටර් ළඟටම එක්කගෙන ගිහින් දුවව පෙන්නුවා. ඒ වෙලාවෙත් ඩොක්ටර් කිව්වේ කිසිදේකට බයවෙන්න එපා දුවට තියෙන්නෙ සරම්ප කියලා. හැබැයි ඒකත් කිව්වෙ ලේ පරීක්ෂාවක්වත් කරලා නෙවෙයි. මොනවා වුණත් අපිට දොස්තර

බෙහෙත් විෂ වීමට පෙර

බෙහෙත විෂ වූ පසු

පියා

මව

මහත්තයට ඉහළින් යන්න බැරි නිසා අපිත් ඒ කියපු දේ පිළිගත්තා."

දොස්තරවරු මිහිපිට දෙවිවරු කියලා කියන්නේ ලෙඩක් දුකක් වුණු වෙලාවට ඒ උත්තමයො ඇරෙන්න වෙන පිහිටක් අපිට නැති නිසයි. කුමාරටයි අයෝමිටයි වුණත් ඒ වෙලාවේ එහෙම හිතෙන්න ඇති.

"ඊටපස්සෙ ඩොක්ටර් ආපහු සැරයක් ෆාමසියෙන් ගන්න කියලා අලුත් බෙහෙත් වර්ග දෙකක් ලියලා දුන්නා. එතැන බොන බෙහෙතකුත් එක්ක ඇහැට දාන බෙහෙතකුත් තිබුණා. පස්සෙ අපි ඒ කියපු විදියටම බෙහෙත් ටික අරන්, බොන්න දීපු බෙහෙත් පොවලා අනිත් එක දුවගෙ ඇස්වලට දැම්මා."

ඒ වුණාට පහුවැනිදා උදේ වෙනකොට නිමන්සාගේ තත්ත්වය තිබුණාටත් වඩා බරපතළ වෙලා කියලා මේ අම්මා අපිත් එක්ක කිව්වේ කඳුළු පිහිදාන ගමන්.

"අටවැනිදා උදේ වෙනකොට දුවව අපිටවත් අඳුරගන්න බැරිතරම් වෙනස් වෙලා හිටියා. එයාගේ ඇස් අරින්න පුළුවන් වුණාට වැඩි වෙලාවක් ඇරගෙන ඉන්න බැරි වුණා. ඇස් වටේටම රතුවෙලා මුළු ඇඟම කළුම කළු වෙලා. ඒ විතරක් නෙවෙයි ඇඟ පුරාම තුවාල දාලා අතපය පණ නැතුව කඩන් වැටෙන්න ගත්තා.

ඒ වෙලාවේ අපි දෙන්නා දුවව ගෙදර තියලා ගිහින් ඩොක්ටර්ට මේ ගැන කිව්වා. ඒ කිව්වාමත් කිව්වෙ දුවට සරම්ප කියලා එයාට සීයට දෙසීයක් විශ්වාසයි කියලා. ඒක නිසා ඉස්පිරිතාල ගානේ උස්සගෙන දුවන්නෙ නැතුව දවස් හතක් ගෙට කරලා තියලා පස්සේ නාවන්න කිව්වා."

කුමාරයි අයෝමියි ඒ වෙලාවේ නම් දොස්තරගේ ඒ වචන ටිකෙන් සෑහීමකට පත්වෙලා නැහැ. ඒ නිසා ඔවුන් ඒ වෙලාවෙම නිමන්සාව රත්නපුර මහරෝහලට අරගෙන ගියාලු.

"රත්නපුර මහ ඉස්පිරිතාලේ බාහිර රෝගී අංශයෙන් දුවව ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයෙක් ළඟට යොමු කළා. දුවට වැරදි බෙහෙතක් විසවෙලා මිසක් සරම්ප නෙවෙයි කියලා කිව්වේ ඒ දොස්තර මහත්තයා. දුවව එවෙලෙම ICU දාන්න ඕන කිව්වා. ඒත් රත්නපුර මහ ඉස්පිරිතාලෙ ICU එකක් තිබුණෙ නැහැ. ඒක නිසා එවෙලෙම ඇම්බියුලන්ස් එකකින් අපිව කොළඹ රිජ්වේ ආර්යා එකට එව්වා. එදා ඉඳලා අපි මාසයක් එකදිගට දුවවත් තියාගෙන කොළඹ රිජ්වේ ආර්යා එකේ නැවතිලා හිටියා. එහෙන් කරපු හැම පරීක්ෂණයකින්ම තහවුරු වුණේ දුවට වැරදි බෙහෙතක් විසවෙලා කියන එක. පස්සෙ අපි මොරතොට ඩොක්ටර්ට කෝල් කරලා ඒ ගැන කිව්වම එයාත් ඩොක්ටර් කෙනෙක් වුණාට වරදින්න පුළුවන් ඕවා සාමාන්‍ය දේවල් කිව්වා. අනික එදා ලේ එකක්වත් චෙක් කරන්නෙ නැතුව බෙහෙත් දීපු නිසා ඔය වගේ දේවල් වෙන්න පුළුවන් කියලත් කිව්වා."

වැටත් නියරත් ගොයම් කා නම් කාට පවසම් ඒ අමාරුව කියන්නා වගේ ඒ උදව්යම ඒ විදියට කියනකොට නිමන්සාගේ දෙමව්පියෝ කොයිතරම් අසරණ වෙන්න ඇද්ද?

"ඒ වෙලාවේ අනවශ්‍ය ප්‍රශ්නයක් ඇති කරගත්තොත් දුවගෙ ජීවිතේ තවත් අවදානමක වැටෙන නිසා අපි ඉවසුවා. එදා ඉඳන් අද වෙනකන් දුවගේ ජීවිතේ බේරගන්න ඕට්ටු වුණා මිසක නීතියෙන්වත් පිහිටක් ඉල්ලගෙන යන්න අපිට වෙලාවක් තිබුණෙ නැහැ."

එක පැත්තකින් තමන්ට ඉන්න එකම දරුවට දවසින් දවස අසාධ්‍ය වෙනවා. අනිත් අතට අහස උසට ගිහින් තියෙන බෙහෙත් මිල නිසා කුමාරටයි අයෝමිටයි ඒ දේවල් තනියම දරාගන්න අමාරුයි කියලත් මේ දෙමාපියෝ දෙන්නා අපිත් එක්ක කිව්වා.

"දුව තාමත් බෙහෙත් ගන්නෙ කොළඹ රිජ්වේ ආර්යා රෝහලෙන්. සති දෙකෙන් දෙකට අනිවාර්යයෙන්ම කොළඹ යන්න ඕනෙ. දුව ඉන්න තත්ත්වෙත් එක්ක එයාව බස්වල ගෙනියන්න බැහැ. ත්‍රීවිල් එකක කොළඹ යන්න රුපියල් 8000ක් විතර යනවා. මග වියදම්වලටයි දුවගේ බෙහෙත්වලටයි විතරක් අපිට මාසෙකට රුපියල් 50000 කට එහා පැත්තෙ යනවා. මේ මොනවා කළත් දොස්තර මහත්තුරු කියන්නෙ දුවගේ තත්ත්වෙ තාමත් ලොකු වෙනසක් නැහැ කියලා. ඉස්සරහට තවත් ස්නායු අබාධ වැඩිවෙන්න පුළුවන් කියලත් කියනවා."

හිතේ දැහිරියෙන් කොහොමහරි නිමන්සාව සුව කරගන්නවා කිව්වා ඇරෙන්න කුමාරයි අයෝමියි අපෙන් සල්ලි ඉල්ලුවෙ නැහැ. හැබැයි නිමන්සාට ආපහු ජීවිතයක් දෙන්න අත දෙන්න පුළුවන් කෙනෙක් ඉන්නවා නම් අයෝමිටයි කුමාරටයි කතා කරන්න කියලයි අපි ඔයාලගෙන් ඉල්ලන්නේ. 0779601114 මේ ඒ අයගේ අංකය.

(අප මෙම සිද්ධියට සම්බන්ධ යැයි කියන කහවත්ත මොරතොට පාරේ පෞද්ගලික බෙහෙත්ශාලාව පවත්වාගෙන යන D.R.E.M.S.චන්ද්‍රසේන යන වෛද්‍යවරයාව සම්බන්ධ කරගැනීමට කිහිපවරක් උත්සාහ කළත් එය සාර්ථක වූයේ නැත.)

■ ලිහිණි මධුෂිකා

අම්මා අප්පා මතක් කරලා බනින්න හිතෙන අය දිහා ඇයි බලන්නේ?

කරුණාරත්න දිවුල්ගනේ මහත්තයා ගායනා කරන 'ඔබ මා හමුවුණු මේ ඉරහඳ යට' කියන ගීතය ටිකක් මතක් කරගන්න පුළුවන්ද? ඒ ගීතය ඇහෙනකොට ඉබේටම වගේ ඒක මිමිනෙන ගතියක් තියනවා නේද? සමහර වෙලාවට සින්දුව ඇහිලා පැයක් දෙකක් යනකලුත් ආයාසයක් නැතුව අපේ මනසේ ඒකේ තනුව, නැත්නම් පද පේළි වාදනය වෙනවා.

සමහරවිට ගීතයේ තනුව වගේම පද පේළිත් ඉතාම සංවේදී වීම ඒකට හේතුව වෙන්න ඇති.

'ඔබ මා හමුවුණු මේ ඉරහඳ යට කොතැනක සිටියත් මා මල දවසක මගෙ ළඟ තනියට ඉනු මැනවී' කියලා පළවැනිම වතාවට ඔය සින්දුව ඇහුණු දවසේ මම හිතන්නේ මගේ ඇස්වලට නම් කඳුළු ආවා. ඇත්තටම කිව්වොත් සිංදුවේ කියන විදියට මල දවසක ළඟ ඉන්න කියලා ආයාචනා කරන්න තරම් ප්‍රේමයක් ඒ කාලෙ තිබුණු බවකුත් මට මතක නෑ. හැබැයි දිවුල්ගනේගේ හඬට තිබුණු ලොල් බව නිසා සහ මොකක්දෝ හේතුවක් නිසා මේ ගීතයේ පද පේළිවලින් හදවතේ ඇති කරන සියුම් රිදුම හින්ද, හේතුවක් ඇතුව හෝ නැතුව කාලයක් මමත් ඔය සින්දුව නිතර ඇහුවා. සමහරවිට මේ ගීතයම හෝ ඒ හා සමාන වෙනත් ගීත සම්බන්ධයෙන් ඔයාටත් ඒ වගේ අත්දැකීම් ඇති.

ඉතින් ඇයි අපි මෙහෙම සින්දු මෙච්චර කැමැත්තෙන් අහන්නේ?

ඔයා අහලා තියනවාද, මනුෂ්‍යයා කියන සත්ත්වයා ස්වභාවයෙන්ම දුක හිතෙන දේවල්වල ඇලෙන්න, ගැලෙන්න සහ දුකට නැඹුරු වෙලා ඉන්න කැමැති කෙනෙක් කියලා? සතුටු වෙන්න කොච්චර දේවල් තිබුණත්, අඩුම තරමේ දුක හිතෙන සින්දුවක් හරි අහලා මූඩ් ගහගෙන ඉන්න පොඩි කැමැත්තක් අපි හැමෝගෙම ළඟ තියෙනවා නේද?

අන්න ඒකම තමයි හෙනේ...

මොකුත්ම නැත්නම් ඇහැට ඇඟිල්ලෙන් ඇනගෙන හරි අඬන්නයි අපිට ඕන... පැත්තකට වෙලා මූඩ් ගහලා බුම්මගෙන ඉන්නයි අපිට ඕන... මේ ලෝකෙ හරිම නරකයි නපුරුයි කිය කියා චෝදනා කර කර ඉන්නයි අපිට ඕන.. මම හරි අහිංසකයි, හරි හොඳයි, හරි පරාර්ථකාමියි ඒ වුණාට මේ ලෝකෙ ඉන්න අනිත් හැමෝම දුෂ්ටයි, නපුරුයි, ආත්මාර්ථකාමීයි කියලා දෙස්දෙවොල් තිය තියා ඉන්නයි අපිට ඕන.

ඉතින් එහෙම ඉන්නකොට මොකද දන්නවද වෙන්නේ? ඒ වගේ චෝදනා කර කරම, නැත්නම් දෙස්දෙවොල් තිය තියම ඉන්න වෙන විදියේ සිදුවීම් අපේ ජීවිතේට ලැබෙනවා. නිකන් නෙවෙයි බෝනස් පිටින්.

ඒ නිසා මම ඔයාට පුංචි යෝජනාවක් කරන්නම්. අද ඉඳලා, මේ මොහොතේ ඉඳලා ඔය දුක හිතෙන සින්දු අහන එක නතර කරන්න. දුක හිතෙන වීඩියෝ, චිත්‍රපට බලන එක නතර කරන්න. ටීවී එකේ යන ටෙලිනාට්‍යක ඉන්න චරිතයක් නිසා ඔයාට යකා වැහෙනවනම්, ඒ නළුවාගේ හෝ නිළියගේ අම්මා අප්පා මතක් කරලා බනින්න හිතෙනවානම් එහෙම ටෙලිනාට්‍යය බලන එක නවත්තන්න.

ඔය කසිකබල් සින්දු, ටෙලිනාට්‍ය බල බලා ඇහැට ඇඟිල්ලෙන් ඇනගන්න වෙලේ සතුටු හිතෙන සින්දුවක් අහන්න. හොඳට නටන්න පුළුවන් සින්දුවක් අහන්න.

ඔයා ඉංග්‍රීසි භාෂාවෙන් ලියැවුණු සින්දු අහන කෙනෙක් නෙවෙයි නම් සිංහලෙන් කියන බයිලා සින්දුවක් හරි අහන්න. එහෙම අහද්දි ඔයාගේ මනසේ සිද්ධ වෙන විපර්යාසය දිහා ටිකක් රහසින් බලන් ඉන්න.

සමහරවෙලාවට ජීවිතේ වෙනස් කරගන්න අපිට ලොකු ලොකු මහප්‍රාණ අවශ්‍ය වෙන්නේ නෑ. හරි පුංචි දේවල් ටිකක් විතරයි හදාගන්න ඕන. කිසිම සතුටක් නෑ කියලා දැනෙනවා නම්, ජීවිතේ හරි මූසලයි වගේ දැනෙනවානම් තේරුම්ගන්න ඒක වෙන කවුරුවත් ඇවිල්ලා කරපු දෙයක් නෙවෙයි. ඒක රාහු හෝ සෙනසුරු විසින් ඇතිකරපු මූසල ගතියකුත් නෙවෙයි. ඔයාගේම සමහර ගති පුරුදු නිසා තමයි එහෙම වෙලා තියෙන්නේ.

ඒ නිසා දුකම බදාගන්නේ නැතිව තමන්ට සතුට දෙන දේවල් පස්සේ පන්නන්න. බල්ලෙක් පූසෙක් හදලා හරි තමන්ගේ සතුට හොයාගන්න පුළුවන් නම් එහෙම කරන්න. දුකට නෙවෙයි සතුටට ලොබ බඳින්න. එහෙම නොකර බෝධි පූජා තියලා හෝ දෙවියන්ට භාරහාර වෙලා සතුටින් ඉන්න දෙන්න කිව්වට ඒක මේ කපේදි වෙන්නේ නෑ.

ජීවිතේට සතුට උදාකරලා දෙන්න පුළුවන් දෙවියන් වැඩ ඉන්නේ ඔයා තුළමයි. ඒ නිසා ඔය දූවිලි වැදිලා මකුළු දැල් බැඳිලා තියන හිත පොඩ්ඩක් පිරිසිදු කරලා කට්ට කුමංජල් ටිකක් එහෙම අල්ලලා වැඩේ පටන්ගන්න.

කාටවත් හානියක් වෙන්නේ නැත්නම්, නීති විරෝධී නොවෙන ඕනැම දෙයක් ඔයාගෙ සතුට වෙනුවෙන් කරන්න. ඔයා දන්නවද? බුද්ධාගමේ කියන විදියටනම් දුක කියලා කියන්නේ අකුසලයක්. ඉතින් හිතා මතා දුකින් ඉන්න එක පව් පුරවගන්න වැඩක් කියලා තේරෙන්නෙ නැද්ද ළමයෝ? ඒ නිසා ඔය අහක යන වහන්තරාවල් ඔලුවෙ දාගෙන දුකින් ඉඳලා මැරිලා යන්න හදන්නෙ නැතුව තියන දෙයක් කාල බීලා සතුටින් ඉන්න.

යන්න හදන හෝ ගිය මිනිස්සු ගැන වැඩ වෙන්නේ නැතුව තාමත් ඔයා එක්ක ඉන්න මිනිස්සු ගැන සතුටු වෙන්න. කන්න තියා අඩුම තරමේ බොන්න වතුර ටික නැතුව අපි ජීවත්වෙන රටේම මිනිස්සු අපා දුක් විඳිනකොට අපිට මොනවයින්ද අඩු කියලා හිතලා සතුටු වෙන්න.

ඉතින් දැන්මම පොරොන්දු වෙනවද? මට නෙවෙයි. ඔයාගෙම හිතට ...

මීටපස්සේ දුක වෙනුවට සතුට දෙන දේවල් වලට විතරක් ඔයාගේ අවධානය දෙනවා කියලා...

අපූර්වා

හිත

කොනිත්තන කවි

ඈත බටහිර සිතිජ ඉවුරේ අඳුරු සළුපිළි අතුරලා
නික්ම ගිය හිරු සඳුට ඉඩදී මුහුදු පතුලේ සැඟවිලා
බලාගන්නට ඔබේ සුන්දර මුහුණු හසරැලි උතුරනා
නිදගන්නෙමි රැයේ සිහිනෙන් ඔබට එන්නට මග කියා

ගෙවෙන රෑ මැද නිදන නෙතු යට ආදරේ සිත්තම් ඇඳී
හිතට සතුටක් අරන් ආවත් මගෙ හිතට ඒ ටික මදී
උයන් වත්තක මුහුදු වෙරළක ඔබට ඩිංගක් තුරුලු වී
ආදරේ මල් නෙළාගන්නට ඉඩක් ලැබුණොත් ඒ ඇතී

රැයේ සඳ විත් සඳවියන් ඇද බිමට සඳරැස් අතුරලා
අපට මොහොතක් වැතිර ඉන්නට හැදු පලස් මල් ගවසලා
ඔබේ නළලේ නළල ගාවා සුසුම් සුසුමක තවරලා
අදත් මුළු රෑ ඉන්න ආසයි, අනේ එන්නකො ඉගිලිලා

ජීවිතේ දුක තනිය විඳ විඳ විරහ ගී රඳවා මුවේ
වසර ගණනක් කොහොම ඉන්නද පැයෙන් පැය හදවත දැවේ
හැඟුම් විරහිත ලැබෙන සුවසෙත පරම සුන්දර නිදි ලොවේ
ඔබත් උන්නොත් මගේ අසළින් සිහිනයත් සිහිනය නොවේ

තරන

දින 10ක් - වාසි රැසක්
SINGER
TOP 10 DAYS
ලොකු වට්ටම් සමඟ
අගෝ 21:31
20% වට්ටමක්
SINGER
මෝටරය සමඟ සිග්-සැග් මහන මැෂිම
MC984-1W-MTR
රු. 105,499 84,399
20% වට්ටමක්
SINGER
පෝර්ටබල් මහන මැෂිම
SM-MC1155
රු. 44,999 35,999
20% වට්ටමක්
SINGER
පෝර්ටබල් මහන මැෂිම
SM-MC9116
රු. 46,999 37,599
20% වට්ටමක්
SINGER
සිග්-සැග් මහන මැෂිම
MC984-1W
රු. 92,999 74,399
20% වට්ටමක්
SINGER
පෝර්ටබල් මහන මැෂිම
SM-MC3368
රු. 47,499 37,999
15% වට්ටමක්
SINGER
පෝර්ටබල් මහන මැෂිම
SM-SM024
රු. 41,999 35,699
10% වට්ටමක්
SINGER
පෝර්ටබල් මහන මැෂිම
SM-SC220
රු. 64,999 58,499
011 5 400 400
www.singer.lk
SINGER

ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමග - සැමදා අගයමු ස්ත්‍රී

ශ්‍රී ලාංකීය ඉතුරුම්කරණයේ ප්‍රමුඛයා සහ අප රටේ විශාලතම ඉතුරුම් විශේෂිත මූල්‍ය ආයතනයවන ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය අභිමානවත් ගමන් මගෙහි වසර 190ක් ඉක්මවා තිබේ. මහජනතාවගේ මුදල්මය ඉතුරුම් රටක ආයෝජන සඳහා සෘජුවම දායකවන අතර එලෙස දේශීය ප්‍රභවයන් මගින් මෙම අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හැකිවීම නිසා විදේශීය ණය ගැනීම් අඩු කර රටෙහි ආර්ථික සමෘද්ධිය තහවුරු කිරීමට එමගින් හැකිවනවා. මෙලෙස දශක පහක් පුරා ශ්‍රී ලාංකීය ජනතාවට ආවේණික වූ ඉතිරිකිරීමේ හා සකසුරුවමෙහි මූලික ගුණාංගයන් හඳුනාගනිමින් ඊට නව ලොව තාක්ෂණය මුසු කර වඩාත් ආරක්ෂාකාරී හා ගුණාත්මයෙන් යුතු විධිමත් බැංකු සේවාවක් ලබා දීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව එදත් අදත් හෙටත් කැපවෙනවා.

1832 වසරේදී එවකට ශ්‍රී ලංකාවේ ආණ්ඩුකාරවරයා වූ ශ්‍රීමත් රොබර්ට් විල්මොට් හෝර්ටන් මහතා විසින් අප රටේ ජනයාගේ ඉතිරිකිරීම හා සකසුරුවමට ඇති කැමැත්ත, විධිමත් බැංකු පද්ධතියක් සමග එක් කිරීමේ අභිප්‍රායෙන් සිලෝන් ඉතුරුම් බැංකුව (Ceylon Savings Bank) ආරම්භ කරනු ලැබුවා. එමෙන්ම, 1885දී ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් මහතාගේ අදහසකට අනුව සිලෝන් තැපැල් ඉතුරුම් බැංකුව (Ceylon Post Office Savings Bank) හා එහි සේවාවන් ආරම්භ කරනු ලැබුවා. ඉන්පසු 1938 වසරේදී තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රධානත්වයෙන් ඉතුරුම් සහතික අංශය (Savings Certificate Section) පිහිටවූවා. එමගින් ඉතුරුම් සහතික හරහා මුදල් ඉතිරි කිරීමට ජනතාව පොළඹවනු ලැබුවා. ඉනික්බිතිව 1942දී දෙවන ලෝක යුද්ධයත් සමග ඒ සඳහා අවශ්‍ය ණය ලබාදීම් කටයුතු වෙනුවෙන් සිලෝන් යුද පෙරමුණ (Ceylon War Movement) පිහිටුවූවා. මෙකී සිව් ආයතන හා පෙරමුණු එක්කාසු කර 1972 මාර්තු 16 වනදා එවකට මුදල් අමාත්‍ය ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මහතා 1971 අංක 30 දරන පාර්ලිමේන්තු පනතින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව ස්ථාපනය කළා. සකලවිධ ශ්‍රී ලාංකිකයන්ගේ සියලු මූල්‍ය අවශ්‍යතා සපුරාලනු වස් ජාතියට දායාද වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුව වසරින් වසර අභියෝග ජයගනිමින්, සිය ගනුදෙනුකාර භවතුන් වෙත ඉහළ සේවයක් ලබා දෙමින් සහ නාගරික මෙන්ම ගම් දනව් සිසාරා ඉතිරිකිරීමේ හා සකසුරුවමේ වැදගත්කම පහදා වටහා දෙමින් ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීමට දායක විය.

පන්සියයකට අධික රාජ්‍ය ව්‍යවසායයන් අතර විශිෂ්ට මට්ටමක් ඉතිහාසය පුරා පවත්වාගෙන යන හා බදු මුදල් මගින් රටේ දියුණුවට දායකවන ජාතික ඉතිරිකිරීමේ බැංකුව අනෙක් සියලුම රාජ්‍ය ආයතනයන්ට ධනාත්මක නිදසුනක්. ගෝලීයකරණය සමග තොරතුරු තාක්ෂණය හා සබැඳි මූල්‍ය ක්ෂේත්‍රය දිනෙන් දින දියුණුවනවා, එම නව ප්‍රවේශයන් සමග ලෝකයේ ඕනෑම ස්ථානයක සිටින ශ්‍රී ලාංකිකයකුට සිය මූල්‍ය ගනුදෙනු පහසුවෙන් ආරක්ෂාකාරීව කර ගැනීමටත් සපයන අද්විතීය සේවාව අද මෙන්ම හෙට දිනත් අප රටේ දියුණුවට හේතුවේ.

ප්‍රෞඪ ගමන්මගක් ඔස්සේ මාතෘ භූමියේ අනාගත මූල්‍ය ස්වාධීනත්වය තහවුරු කිරීමටත් ශ්‍රී ලාංකීය ජනීජනයාගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලමින් සිය ස්ථාවරත්වය තවත් වර්ධනය කර ගැනීමට අවශ්‍ය ශක්තිය ධෛර්ය ලබා දුන් අපගේ ආදරණීය ගනුදෙනුකරුවන්හට අපගේ ගෞරවය හිමිවින බව කිව යුතුමය.

කාන්තාව සතු විභවය හඳුනා ගැනීම

ශ්‍රී ලංකාව ඇතුළු ආසියාකරයේ බොහෝ රටවල කාන්තා පුරුෂ අසමානත්වය දැකිය හැකියි. වැඩ බිමේදී, කාර්යාලය තුළදී, පොදු ප්‍රවාහන මාධ්‍ය තුළදී, ක්‍රීඩා පිටියේදී මෙන්ම නිවස තුළදීද මේ විෂමතාවයන් එකක් හෝ අඩු වැඩියෙන් අත්විඳීමට කාන්තාවන්ට සිදුවන බව නොරහසක්. එමෙන්, කාන්තාවන් මේ සියලු බාධක සිත දරාගෙන නැගී සිටින බවත් නොරහසක්.

ගෝලීයකරණය වූ ලෝකයක ශ්‍රී ලංකාව ලෝක ආර්ථිකයේ සිදුවන වෙනස්වීම් අනුව බලපෑමට ලක්වනවා එලෙස අදවන විට අප රට ආර්ථිකමය වශයෙන් පසුබෑමකට ලක්වන යුගයක් පසු කරමිනුයි සිටින්නේ. රටක් වශයෙන් අපගේ දළ දේශීය නිෂ්පාදිතය සීඝ්‍රයෙන් වර්ධනය කර ගත යුතු පසුබිමක අප රට සතු යෝධ ශක්තියක් ලෙස අපගේ කාන්තා පරපුර හැඳින්විය හැකියි.

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත වාර්තා අනුව අප රටේ ශ්‍රම බලකායට දායක නොවන ජනතාව අතර 70%ක්ම සිටින්නේ කාන්තාවන්. මෙය ඉතාමත් බැරෑරුම් ප්‍රකාශයක්, මිලියන 22කට ආසන්න ජනතාවක් සිටින ශ්‍රී ලංකාවේ 50.7%ක්, අපගේ ශ්‍රම බලකායේ කාන්තා නියෝජනය 33.4%ක් පමණ ප්‍රමාණයක්. මෙම අසමබරතාවය කාලයක් තිස්සේ පැවත එන්නක් වන අතර මීට පිළිතුරු සැපයීම තුළ අපට අද පවතින ආර්ථික අර්බුදයට ධරණීය විසඳුමක් සපයා ගත හැකි එක් මාර්ගයක් බව අපගේ අදහසයි. මෙලෙස සෘජුවම ආර්ථිකයට දායක නොවන කාන්තා ශක්තිය කෙසේ හෝ අප ලබා ගත යුතු බව අප ආයතනයේද විශ්වාසයයි.

වර්තමානයේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කාන්තා ශ්‍රම දායකත්වය 55%ක් තරම් ඉහළ අගයක් එමෙන්ම අප බැංකුවට නායකත්වය සපයන ඉහළ තනතුරු වල කාන්තාවන් සිටින බව මහත් ගෞරවයෙන් පැවසිය යුතුයි. අප වඩාත්ම කාන්තා හිතකාමී සේවා ස්ථානයක් ලෙස අඛණ්ඩ සම්මානයට පාත්‍රවීම ද විශේෂත්වයකි.

නූතන සමාජීය අධ්‍යයනයන් තුළින් සොයා ගෙන ඇත්තේ, බහුතරයක් කාන්තාවන් මෙසේ ආර්ථික ක්‍රියාකාරකම්වලින් බැහැරව ඇත්තේ හුදෙක්ම ඇය වෙත පවුල, දූ දරුවන් හා සමාජය විසින් පනවනු ලැබ ඇති බැඳීම්, විශේෂයෙන් මාතෘත්වය සමග බැඳී ඇති වගකීම් නිසා සහ කාන්තාව කායික හා මානසික වශයෙන් පිරිමිනට වඩා දුර්වල බවට වන දුර්මත නිසා බවයි.

සමාජ සම්මතයන් මෙසේ කාන්තාව සතු සත්‍ය විභවය කුඩා කර දැක්වීමට වෙර දරෑවද මෙම බාධකයන් සුනුවිසුනු කළ කාන්තා චරිත ශ්‍රී ලංකාවේ දැකිය හැකියි. මෙලෙස අධ්‍යාපනය, අත්දැකීම්, සමාජ සේවය, ක්‍රීඩාව සහ තුළින් ලොව ජයගත් ශ්‍රී ලාංකීය කාන්තාවන් අපගේ සමාජයේ දැකිය හැකියි. එබැවින් ශ්‍රී ලංකාවේ වගකිවයුතු රාජ්‍ය ආයතනයක් ලෙස අපගේ මේ වෑයම කාන්තා ඔබගේ ශක්තිය හඳුනා ගැනීමට දිරි දීමයි.

කාන්තාවන් වෙත ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අතහිත

කාන්තාවන්ටම සුවිශේෂී වූ ඉතිරිකිරීමේ ගිණුමක් ශ්‍රී ලංකාවට පළමුවරට හඳුන්වාදුන්නේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවයි, 2002 වසරේදී 'ස්ත්‍රී' සන්නාමය යටතේ හඳුන්වාදුන් මෙම ගිණුම හරහා අප රටේ කාන්තාවන්හට මුදල් ඉතිරි කිරීමටත් බැංකු පද්ධතියත් සමග සෘජුව සම්බන්ධ වීම මගින් ණය මුදල් ලබා ගෙන ඔවුන්ගේ සිහින ජය ගැනීමටත් මග විවර කර දීමට සමත් වුණා.

එමෙන්ම ස්ත්‍රී ගිණුම මගින් කාන්තා ඔබගේ ජීවිතයේ විශේෂ අවස්ථාවන් හිදී වටිනා මුදල් ත්‍යාග ලබා දීමටත් කටයුතු කරනවා; විවාහයේදී, පළමු දරු උපතේදී, 25වන විවාහ සංවත්සරයේදී මෙන්ම ඔබ උපාධිධරයකු වන අවස්ථාවේදී මෙලෙස ඔබ සමග එක්වීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව කටයුතු කරනවා.

අනෝමා ගෝමස්
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)
ජාතික ඉතිරිකිරීමේ බැංකුව

මේ වන විට ස්ත්‍රී ගිණුම සමග ලක්ෂ සංඛ්‍යාත කාන්තාවන් ප්‍රමාණයක් සම්බන්ධවී සිටිනවා. ස්ත්‍රී ගිණුම තුළින් ඔබ ඉතිරි කිරීම හා සකසුරුවම පිළිබඳ ඉගෙනගත් දෑ අපත් සමග බෙදා හදා ගන්නා ලෙස අප බැංකුවක් වශයෙන් ඉල්ලා සිටිනවා. එමගින් අපගේ සේවාවේ ගුණාත්මය තවත් වර්ධනය කර ගැනීමට එය රුකුලක් වනු ඇති.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව ශ්‍රී ලාංකික කාන්තාවන් වෙත සැමවිටම ගෙන එන පණිවිඩය නම් 'කාන්තාවක් ලෙස ඔබට කළ නොහැක්කක් නොමැත' යන්නයි. ජීවිතයට බාධක පැමිණෙන්නේ ඔබ කෙතරම් ශක්තිමත්ද යන්න උරගා බැලීමටයි, එම වැට කඩුලු බිඳගෙන ලෝකය ජය ගත හැක්කේ ඔබටමයි.

ඇත්ත දැනගත්තම අවතාරෙ අතුරුදන් වෙලා



මාධ්‍යවේදී
තිලක් සේනාසිංහ

එය හලාවතට නොදුරු තරමක් පිටිසර ගම්මානයකි. එහි ජීවත් වන්නවුන්ගෙන් වැඩි පිරිසකට ස්ථිර රැකියා හෝ විධිමත් ආදායම් මාර්ග නොතිබිණ. එබැවින් යම් පිරිසක් ධීවර කර්මාන්තය හා බැඳුනු නොවිධිමත් රැකියාවන්හි යෙදුණු අතර තවත් පිරිසක් අනියම් කම්කරු වෘත්තීන්හි නිරත වූහ.

අප මෙහි 'බර්ටි' යනුවෙන් හඳුන්වන තැනැත්තා ඒ ගමේ ඉපදී හැදී වැඩුණු මැදිවිය පසුකරමින් සිටි අයෙකි. තරුණ වියේදී වසර දහයක් හෝ පහළොවක් මැදපෙරදිග ගතකළ ඔහු පසුව තම උපන් ගමට විත් පදිංචි විය. එහිදී ඔහු තම ආදායම් මාර්ගය ලෙස තෝරාගත්තේ හොර සුරා ජාවාරමය. මුලදී සාමාන්‍ය මට්ටමින් කරගෙන ගියද පසුව ඒ ප්‍රදේශයේ ජයටම කෙරීගෙන ගිය ජාවාරම් යාන්ත්‍රණයකට සම්බන්ධකොට වඩාත් පුළුල් ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යාමට බර්ටිට හැකි විය. එසේ තමන් පෙරන හොර සුරා දුම්රියෙන් කොළඹ දෙසට රහසේ ප්‍රවාහනය කරන ක්‍රමද බර්ටි මැනැවින් ප්‍රගුණකොට තිබිණ.

විදෙස් රැකියාවේ යෙදීමට පෙරම විවාහ වී සිටි බර්ටි ඒ වනවිට තරුණ පුතුන් දෙදෙනෙකුගේ පියෙක් ද විය. එහෙත් ඔහුගේ විවාහය නමට පමණක් සීමා වූ අතර කාන්තාවන් කිහිපදෙනෙකුම කැමැත්තෙන් හෝ අකමැත්තෙන් බර්ටිගේ අනියම් බිරියන් බවට පත්ව සිටියහ. තම පවුල් ජීවිත නඩත්තු කරගත හැකි මුදලක් බර්ටිගෙන් ලැබෙන බැවින් තම බිරියන් බර්ටි හා එවැනි ඇසුරක් පැවැත්වීම ගැන සැමියන්ට ද ගැටලුවක් තිබුණේ නැත.

විශේෂිත ගමන් බිමන් සඳහා පමණක් යොදගන්නා නවීන මෝටර් රථයක් බර්ටිගේ ගරාජයේ නතරකොට තිබුණද ඔහු තම එදිනෙද කටයුතු සඳහා යොදගන්නේ තරමක් පැරණි කළු පැහැති යතුරුපැදියකි. එය ඔහු මුල්වරට විදේශගතව පැමිණි අවදියේ මිලට ගන්නා ලද්දකි. එහෙත් එහි යම් වාසනා ගුණයක් ඇති බව විශ්වාස කළ නිසාදෝ එය අලෙවිකොට ඊට වඩා අලුත් යතුරුපැදියක් මිලට ගැනීමට ඔහු කිසිදිනෙක උනන්දු වුණේ නැත.

ගම්වැසියන්ට බර්ටිගේ යතුරුපැදිය සම්බන්ධ සුවිශේෂත්වයක්ද විය. එනම් ඉන් නැගෙන අමුතු 'ගුඩු ගුඩු' නාදයයි. දහවල සේම ඇතැම් දිනවල මධ්‍යම රාත්‍රියේද බර්ටිගේ යතුරපැදියෙන් නැගෙන ඒ ගුඩු ගුඩු නාදය අසන්නට ලැබුණද කිසිවෙක් ඒ පිළිබඳව විශේෂ විපරමක් නොකළහ. එසේ විපරම් කිරීමෙන් අනවශ්‍ය ප්‍රශ්න මතු වෙතැයි යන භීතියද ඊට හේතු වන්නට ඇත.

ඔය අතර දිනයෙක ඒ ගම්මානයේ සෑම කෙනෙකුම සංවේගයට කෙසේ වෙතත් කම්පනයකට ලක්වන පුවතක් අසන්නට ලැබිණ. එනම් ගමට ඔබ්බෙන් ඇති මහා මාර්ගයේදී බර්ටිගේ යතුරුපැදිය ලොරි රථයක ගැටීමෙන් ඔහු ඒ ස්ථානයේදීම මියගොස් ඇති බවයි. බර්ටිගේ චරිත ස්වභාවය කෙසේ වුවත් ඔහුගෙන් පිහිටාධාර ලැබූ අසරණ පවුල්වලට ඔහුගේ අකල් මරණය දරාගත නොහැකි පාඩුවක් වන්නට ඇත.

කෙසේ වෙතත් බර්ටිගේ මරණයෙන් මාස කිහිපයකට පසු මතුවූ එක්තරා අද්භූත තොරතුරක් ලැව්ගින්නක් මෙන්ම ගම පුරා පැතිර ගියේය. එනම් ඇතැම් රාත්‍රී කාලයන්හි බර්ටිගේ අවතාරය ගම පුරා සැරිසරන බවයි.

ඇතැම් රාත්‍රී කාලවලදී බර්ටිගේ අවතාරය ඔහු මිහිදන් කළ සුසාන භූමියෙන් මතුවන බවටද විවිධ මතිමතාන්තර ගම පුරා පැතිර යන්නට විය.

"පසුගිය දවසක රෑ දහයට විතරයි පාන්දර ජාමෙයි බර්ටිගේ බයික් එකේ සද්දේ ඒ විදියටම ඇහුණා. ඒක ඇහුණා විතරයි මගේ පපුව සීතල වෙලා ගියා." බර්ටි හා සමීප සම්බන්ධයක් පැවැත් වූ ඒ ගමේ කාන්තාවක කියා සිටියාය.

"බර්ටි අපි දන්න කාලේ ඉඳලම ඔය බයික් එකට පුදුම ආදරෙන්නේ හිටියේ." ඒ පිළිබඳ වැඩි තොරතුරු විමසීමට ගිය තරුණ පිරිසකට බර්ටිගේ බිරිඳ කීවාය. "ඉතින් ඒ හින්ද ලොකු පුතා කිව්වා ඒක අපි ආයෙත් රෙපයාර් කරමු කියලා. කොහොමහරි බර ගාණක් දීලා දැන් ඒක රෙපයාර් කරලා ගෙනැත් තියෙනවා. එයා තමයි පහුගිය දවස්වල රෑට ඕක එහාට මෙහාට පැද්දේ. දවල්ට එයාට ඒක පදින්න බැරි එයා වැඩට ගිහින් ගෙදර එන්නේ රෑ නවයට විතරනේ. ඒකයි." බර්ටිගේ බිරිඳ එසේ කීවාය.

ඉන්පසුව ඒ තරුණ පිරිස විසින් ඒ කතාව ගම පුරා පතුරුවා හරිනු ලදුව යතුරුපැදියෙන් ආ බර්ටිගේ අවතාරය ආගිය අතක් නැති විය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන්
කාන්තා ඔබ සඳහා
දහසක් හැඟීම් හඳුනාගත්
ස්ත්‍රී
ஸ்திரி
Sthree
• විවාහයේදී
• උපාධියක් ලබද්දී
• දරු උපතකදී
• 25 වන විවාහ සංවත්සරයේදී
රු.50,000/- දක්වා තෑගි
• මසකට රු.12,500/- බැගින් ඉතිරිකරන Sthree Savings Champion හට මුදල් තෑගි
"ස්ත්‍රී" ගිණුම් හිමි ඔබට අත්විඳිය හැකි ප්‍රතිලාභ
*කොන්දේසි සහිතයි
LRA AAA (Stable)
100%ක් පූර්ණ රාජ්‍ය වගකීම
වැඩි විස්තර සඳහා:
1972
ඇමතුම් මධ්‍යස්ථානය
www.nsb.lk 0112 379 379
ඔබේ මුදලට සුරක්ෂිතම ස්ථානය ජාතික ඉතිරිකිරීමේ බැංකුව.
NSB

ඉන්දිකා ප්‍රනාන්දු
මනෝඋපදේශිකා
සමාජ විද්‍යා ග්‍රන්ථ කතුවරී

අවමවාදයෙන් පැරදුනොත් සියලු වාදවලින් දිනුවත් වැඩක් නෑ

මේක සෙන් බුදුදහමේ කතාවක්. ඔන්න දවසක් එක මනුස්සයෙක් දුර ගම් පළාතක ජීවත්වෙන ප්‍රසිද්ධ ගුරුවරයෙක්ව මුණගැහෙන්න ඔහුගේ ගෙදර හොයාගෙන ගියාලු. ගුරුවරයාගේ ගේ දැකලා අර මනුස්සයාට පුදුමයි. මොකද ඒ ගෙදර තිබුණේ ගුරුතුමාගේ පොත් ටිකයි, ලියන මේසෙයි, පුටුවයි විතරයි.

"කෝ මේ ගෙදර බඩු මුකුත්ම නෑනේ?" පුදුම වෙච්ච මනුස්සයා ගුරුතුමාගෙන් ඇහුවලු.

"කෝ එතකොට ඔය මහත්තයාගේ බඩු?"

"මම මෙහෙ නවතින්න ආවේ නෑනේ ගුරුතුමනි."

"මමත් එහෙමයි. මමත් මෙහෙ නවතින්න ආවේ නැහැ" කියලා ගුරුතුමා උත්තර දුන්නා. පුංචි කතාවක් වුණාට මේක ගොඩාක් ගැඹුරු තේරුමක් තියෙන කතාවක්. ලංකාව කියන්නේ බෞද්ධ රටක්. තණ්හාව, අත්හැරීම ගැන නිතර බණ අහන්න මිනිස්සු ඉන්න රටක්. හැබැයි ගෙදරටකට ගිහින් බැලුවොත් මැරෙද්දි පෙට්ටියේ දාගෙන යන්න වගේ ඇඳන් යට ඉඳලා පරණ බඩුමුට්ටු පුරෝගෙන.

මෑතකදි මම දන්න අඳුරන ගෙදරකට ගියා. ගෙදර දරුවෝ සේරම විදේශගත වෙලා. ඉන්නේ වයසක අම්මයි තාත්තයි විතරයි. ඒක වෛවර්ණ බඩු පුරෝපු මහා විශාල ගෙයක්. ඉතින් බැරිමරගාතේ අසනීප පිට ගෙවල් දොරවල් අස් කරනවා ඇරෙන්න අර යුවලට වෙන වැඩක් නෑ. ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්න නිසා වැඩට කෙනෙක් ගන්නත් බැරිලු. මේ වගේ මාතෘකාවක් ගැන කතා කරන්න ඕනේ කියලා මට හිතුණේ ඒ යුවල දැක්කට පස්සෙයි.

යුරෝපීය රටවල අවමවාදය (Minimalism) කියලා සංකල්පයක් තියෙනවා. ලංකාවේ සමහර උදවියත් දැන් දැන් මේ ගැන ටිකක් උනන්දුයි. විසිවැනි සියවස මුලදි ඇතිවෙච්චි යුද්ධ නිසා ඒ රටවල මිනිස්සුන්ට බඩුමුට්ටු හිඟයක් ඇති වුණාලු. ඒකත් එක්ක ගොඩක් දෙනා තියෙන දේවලින් උපරිම ප්‍රයෝජන ගන්න පටන් අරන්. ඒකත් එක්ක 1960-70 වෙද්දි අවමවාදය කියන සංකල්පය සමාජගත වෙලා තියෙනවා. අවමවාදය කියන්නේ නිතරම වටිනාකමක්, ප්‍රයෝජනයක්, අරුතක් තියෙන දේවල් විතරක් තියාගන්න එක. මේක එක අංශයකට සීමා නෑ. ගෘහ නිර්මාණය, කලාව, විලාසිතා, සාහිත්‍ය, සංගීත වගේ හැම අංශෙකටම පොදුයි. ඒ අතරින් ජීවත්වෙද්දි ප්‍රායෝගිකව අනුගමනය කරන්න පුළුවන් පොදු දේවල් ටිකක් අද අපි කතා කරමු.

ප්‍රයෝජනවත් දේ විතරක් පාවිච්චි කරනවා, අනවශ්‍ය දේ අඩු කරනවා කිව්වහම සමහරුන්ට 'අපෝ ඒක මොන ලෝබකමක්ද?' කියලා හිතෙන්න පුළුවන්. ඒ වගේ දේවල් හිතෙන්නේ අපි වගේ දුප්පත් රටවල අමාරුවෙන් ජීවත්වෙන මිනිස්සුන්ට විතරයි. දැකලා තියෙනවද ෆේස්බුක් එකේ අයිතිකාරයා මාර්ක් සකර්බර්ග් හැමදම එකම වාගේ ඇඳුම් ඇඳගෙන සෙරෙප්පු කුට්ටම් දෙකක් දාගෙන ඉන්නවා? මොකද ඔහු අවමවාදියෙක්. මේ බිලියනපතියා විතරක් නෙමෙයි ස්ටීව් ජොබ්ස්, වොරන් බෆට්, ඇල්බට් අයින්ස්ටයින්, බැරැක් ඔබාමා, අබ්දුල් කලාම් වගේ ලෝක ප්‍රකට මිනිස්සු ඕනේතරම් අවමවාදියෝ විදියට හඳුන්වන්න පුළුවන්. අපේ මාටින් වික්‍රමසිංහ, එදිරිවීර සරත්චන්ද්‍ර වගේ මහත්වරු වුණත් කොච්චර සරලව ජීවත්වෙච්චි මිනිස්සුද? අවමවාදය කියන්නේ ලෝබකමකට නෙමේ. ඒක මනස නිදහස් කරන සරල කලාවක්.

මම දන්න තව කාන්තාවක් ඉන්නවා ඇයත් ජීවත්වෙන්නේ තනියම. හැබැයි කඩේ ගියාම සාගතේකට වගේ කෑම බඩු ගන්නවා. පස්සේ නරක් වෙලා ඒ දේවල් විසි කරනවා. ලී බඩු, හෑන්ඩ් බෑග්, ඇඳුම් පැළඳුම් එහෙමත් එහෙමයි. ගේ පුරා බඩු පුරෝගෙන. නිකමට හිතන්න අපි ගොඩක් සෙනඟ ඉන්න බස් එකකට නැග්ගහම අපිට නිදහසේ හුස්මක් කටක්වත් ගන්න පුළුවන්ද? ඒකෙන් බැහැගන්නකල් අපිට කොච්චර අපහසුවක් දැනෙනවද? අපේ ජීවිතේ වුණත් එහෙමයි. සරල වෙන තරමට ජීවිතේ සැනීපයි. හැබැයි සරලකම, දේවල් අවම කරනවා වගේ දේවල් ආධ්‍යාත්මයත් එක්කම එන්න ඕන දේවල්. 'සිතින් දිළින්දෝ භාග්‍යවන්තයෝය' කියලා ජේසුතුමා කියලා තියෙනවා. සිතින් දිළින්දෝ කියන්නේ හිතේ ලොකු තණ්හාවක්, ආශාවක් නැති උදවියට. ඒ අයගේ ජීවිත සරලයි. තණ්හාව, ආශාව වැඩි අයට අවමවාදය වගේ සංකල්පවලට යන්න ටිකක් අමාරුයි. ඒ නිසා මුලින් ඔය වගේ කාරණා ටිකක් ගැඹුරින් හිතලා බලන්න. ඔය කියපු කාරණා එක්ක අවමවාදය ප්‍රායෝගිකව ජීවිතේට ඈඳගන්නේ කොහොමද කියලා දැන් බලමු.

අපිට පළවැනියටම මේක ආදේශ කරන්න පුළුවන් ගෙයක් හදිද්දි. ලංකාවේ ගොඩක් දෙමාපියෝ ඉන්නවා තරුණ කාලේ ණයවෙලා මහා ලොකු ගෙවල් හදනවා. පස්සේ කන්නේ බොන්නේ නැතිව දරුවන්ට උගන්වන ගමන් අර ණය ගෙවනවා. පස්සේ දරුවෝ වෙනම ජීවිත හොයාගෙන ගියාම අපි මෙහෙමයි කළේ කියලා කුල කියවනවා. ගෙවල්වල නිර්මාණ මෝස්තර වුණත් කාලෙන් කාලෙට වෙනස් වෙනවා. ඉස්සර තිබුණු ගෙවල් ගොඩක් දැන් කඩලා හදලනේ. ඉතින් එහෙම බැලුවහම අර දෙමව්පියන්ට මහන්සියත් නෑ, සතුටින් කාපු බීපු දේකුත් නෑ. ආසාවෙන් හැදුව ගෙදර හැඩෙත් නෑ. ඒ නිසා ගෙයක් හදද්දි මුලින්ම බලන්න පවුලේ කී දෙනෙක් ඉන්නවද, නඩත්තු කරන්න පුළුවන්ද, අස්පස් කරන්න පහසුද. අස්පස් කරන්න අපහසු ලොකු ගෙදරකට විශාල කාලයක් දෙන්න වෙනවා. 'ගෙදර වැඩ ඇර මට කාලයක් නෑ' කියලා ආඩපාලි කියන බිරින්දෑවරු කොච්චරද. එතැනදී කාලය, නිදහස, සතුට වගේ දේවලුත් ඇහිරෙන්න පුළුවන්.

ඊළඟ කාරණාව ගෙදරට බඩු මුට්ටු ගන්නකොටත් අවමවාදය කියන සංකල්පය අනුගමනය කරන්න. සමහර ගෙවල් තියෙනවා මේස දහයක් විතර තියෙනවා. පුටු සෙට් තියන්න ඉඩ නැහැ. ඇවිදින්න ඉඩක් නෑ, ලී බඩු පුරෝලා. අල්ලපු ගෙදර බඩු ගනිද්දි ඒ දිහා බලාගෙන ගෙදරට බඩු ගන්න අයත් ඉන්නවනේ. දැන් තියෙන තරඟකාරීබව එක්ක නිෂ්පාදන ආයතන වුණත් එක එක අලෙවි උපක්‍රමවලින් අනවශ්‍ය දේවල් ගන්න මිනිස්සුන්ව පොළඹවනවා. අවශ්‍ය දේ මොනවද අනවශ්‍ය දේ මොනවද කියලා හරියට තීරණය කරන්න අපි සබුද්ධික වෙන්න ඕනේ.

තව කාරණාවක් තමයි දෙයක් ගන්නකොට ඒකෙ ප්‍රමිතිය ගැන හිතන්න. ඒක අවමවාදය අනුගමනය කරන ධනවතුන්ගේ උපක්‍රමයක්. උදාහරණයක් විදියට ඔයා රුපියල් 1000ක් දීලා ඇඳුම් 10ක් ගන්නවා නම් ඒ වෙනුවට 1000ක් දීලා එක ඇඳුමක් ගන්න. එතකොට ඒක කාලයක් පාවිච්චි කරන්න පුළුවන් වගේම ඇඳුම් අල්මාරියේ ඉඩ ඉතිරි කරගන්නත් පුළුවන්.

ඒ වගේම තමයි එක දෙයක් අලුතින් ගන්නකොට ඒ වෙනුවට දෙයක් අයින් කරන්න. හිතන්නකෝ ගෙදරට අලුතින් පුටු සෙට් එකක් ගන්නවා. ඒ වෙනකොටත් ගෙදර සෙට් එකක් තියෙනවා නම් පරණ එක කාටහරි දෙන්න. නැත්නම් විකුණන්න. සපත්තු, හෑන්ඩ්බෑග් ඔය ඕනම එකක් එහෙමයි.

අනික බඩු ගන්න යනකොට ලිස්ට් එකක් හදාගෙන යන්න. දැක්කහම ආස හිතුණ පලියට ඒකේ නැති කිසිම දෙයක් නොගෙන ඉන්න තරමට හිත පාලනය කරගන්න. ගෙදර ඉන්නේ තුන්දෙනාද ඒ අවශ්‍ය ප්‍රමාණයට කෑමබීම වුණත් ගන්න.

දෙයක් ගන්නකොට නිතරම හරිම තීරණය ගන්න ඕනේ. ඒ කියන්නේ හිතන්නකෝ ඔයා කෙනෙක්ගේ උපන්දිනේකට තෑග්ගක් දෙනවා. උපන්දිනේට මේසේ උඩ තියන ටෙඩි බෙයාර් කෙනෙක් කියලා හිතමු. ඒක ඒ කෙනාට අත්‍යවශ්‍යම දෙයක් නෙමේනේ. ඒ වෙනුවට එයාට අත්‍යවශ්‍යම දෙයක් දෙන්න බලන්න.

ඒ වගේම තිරසාරබව රැකගන්න එකත් අවමවාදයේ ලක්ෂණයක්. ඒ කියන්නේ නිතරම ප්‍රතිචක්‍රීකරණය කරන්න පුළුවන් පරිසර හිතකාමී දේවල් පාවිච්චි කරන්න බලන්න. නැවත නැවත පාවිච්චි කරන්න පුළුවන් දේවල් එකපාරක් පාවිච්චි කරලා විසි කරන්න එපා. ඒක ලෝබකම නෙමේ අරපිරිමැස්ම. ඒ වගේම තමයි දන්න අඳුරන කෙනෙක් නිකන් දෙයක් දුන්නත් ඒක අනවශ්‍ය දෙයක් නම් ඒක ගෙදරට ගෙනැල්ලා ඉඩ අහුරගන්න එපා. ඒ වෙනුවට ඒක සුහදශීලීව ප්‍රතික්ෂේප කරන්න.

ස්වයං විනය නැති අයට මේක පුරුදු කරන්න බෑ

අවමවාදයේදී ප්‍රමාණයට වඩා ප්‍රමිතිය වැදගත්. ඒක බඩුමුට්ටුවලට විතරක් නෙමේ අපි ආශ්‍රය කරන මිනිස්සුන්ටත් අදාළයි. කේලම් කියන, ඕපදූප හොයන විෂ සහිත මිනිස්සු අයින් කරලා ඒ වෙනුවට හොඳ ගුණධර්ම තියෙන මිනිස්සු කිහිපදෙනෙක් ජීවිතේට ළංකරගන්න. ඒ වගේම තමන්ගේ ඔලුවේ වුණත් තියාගන්න ඕනේ හොඳ ධනාත්මක සිතුවිලි විතරයි.

ජීවිතේට අත්‍යවශ්‍යම දේවල් ටික එක්ක සරලව, පිරිසිදුවට, පිළිවෙලට ඉන්නකොට ඒ මොහොත ජීවත්වෙන්න ලේසියි. ඒ වගේම අනවශ්‍ය මානසික පීඩන කළමනාකරණය පහසුයි. කාලය වගේම මුදල් ඉතිරි වෙන එක තවත් ප්‍රතිලාභයක්. ඒ කාලය මුදල් අත්‍යවශ්‍ය දේට යොමු කරලා සතුටින් ජීවත්වෙන්න අවමවාදය උදව්වක්.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

මනා සැලසුමක් ඇති කාන්තාවන්ට ජීවිතය ජයගන්න තිබෙන හොඳම තැන යූනියන් ඇෂුවරන්ස් සමාගමයි

කාන්තාව සතු අයෝමය ශක්තිය අපට ගෙනහැර පෑ කාන්තාවන් අතර, යූනියන් ඇෂුවරන්ස් ආයතනයේ කාන්තාවන්ට හිමිවනුයේ ප්‍රමුඛ ස්ථානයකි. රක්ෂණ වෘත්තිය තුළින් ජාතික මෙන්ම ජාත්‍යන්තර තලයේ ජයග්‍රහණ රැසක් වාර්තාකරමින් යූනියන් ඇෂුවරන්ස් නාමය ඉහළටම එසවීමට සමත් වූ ඔවුන් අතරින් අද අප හමුවන්නේ තවත් එක් සුවිශේෂී සමාජිකාවකි. ඇය තිස්සමහාරාම යූනියන් ඇෂුවරන්ස් ශාඛාවේ පුද්ගල මූල්‍ය උපදේශිකා ටී. එම්. එස්. සරෝජනී මහත්මිය යි.

ඔබේ ජීවිතය දිහා ආපසු බැලීමේදී ඔබට දැනෙන්නේ මොනවගේ හැඟීමක් ද?

ජයග්‍රාහී හැඟීමක් තමයි තියෙන්නේ. කාන්තාවක් විදිහට අභියෝග රැසකට මුහුණ දෙමින් දිගු ගමනක් ඒමට මට හැකියාව ලැබුණා. මේ ගමනෙදි මට විශාල ශක්තියක් ලබාදුන්නේ යූනියන් ඇෂුවරන්ස් සමාගම කියන එක මේ මොහොතේ අවංකවම ප්‍රකාශ කළ යුතුයි.

ඔබ රක්ෂණ වෘත්තිය ක්ෂේත්‍රයට යොමුවෙන්නේ කෙසේද?

පාසල් අධ්‍යාපනයෙන් පසුව මම මගේ කුසලතාවයන් වර්ධනය කර ගැනීමට විවිධ පාඨමාලා හැදෑරීමට යොමු වුණා. ඒ අතරතුර තමයි මට මුලින්ම රක්ෂණ ක්ෂේත්‍රයට අවතීර්ණ වෙන්න අවස්ථාව ලැබුණේ. එවකට හිටපු යූනියන් ඇෂුවරන්ස් කණ්ඩායම් නායකයෙක් වූ වික්‍රම තිලක් වීරවර්ණකුල මහතාගේ මාර්ගයෙන් තමයි මට ඒ අවස්ථාව හිමිවුණේ. මම මේ ක්ෂේත්‍රය ගැන කිසිම දැනුමක් නොමැතිව තමයි මුලින්ම යූනියන් ඇෂුවරන්ස් සමාගමත් එක්ක සම්බන්ධ වෙන්නේ. එතනදී මාව සම්බන්ධ කළ කණ්ඩායම් නායකතුමා මේ සම්බන්ධයෙන් මට මූලික පැහැදිලි කිරීමක් කළා. ඉන් පසුව යූනියන් ඇෂුවරන්ස් සමාගමෙන් මට ලැබුණු මූලික පුහුණුවෙන් මේ සම්බන්ධයෙන් විශාල අවබෝධයක් ලබා ගැනීමේ අවස්ථාව හිමිවුණා. නමුත් මට මේ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් ලබාගන්න වසර දෙක තුනක් වගේ කාලයක් ගත වුණා. මගේ පළවෙනි රැකියාව නිසා ආරම්භයේ දී දුෂ්කරතා රැසකට මුහුණදීමට මට සිදු වුණත් ආයතනයෙන් මට ලැබුණු සාර්ථක පුහුණුව වගේම ආයතනයේ සාමාජික සාමාජිකාවන්ගේ මඟපෙන්වීම් සහ උපදෙස් වලින් සාර්ථකව මට මේ වෘත්තියට ප්‍රවේශ වීමේ හැකියාව ලැබුණා.

ඔබේ වත්මන් සාර්ථකත්වයට යූනියන් ඇෂුවරන්ස් සමාගමෙන් ලැබුණේ මොනවගේ දායකත්වයක් ද?

පාසල් අධ්‍යාපනයෙන් පසුව ගුරු වෘත්තියට යොමු වීමේ අපේක්ෂාවෙන් හිටපු මම අද වනවිට අවුරුදු 20ක කාලයක් යූනියන් ඇෂුවරන්ස් සමාගමේ සේවය කිරීමට ප්‍රධානම හේතුව තමයි ආයතනයක් විදිහට අපේ ඉදිරි ගමනට මේ ආයතනය දක්වන සහයෝගය. ඒ වගේම ආයතනයක් විදිහට අපේ දැනුම වර්ධනය කිරීම වෙනුවෙන් නිරන්තරව දක්වන දායකත්වය, අපිට වඩාත් සාර්ථක සේවාවක් අපේ ගනුදෙනුකරුවන් වෙත ලබාදීමට අවස්ථාව උදාකර දෙනවා. විශේෂයෙන් ආයතනය මඟින් ලබාදෙන රක්ෂණ සැලසුම් සම්බන්ධයෙන් වගේම රක්ෂණ ක්ෂේත්‍රය තුළ යාවත්කාලීන වන දැනුමින් අපව පෝෂණය කිරීම වෙනුවෙන් ආයතනය මඟින් දේශීය වගේම විදේශීය සම්පත් දායකයින්ගේ සහභාගීත්වයෙන් වැඩසටහන් පවා සංවිධානය කරනවා. මෙයින් අලෙවි උපදේශකවරුන් විදිහට වඩාත් සාර්ථක වගේම ඵලදායී සේවාවක් ලබාදීමට හැකියාව ලැබෙනවා. ඒ වගේම රක්ෂණ අලෙවි උපදේශකවරියක් විදිහට සම්බන්ධ වූ මට අද වෙනකොට ජ්‍යෙෂ්ඨ නිලධාරිණියක් දක්වා ඉහළට යාමට වගේම එයින් සුවිශාල අත්දැකීම් ප්‍රමාණයක් ලබාගැනීමට ත් මට හැකියාව ලැබිලා තිබෙනවා.

වෘත්තිය අධ්‍යාපනය වර්ධනය කිරීමට ආයතනයෙන් ලැබෙන්නේ මොනවගේ සහයෝගයක් ද?

යූනියන් ඇෂුවරන්ස් ආයතනය කියන්නේ ගුණාත්මක සේවාවක් තමන්ගේ පරිභෝගිකයන් වෙත ලබාදීම තුළින් ඉහළ විශ්වාසයක් හිමිකරගත් ආයතනයක්. මේ නිසාම අපේ ආයතනය රක්ෂණ අලෙවි නියෝජිතවරුන් වන අපේ දැනුම සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරනවා. විශේෂයෙන් රක්ෂණ ක්ෂේත්‍රය තුළ ඇතිවන නව ප්‍රවණතා සම්බන්ධයෙන් වගේම යාවත්කාලීන වන දැනුමෙන් අපව පොහොසත් කරවන්න විශේෂ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරනවා. ඒ වගේම ආයතනයක් විදිහට අපේ ගනුදෙනුකරුවන් හට නව නිෂ්පාදන හඳුන්වා දීමට ඉදිරිපත් වෙනවා. මේ කාර්යයේ දී දිවයිනේම සිටින අපේ අලෙවි නියෝජිතවරුන්ට එම නිෂ්පාදන සම්බන්ධයෙන් දැනුම ලබාදීමට ක්ෂණිකව ක්‍රියාත්මක වෙනවා. මීට අමතරව රක්ෂණ ක්ෂේත්‍රය සහ අපේ වෘත්තියට අදාළ විවිධ දේශීය සහ විදේශීය සම්පත් දායකයන්ගේ පුහුණුවීම් වගේම විදේශීය රටවල පුහුණුවීම් වලට පවා අපට සහභාගී වීමේ අවස්ථාව ආයතනය තුළ තිබෙනවා. මේ සියල්ලටම අමතරව පුද්ගලිකව අපගේ වර්ධනය වෙනුවෙන් සිදුකරන අධ්‍යයන කාර්යයන් වලට ද ආයතනයෙන් විශේෂ අනුග්‍රහයක් හිමිවෙනවා. මේ තුළින් ආයතනය මූලික වශයෙන් අපේක්ෂා කරන්නේ ගුණාත්මක සේවාවක් සැපයීමට අවශ්‍ය ශක්තියක් ඇති පිරිසක් නිර්මාණය කිරීමයි.

අනෙක් වෘත්තින් වලට සාපේක්ෂව රක්ෂණ වෘත්තිය තුළ ඇති විශේෂම ලක්ෂණය කුමක්ද?

අපි හැමෝම කිසියම් වෘත්තියක් කරන්නේ අපේ ජීවිත අපේක්ෂාවන් නැත්නම් අරමුණු ජයගැනීමටයි. මගේ අත්දැකීමට අනුව අපිට අපේ ජීවිතේ අරමුණු වලට කෙටිම කාලෙකින් ළඟාවීමට නම් ඒ සඳහා සුදුසුම වෘත්තිය රක්ෂණ වෘත්තිය යි. ඒ වගේම කිසිම සීමාවකින් තොරව ආදායම් ඉපැයීමේ හැකියාව තිබෙන නිසා, අපිට අපේ ඉලක්ක වලට අපේ සැලසමකට, සැලසුම්ගත කාලයක් තුළ ගමන් කිරීමේ හැකියාව තිබෙනවා. මේ නිසා ජීවිතය අරඹන තරුණ තරුණියන්ට මම විශේෂයෙන් ආරාධනා කරනවා යූනියන් ඇෂුවරන්ස් සමාගම සමඟ එක්ව තමන්ගේ හීන හඹායන්න එක්වන්න කියල.

> “මේ ගමනේ දී මට විශාල ශක්තියක් ලබාදුන්නේ යූනියන් ඇෂුවරන්ස් සමාගම කියන එක මේ මොහොතේ අවංකවම ප්‍රකාශ කළ යුතුයි.”

රක්ෂණ වෘත්තිය තුළින් ඔබ ලැබූ ජයග්‍රහණ මොනවද?

රක්ෂණ වෘත්තිය ක්ෂේත්‍රයේ අයෙකුට ලබන්න පුළුවන් ඉහළම ජාත්‍යන්තර සම්මානය වෙන MDRT සම්මානය පසුගිය වසරේ දී හිමිකර ගැනීමට මට හැකියාව ලැබුණා. මේ ජයග්‍රහණය මට මගේ ජීවිතේ සුවිශේෂී සංධිස්ථානයක් වෙනවා වගේම මගේ ඉදිරි වෘත්තිය ජීවිතයට විශාල අයෝජනයක් විදිහට ත් මම දකිනවා. ඒ වගේම මම යූනියන් ඇෂුවරන්ස් ආයතනයේ Premier Club සාමාජිකාවක් ද වෙනවා. මීට අමතරව යූනියන් ඇෂුවරන්ස් ආයතනයේ වාර්ෂික සම්මාන උළෙලවල් වලදී විශිෂ්ටතම රන් සම්මාන ඇතුළු විශේෂ සම්මාන සහ ජයග්‍රහණ රැසක් හිමිකර ගැනීමට මට හැකියාව ලැබුණා. මීට අමතරව ජාත්‍යන්තර, ජාතික, පළාත්, දිස්ත්‍රික් සහ ශාඛා මට්ටමෙන් ජයග්‍රහණ රැසක් හිමිකර ගැනීමට අවස්ථාව හිමිවුණා. අද වෙනකොට මට තිස්සමහාරාම අපේ ශාඛාව තුළ මගේ නම සන්නාමයක් බවට පත්වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් මට අද තිබෙන්නේ නිහතමානී සතුටක්. මේ ගමනේ දී මට විශාල ශක්තියක් වූ මගේ සියළුම කළමනාකාර මහත්වරුන්, ශාඛා සාමාජික සාමාජිකාවන් ඇතුළු යූනියන් ඇෂුවරන්ස් ආයතනයේ සියළුම කාර්ය මණ්ඩලයට ත් සහ මගේ සියළුම ගනුදෙනුකාරභවතුන්ට ත් ගෞරවණීය ස්තූතිය පුදකර සිටිනවා.

ඔබට අනුව රක්ෂණ වෘත්තිකයෙක් කියන්නේ කවුද?

සමාජයේ බොහෝ අය නොදන්නවා වුණාට, අපි හැමෝටම අවශ්‍යම සේවාවක් විදිහට මට මේ වෘත්තිය ක්ෂේත්‍රය හඳුන්වාදෙන්න පුළුවන්. උදාහරණයක් විදිහට වෛද්‍යවරයෙක් ගන්න. ඔහුට රෝගියෙකුගේ ජීවිතය සුවපත් කරන්න පුළුවන්. නමුත් ඔහුට ත් සුවපත් කරගත නොහැකි ජීවිත තිබෙනවා. ඒ වගේ අපේ ජීවිත වලින් වියෝවන අයගෙන් අපට සිදුවන ආර්ථික බලපෑම අවම කර ගැනීම වෙනුවෙන් උපදෙස් සහ සැලසුම් සැකසීම තමයි අපි විසින් සිදුකරන්නේ. මෙයින් ජීවත්වන අයට ඇතිවන පීඩනය අවම කිරීම සහ ඔවුන්ගේ ඉදිරි ජීවිතය ශක්තිමත්ව ගොඩනඟා ගැනීමට ශක්තියක් සැපයීම තමයි අරමුණ වෙන්නේ. මේ නිසා මට අනුව ලෝකයේ වෛද්‍ය වෘත්තියට පමණක් දෙවෙනි වෙන වෘත්තිය රක්ෂණ වෘත්තිය යි.

ඔබේ ජීවිතේ අරමුණු වලට යාමට මේ වෘත්තිය ශක්තියක් වුනේ කෙසේද?

මම කලින් සැලසුම් කරපු විදිහට රජයේ වෘත්තියකට යොමු වුණා නම් අද මම ගෙවන ජීවිතය මට සිහිනයක්ම විතරක් වෙනවා. අද වෙනකොට මම ඉලක්කම් හයක වැටුපක් හිමිකර ගනිමින් අභිමානයෙන් රැකියාවක් කිරීමේ අවස්ථාව නිර්මාණය වෙලා තිබෙනවා. ඒ වගේම දියණියක්, මවක් සහ බිරිඳක් විදිහට මට මගෙන් මගේ පවුලට සහ සමාජයට ඉටුවිය යුතු යුතුකම් නියමිත වෙලාවට ඉටු කිරීමේ අවස්ථාව ත් නිර්මාණය වුණේ මේ වෘත්තිය තුළිනුයි. ඒ වගේම මේ වෘත්තිය තුළින් මට සමාජයත් එක්ක මුහුවෙලා කටයුතු කිරීමට වගේම විදේශීය රටවල සංචාරය කිරීමේ අවස්ථාව ත් හිමිවුණා. මෙයින් මට සාම්ප්‍රදායික රාමුවෙන් මිදුණු කාන්තාවක් ලෙස ගොඩනැගීමේ අවස්ථාව හිමිවුණා. මේක ඇත්තටම මගේ වගේම මගේ පවුලේ දියුණුවට විශාල බලපෑමක් වුණා.

මවක් විදිහට ඔබේ වෘත්තිය කාර්යයන් සහ පවුලේ කාර්යයන් කළමනාකරණය කරගන්නේ කොහොමද?

අපට කිසියම් දෙයක් කරන්න නම් අවශ්‍යතාවය සහ ඒ වෙනුවෙන් අපේ කැපවීම තිබෙනවානම් අපිට ඒ දේ අනිවාර්යෙන්ම කරන්න පුළුවන් කියන විශ්වාසයෙන් තමයි මම ඉන්නෙ. මම මවක් වුණ අලුත මටත් මේ සියළුම කාර්යයන් කළමනාකරණය කරගන්න අපහසු වුණා. නමුත් මම ඒක ජයගන්න මගේ වෘත්තිය සහ පවුලේ දෛනික කාර්යයන් කලින් දවසේම සැලසුම් කරගත්තා. මගේ දිනයේ කාර්යයන් සාර්ථක ආකාරයෙන් සිදුකිරීම මගේ අරමුණ වුණා. ඒ වෙනුවෙන් මම මගේ දවසේ වේලාව කළමනාකරණය කරගත්තා. මේක මට මගේ වෘත්තිය ජයග්‍රහණය වර්ධනය කිරීමට වගේම මගේ සේවා කාර්යක්ෂමතාවය වර්ධනය වීමට ත් හේතුවක් වුණා. කාන්තාවන් විදිහට අපි අභියෝග වලින් පැනයාම නොවේ, එයට සාර්ථකව මුහුණදීමයි සිදුකළ යුත්තේ.

ඒ සඳහා වන ශක්තිය අපි හැමෝටම තිබෙනවා. අවශ්‍ය වන්නේ කැපවීම පමණයි.

අනාගත අපේක්ෂාවන් මොනවද?

ජාත්‍යන්තර තලයේ ජයග්‍රහණයක් හිමිකරගත් රක්ෂණ අලෙවි උපදේශකවරියක් විදිහට මම ලබපු අත්දැකීම් තරුණ පරපුරට ලබාදෙමින් ඒ අයගේ වෘත්තිය සහ පුද්ගලික ජීවිත සාර්ථක කර ගැනීමට උපකාර කිරීම තමයි මගේ මූලිකම අරමුණ වන්නෙ.

ලාංකීය කාන්තාවන්ට ඔබට පැවසීමට තිබෙන්නේ කුමක්ද?

කාන්තාවක් කියන්නේ විශාල ශක්තියක් තිබෙන කෙනෙක්. මේ නිසා ඔබ ඔබේ හැකියාවෙන් නියම ප්‍රයෝජනය ගැනීම ඔබ සතු වගකීමක්. බොහෝ කාන්තාවන් අද වෙනකොට යැපෙන්නියන් බවට පත්වෙලා තිබෙනවා. නමුත් ඔබ ඔබේ හැකියාවන් ගැන විමසුවොත් ඔබටම වැටහෙයි ඔබ කොතරම් ශක්තිමත් ද කියල. මේ නිසා පළමුවෙන්ම ඔබ ඔබව හඳුනාගෙන ඔබේ සැබෑ දක්ෂතා වලට වටිනාකමක් ලබාගැනීමට ඉදිරියට එන්න. එවිට ඔබට ඔබේම මාර්ගයක් විවෘත වෙනු ඇත.

■ සටහන : පාලිත අබේලාල්

පුද්ගලික මූල්‍ය උපදේශිකා - ටී. එම්. එස්. සරෝජනී
MDRT - 2022
යූනියන් ඇෂුවරන්ස් - තිස්සමහාරාම ශාඛාව

Fake පැණි ගාලා මී මැස්සන්ට බැන්නම හරිද?

මේක අත්ථදස්සී බුදුහාමුදුරුවෝ බුදුවෙලා හිටි කාලේ කතාවක්. දවසක්ද අත්ථදස්සී බුදුහාමුදුරුවෝ මහා සඟ පිරිසක් එක්ක පිඩුසිඟා වඩිනවා දැකපු තරුණයෙක් උන්වහන්සේට මී පැණි ගොට්ටක් සකස් කරලා පූජා කළා. මේ පැණි පූජාවේ අනිශංසෙන් මේ තරුණයා වාර දහතරක් දෙව් සක්‍ර භවනේත්, වාර අටසීයක් රාජ්‍ය රජකමත්, වාර පන්සීයක් සක්විති රජකමත් ලැබුවලු. අපේ ගෞතම බුදුන්ටත් එකපාරක් කැලේ ඉන්න වඳුරෙක් පැණි ගොට්ටක් පූජා කරලා, ඒ පිනෙන් මනුස්ස ආත්මයක් ලබාගත්තය කියනවනේ. ඒ විතරක් නෙමේ ධර්මාශෝක රජතුමාට අධිරාජ්‍යයෙක් වෙන්න ලැබුණෙත් පෙර ආත්මෙක බුදුවරයෙක්ට මී පැණි පූජා කරාපු පිනෙන්ලු. මී පැණි පූජාව මහත්පල මහානිශංස වැඩක් කියලයි ඔය කතාවලින් කියැවෙන්නේ. මී පැණි පූජා කරලා විතරක් නෙමෙයි හමේ ගාලත් මහා පලප්‍රයෝජන ගොඩාක් ගන්න පුළුවන් විදියක් ගැනයි අද අපි කියන්න යන්නේ. ඕන් අහගන්නකෝ කනට මී පැණි වක්කරනවා වගේ ඒ කතාවත්.

රස දෙයක් නැත්තම් හොඳ දෙයක් ගැන කතා කරන්න අපි ඔය 'මී පැණි වාගේ' වචනේ යොදනවනේ. මී පැණි ගැන කියැවෙන සිංදුම කීයක් අපේ රටේ තියෙනවාද? අද අපි රස කරන මී මුලින්ම කඩන්න අරන් තියෙන්නේ ජෝර්ජියානුවෝ. ඒ මීට අවුරුදු 8000කට උඩදි. ආහාර කල්තියාගන්න, රසගන්වන්න විතරක් නෙමේ මමීකරණෙටත් පුරාතණයෝ මී පැණි පාවිච්චි කළාලු.

මී පැණි ගෑවහම සමේ තියෙන ලප මැකෙනවා කියලා හොයාගෙන තියෙන්නේ ඊජිප්තු ජාතිකයෝ. ඕක හොයාගත්තයින් පස්සේ ක්ලියෝපැට්‍රා රැජින හැමදම කිරිවලට මී පැණි දලා නාන්න පටන් අරන්. ක්ලියෝපැට්‍රා විතරක් නෙමේ ඊජිප්තුවේ නෙෆටිටි රැජිනත් මී පැණි රසිකාවියක් කියන්න සාක්ෂි තියෙනවා. සබීනා ස්ටැටිලියා ඒ කියන්නේ රෝමේ ගිනි ගන්නකොට වීණා ගහපු නීරෝ රජතුමාගේ මායියා දවසට හත් අටපාරක් මී පැණි හමේ ගාපු බවලතියක්ලු. ඒ විතරක් නෙමේ වෛද්‍ය විද්‍යාවේ පියා හිපොක්‍රටීස් එහෙමත් තුවාල කැළැල් සුව කරගන්න අනුමත කරලා තියෙන්නේ මී පැණි. ඔය රටවල විතරක් නෙමේ අපේ රටේ ආදිවාසීන් පවා තුවාල සුවවෙන්න මී පැණි බැඳලා තියෙනවා. මියැදෙමින් ඉන්න ආදිවාසියෙක්ට අවසාන පරිභෝජනේට මී පැණි දෙන එක අදටත් මහියංගනේ පැත්තේ ආදිවාසීන් අතුරට ඉෂ්ට කරන රාජකාරියක්.

ඔය කියන තරමට ගුණ වෙන්න මොනවද හැබෑටම මෙව්වගේ තියෙන්නේ? එහෙම හිතුණා නම් ඕන් අහගන්නකෝ විස්තරේ. මී පැණිවල B9, B1, B2, B6, A, C, E, K කියන විටමින් ජාති සෝරෝම තියෙනවා. ඊට අමතරව මී පැණිවල සමට හිතකර සම තරුණ කරන ඇමයිනෝ අම්ල 12ක් අඩංගුයි. ඒ විතරක් නෙමෙයි, ප්‍රතිබැක්ටීරියානාශක, ප්‍රතිදිලීරනාශකවලට අමතරව ප්‍රතිඔක්සිකාරක කිහිපයකුත් මී පැණිවල තියනවා. සමේ කොලැජන් උත්තේජනයක් කරලා අලුත් සෛල හදන්න ඔය කියාපු ගුණාංගවලට පුළුවන්. තුවාල, ලප කැළැල් එහෙමත් ඉක්මනින් මැකිලා යන්නේ සම ඉක්මනින් අලුත්වැඩියා කරන්න පුළුවන් ගුණේ නිසයි.

ප්‍රතිදිලීර, ප්‍රතිබැක්ටීරියා ගුණ නිසා කුරුලෑ හොඳ කරන්නත් මී පැණිවලට පුළුවන්. ඊට අමතරව සම සිනිඳු කරන්න, සමේ තියෙන සියුම් රැලි අහක් කරන්නත් මී පැණි ගානවා. අව් පිළිස්සුම්, අඳුරු ලප, තොල්වල එන හයිපර්පිග්මන්ටේෂන් නැති කරන්න කියාපු ඖෂධය මී පැණි. දිනපතා මී පැණි ගානවා නම් දෙතොල්වල අඳුරු ගතිය වුණත් ඉක්මනට නැති කරගන්න පුළුවන්.

මී පැණි බිඳුවක් වතුරට දැම්මහම ඒක කෙළින්ම වතුර පහලට ගිහින් ටික වෙලාවකින් තමයි විසිරෙන්නේ. හැබැයි බොරු මී පැණි වතුරේ දාපු ගමන් කෙළින්ම දියවෙලා යනවා

"මොන පිස්සුද අනේ මමත් තොල්වල මී පැණි ගාලා තියෙනවා. කිසි වෙනසක් නැහැ."

ඔහොම කියන බවලතියෝ ඕනතරම් මටම මුණගැහිලා තියෙනවා. මෙන්න මේකයි කාරණාව. මීයක් කඩනවා කියන එක එසේ මෙසේ සෙල්ලම් අඩව්වක් නෙමේ. මැහි කෙල්ලෝ (මී මැස්සියෝ) මල් ඇදුමේ (මල් රොන් ගන්න යන වෙලාව) යන හෝරාව බලලා ඒ අය අහක් වුණාට පස්සේ කළු බණ්ඩාර දෙවියන්ට කාරිය වැඳලයි මී අතගාන්න ඕනේ කියලයි ආදිවාසී ඇත්තෝ කියන්නේ. ආදිවාසී ඇත්තෝ විතරක් නෙමේ මී කඩන කොයි ඇත්තත් බොහොම මහන්සි වෙලා අවධානමක් අරගෙන කරන වැඩක්නේ ඒක. එහෙව් මීයක් කඩයිද ඉතින් අත ලෙවකන්න. එහෙම බලපුවාම ඇත්තම මී පැණි ඇත්තටම ගුණ වුණාට ඔය කඩවල්වලින් ගන්න තියෙන ගොඩක් මී පැණි ෆේක්වා සුදුනෝනේ.

මී පැණි බෝතලයක් ගෙනාපුවාම ඒක මූණේ ගාන්න කලින් ඇත්ත මී පැණියක්ද කියා විපරම් කරලා බලන්න ඕනේ. බයවෙන්න කාරිය නෑ. ඒකට විදි කීපයක්ම තියෙනවා. පළවැනි දේ මී පැණිවලටම ආවේණික සුවඳක්, රසක් තියෙනවා. අම්මලා ආත්තම්මලා නම් ඉතින් ඔව්වා දන්නවා. ඒ නැත්නම් ගිනිකූරක් අරන් මී පැණි ටිකක් ගාලා ටික වෙලාවක් තියලා පිහිදලා පත්තු කරන්න. ඇත්තම මී පැණිවල ගෑවුණා නම් ඒ ගිනිකූර හොඳ දැල්ලට පත්තුවෙනවා. හැබයි බොරු මී පැණි නම් ගෑවුණොත් ගිනිකූර හරියට පත්තුවෙන්නේ නැහැ. ඒ වගේම මී පැණි බිඳුවක් වතුරට දැම්මහම ඒක කෙළින්ම වතුර පහලට ගිහින් ටික වෙලාවකින් තමයි විසිරෙන්නේ. හැබැයි බොරු මී පැණි වතුරේ දපු ගමන් කෙළින්ම දියවෙලා යනවා. අනික මී පැණි ලිපේ තියාපුවාම බුල්ටෝ තාලෙට ඝන වෙන්නේ නැහැ. හැබැයි සීනි පැණිවලින් හදපු හොර මී පැණි ලිපේ තියාපුවාම බුල්ටෝ කෑල්ල වගේ ඝන වෙනවා. ඔය කියාපු පරීක්ෂණ ටික කරලා අරන් තියෙන්නේ හොඳ මී පැණි නම් විතරක් මේ කියන සත්කාර ටික කරලා බලන්න.

මී පැණිවලට පොල්කිරි නැත්නම් නැවුම් කිරි ටිකක් මිශ්‍ර කරලා සම ක්ලේන්සර් කරන්න. ලප කැළැල්, අව් පිළිස්ස්සුම්, කුරුලෑ තියනෙවා නම් මූණ පිරිසිදු කරලා සෘජුවම මී පැණි ගාන්න. සතියකට දෙපාරක් මේ සත්කාරය කළාම ඇති. මී පැණිවලට තක්කාලි යුෂ එකතු කරලා සමේ ගාන්න. විනාඩි 20ක් තියලා සෝදලා අරින්න. සම හොඳට පැහැපත් කරන්න මේ සත්කාරය හොඳයි.

කුරුලෑ තියෙන කෙනෙක් නම් මී පැණිවලින් මේ වැඩ ටික කරලා බලන්න. මී පැණි, කඩල පිටි, කස්තුරි කහ එකට මිශ්‍ර කරලා පිරිසදු කරපු සමේ ආලේප කරන්න. විනාඩි 15ක් විතර තියලා සෝදලා අරින්න. දෙහි යුෂ තේ හැන්දකට වතුර තේ හැඳි දෙකක්, මී පැණි තේ හැන්දක් එක්කාසු කරලා මූණ හෝදන්න.

වියළි ගතිය අඩු කරලා සම තෙතමනය කරන්න මී පැණිවලට පුළුවන්. මී කිරිවලට මී පැණි ටිකක් එක්කාසු කරලා ගාන එකයි ඒකට කරන්න තියෙන්නේ. ලස්සන රතු තොල් දෙකක් ලබාගන්න ආස නම් අර කිව්වා වගේ බොරු මී පැණි නැතිව ඉස්තරම් මී පැණි හැමදම තොලේ ගාලා බලන්න. ඊට අමතරව කෝමාරිකාවලට මී පැණි එකතු කරලත් දෙතොල්වල ගාන්න පුළුවන්.

සුදුහාල් පිටිවලට මී පැණි, කස්තුරි කහ, මී කිරි එකතු කරලා හමේ ගෑවොත් සමේ තියෙන අඳුරු ලප කැළැල් ඉක්මනින්ම නැති කරගන්න පුළුවන්. ඔය කියාපු විදියට හරියටම බී හනී ගෑවොත් ඇත්තටම ලස්සන වෙන්න හරිම ලේසියි හනී කියලා තමයි අවසානෙදි කියන්න තියෙන්නේ හනී!

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

ලංකාවේ සුප්‍රසිද්ධ කාන්තාවන් රැසකගේ සුරූපීබවේ රහස

වසර 30 විශ්වාසය සහ පළපුරුද්ද සමඟ

ආචාර්ය
දමයන්ති විමලවීර

මාලබේ තලාහේනේදී...

යුවතියන්, කාන්තාවන් වෙනුවෙන්

හිසේ සිට දෙපතුල දක්වාම ඇති රූපලාවණ්‍ය ගැටලුවලට විශේෂිත වූ සත්කාර,

පැහැපත්, සුමුදු සමක් සඳහා විශේෂ සත්කාර,

විශ්වසනීය පැහැදිලි වෙනසක් සති කිහිපයකදී,

- **දිදුලන පැහැපත් මුහුණකට**
  (Skin Fairness) දින 03 ක් පමණයි
- **පැල්ලම් සහ මුහුණේ සිදුරු ඉවත් කිරීම**
  (Skin Polishing) දින 03 ක් පමණයි
- **කුරුලෑ සදහටම සුවය දින 05 ක් පමණයි**
  (5 Pimple Treatments) දින 03 ක් පමණයි
- **සිරුරේ අනවශ්‍ය තරබාරුව අඩුකරන වසර 25 ක අත්දැකීම්, ඉන්දියානු රහසිගත මැටි සත්කාර ක්‍රම අනුව**
  දින 20 දී අඟල් 3 ප්‍රමාණයක් (ආහාර පාලනය, වයස් ප්‍රමාණ නැත)

නිකටේ අනවශ්‍ය මේදය ඉවත් කිරීමේ ප්‍රතිකාර
TREATMENT FOR DOUBLE CHIN

පෙර

පසු

- දින 20 කදී මුහුණේ හැඩය යථා ස්වරූපයට 100% ප්‍රතිඵල සහිතයි.
- මෙම සත්කාරය ඉතා සරලව පහසුවෙන් ඔබටම නිවසේදී කර ගත හැක.

- උපදේශන සේවාවන් නොමිලේ -

ප්‍රතිකාර ලබාගැනීමට දින දෙකකට කලින් දුරකථන මඟින් වේලාවක් වෙන් කරවා ගන්න

සියලු සත්කාර - රසායනික ද්‍රව්‍ය නොමැත

(රජයේ අනුමත ආයතනයකි 118785 A)

මෙම සියලු සත්කාර විස්මිත සොබාදම් රහස් අනුව සිදු කරන අතර සෑම ප්‍රතිකාරයක්ම රජයේ අනුමැතිය සහිතයි.

ඔබේ සමේ පවතිනා ඕනෑම ගැටලුවක් සඳහා විශ්වසනීය සේවයක්...

කාර්යාලයීය දුරකථන — රූපලාවණ්‍ය කටයුතු සඳහා කාන්තාවන් පමණක් විමසන්න
0714254737 / 0767772369 / 0772772369 / 0727262559

පෞද්ගලික දුරකථනය - whatsApp
0766543059

යතුරුලියන්නියක ලෙස වෘත්තීය ජීවිතය ආරම්භ කර ප්‍රධාන විධායක නිලධාරිනී මට්ටම දක්වා පැමිණි නදී බී. ධර්මසිරි අද අපේ කතා නායිකාවයි. වාණිජ අංශයෙන් උසස්පෙළ විභාගයට සූදානම් වුවත් ජීවිතය හමුවට ආ එකී නොකී ප්‍රශ්න හේතුවෙන් ඇයට විභාගයට ඉදිරිපත් වීමට නොහැකි විය. එහෙත් අවසන අධ්‍යාපන ගමනේ ඉහළටම ගිය ඈ මහා බ්‍රිතාන්‍යයේ සී.අයි. එම්. අධ්‍යක්ෂ මණ්ඩලයටද තේරී පත්වූවාය. ඒ අතරතුර ආ අභියෝග සාර්ථකව කළමනාකරණය කරගනිමින් සතුටින් ජීවිතය දරන නදී ඒ ගැන 'ධරණී'ට කී කතාවයි මේ.

හැටදාහක් ගෙවපු රස්සාව අතෑරලා මම අටදහස් පන්සීයේ රස්සාව තෝරාගත්තා

නදී බී. ධර්මසිරි

ශක්තිවන්තී සොනොහොවන්තී

3 කොටස

උසස් පෙළ පංතිවල ඉගෙනගනිද්දි සෑම විෂයකටම ලකුණු අනුවකට වඩා ගත්ත ඔබ උසස් පෙළ විභායට ඉදිරිපත් වුණේ නැති බව මම අහලා තියෙනවා. අපි මේ කතාබහ එතැනින් පටන්ගනිමු?

හොඳයි. ඔය කාරණයට එන්න කලින් මම පුංචි කාලයේ පටන් ලබපු අධ්‍යාපනය ගැන කෙටියෙන් කියන්නම්. මට වයස මාස හයේ ඉඳන් අවුරුදු හයක් වෙනකම් ජීවත්වුණේ ජර්මනියේ. ඒ මගේ තාත්තා රාජ්‍ය තාන්ත්‍රික සේවයේ රැකියාව කළ නිසා. මම මොන්ටිසෝරි ගියේ ජර්මනියේ. ඊටපස්සෙ මුලින්ම පාසල් අධ්‍යාපනය ලැබුවේ කොළඹ ලින්ඩ්සේ බාලිකා විද්‍යාලයේ. පුංචිම කාලෙ පටන් ඉස්කෝලෙ ඇරිලා ආපු හැටියේ මම කළේ පහුවදට කරගෙන එන්න කියලා දීපු ගෙදර වැඩ කරන එක. අම්මවත් තාත්තාවත් කියලා නෙමෙයි මම එහෙම කළේ. මමම හිතලයි එහෙම කළේ.

එහෙම හොඳින් අධ්‍යාපන කටයුතු කළත් ශිෂ්‍යත්ව විභාගය පවත්වන දවස වෙනකොට මට හොඳටම උණ හැදුනා. උණ නිසා යන්න එපා කියලා ගෙදරින් කියද්දිත් මම ශිෂ්‍යත්වය ලියන්න ගියා. ඒ ගැහි ගැහී. එහෙම ගිහින් ලියපු ශිෂ්‍යත්ව විභාගයෙන් මම සමත් වුණේ කොළඹ දිස්ත්‍රික්කයේ දෙවැනියා විදියට. ශිෂ්‍යත්ව ප්‍රතිඵලය මත මට ඕනෑම පාසලක් තෝරාගැනීමේ අවස්ථාව ලැබුණා. ඒ අනුව මම තෝරාගත්තෙ කොළඹ විශාකා විද්‍යාලය. මගේ පාසල් ජීවිතයේ කිසිම වාර විභාගයක කිසිදු විෂයකට ලකුණු අසූපහකට අඩුවෙන් අරන් නැහැ. පළවැනි තුන්දෙනාගෙන් පහළට ගිහිල්ලත් නැහැ.

ඔය විදියට අධ්‍යාපන කටයුතු කරගෙන යන අතරේ සාමාන්‍ය පෙළ පංතියේදි මට මගේ පළමු පෙම්වතා මුණගැහුනා. ප්‍රේම සම්බන්ධය පටන්ගත්තට පස්සෙ පවත්වපු පළවැනි වාර විභාගයෙදි මම පංතියෙ හයවැනියා වුණා. ඒ තමයි මම පංතියේ තුන්වැනියාගෙන් පහළට ගිය පළවැනි සහ එකම අවස්ථාව. ඒ වෙලාවෙ මාව ෂොක් වුණා. හැබැයි ඊළඟට පවත්වපු වාර විභාගයේ පටන් මම එය නිවැරදි කරගත්තා. මම සාමාන්‍යයෙන් මගේ ජීවිතයේ කිසිම දෙයක් අම්මගෙන් හංගන්නෙ නැහැ. ප්‍රේම සම්බන්ධය පටන්ගත්තට පස්සෙත් සතියකින් මම ඒ ගැන අම්මට කිව්වා.

සාමාන්‍ය පෙළ පංතියේ ඉන්න දුව ප්‍රේම සම්බන්ධයක් පටන්ගත්තා කිව්වහම අම්මා මොන වගේ ප්‍රතිචාරයක්ද දැක්වූයේ?

අම්මා වැඩිය එය ගණන් ගත්තෙ නැහැ. අම්මා හිතන්න ඇති ඉස්කෝලෙ කාලෙ පෙම් සබඳතාවයක් නිසා එය වැඩිකල් තියෙන එකක් නැහැ කියලා. හැබැයි ඒක එහෙම වුණේ නැහැ. ප්‍රේම සම්බන්ධය පටන්ගත්තට පස්සෙ මගේ පෙම්වතා විදේශගත වුණා. විදේශගතව ඉඳලා ආපහු ආවට පස්සෙ ඔහු අපේ ගෙදර ආවා. ඒ වෙලාවෙ අපේ අම්මට තේරුණා එය නවතින සම්බන්ධයක් නෙමෙයි කියලා. ආගමික පසුබිම්, ආර්ථික පසුබිම්, පවුල් පසුබිම් වගේ කාරණා මත මට ඔහුව නොගැළපෙනවා කියන මතයේ අපේ අම්මා හිටියේ. ඒ නිසා මගේ ප්‍රේම සම්බන්ධයට අම්මා තදින්ම විරුද්ධ වුණා.

අපේ අම්මයි මමයි දෙන්නම හරිම මුරණ්ඩුයි. අම්මා මගේ ප්‍රේම සම්බන්ධයට විරුද්ධ වීමත් සමඟ ඇතිවුණු ප්‍රශ්න නිසා මට උසස් පෙළ විභාගය ලියන්න බැරිවුණා. මෙතැනදි මම ඔබට තවත් දෙයක් කියන්න ඕනි. මගේ පළමු පෙම්වතා දැඩිලෙස මත්ද්‍රව්‍යට ඇබ්බැහි වුවෙක් කියලා ඊට පසු කාලයක මම දැනගත්තා. හැබැයි එහෙම දැනගත්තත් පස්සෙත් මම ඔහුව අත්හැරියේ නැහැ. අවුරුදු හතක් මම උත්සාහ කළා ඔහුව මත්ද්‍රව්‍යවලින් ගලවා ගන්න. ඒකට මගේ දෙමව්පියනුත් ඔහුගේ දෙමව්පියනුත් උදව් කළා. ඒත් අපේ උත්සාහය සාර්ථක වුණේ නැහැ. ඊටපස්සෙ මම ඒ සම්බන්ධය නතර කළා.

උසස් පෙළ විභාගයට ඉදිරිපත් නොවුණත් ටයිපිස්ට් කෙනෙක් විදියට රැකියාවකට යොමුවෙලා ඔබ ඉතාම සාර්ථක වෘත්තිය ගමනක් ඇවිත් තියෙනවා. ඇයි ඒ ගමන ටයිපිස්ට් කෙනෙක් විදියට පටන්ගන්න හිතුවේ?

ඒක වුණේ මෙහෙමයි. උසස් පෙළ විභාගයට ඉදිරිපත් නොවී කාලය ඔහොම ගෙවෙද්දි අපේ අම්මා තමයි මට කිව්වේ ජාතික ආධුනිකත්ව මණ්ඩලය නොම්ලේ පවත්වන යතුරුලියනය පාඨමාලාව ගැන. මම ඒක කරන්න පටන්ගත්තා. ඒක වසරක පාඨමාලාවක්. පාඨමාලාව පටන් අරන් මාස හතකට පස්සෙ පාඨමාලාව කරපු අය වෙනත් ආයතනවලට දැම්මා ප්‍රායෝගික පුහුණුවට.

මට මතක විදියට ඔය පාඨමාලාවෙ විභාගයෙන් මම සමත් වුණේ පළමුවැනියා නැත්නම් දෙවැනියා විදියට. එහෙම සමත් වෙලා ලැබුණු ලකුණු අනුව අපිව පුහුණු කරන්න ඉල්ලන ආයතන අතරින් තමන් කැමති එකක් තෝරාගැනීමේ අවස්ථාව මට හිමිවුණා. ඒ අනුව මගේ තෝරාගැනීම වුණේ සංචාරක මණ්ඩලය. සංචාරක මණ්ඩලයේ ටයිපිස්ට් කෙනෙක් විදියට කාලයක් වැඩ කරලා ඊටපස්සෙ මම සීටීසී ඊගල් ආයතනයට එක්වුණා ස්ටෙනෝග්‍රැෆර් කෙනෙක් විදියට. එතැන ස්ටෙනෝග්‍රැෆර් කෙනෙක් විදියට අවුරුදු හතරක් වැඩ කළාට පස්සෙ මට උසස් වීමක් ලැබුණා දෙපාර්තමේන්තු ලේකම් කෙනෙක් හැටියට.

ඊටපස්සෙ මම ලේකම් කෙනෙක් විදියට කළ යුතු සෑම විභාගයක්ම කළා. ලේකම් කෙනෙක් හැටියට ඒ කාලෙ කරන්න පුළුවන් ඉහළම විභාගය තමයි London Chamber of Commerce Industry (Private Secretary's Certificate) කියන එක. ඒක අවුරුද්දක පාඨමාලාවක්. මම ඔය විභාගය කරපු අවුරුද්දෙ ඒකෙන් ලංකාවෙන්ම සමත් වුණේ දෙන්නයි. ඒ දෙන්නගෙන් එක්කෙනෙක් මම. ඒ අනුව ඒ කාලෙ ලංකාවෙ හිටපු ලේකම්වරියන් අතරින් ඉහළම සුදුසුකම් සපුරපු කීපදෙනා අතරින් මම එක්කෙනෙක් වුණා. ඔය විදියට සෙකටේරියල් ෆීල්ඩ් එකේ ඉහළටම ගිය මම අන්තිමට නැවතුනේ මහරාජා ව්‍යාපාරයේ සමූහ අධ්‍යක්ෂවරයකුගේ පෞද්ගලික ලේකම්වරිය වෙලා. මහරාජා ව්‍යාපාර ව්‍යුහය අනුව මම දරපු පෞද්ගලික ලේකම් තනතුර ජ්‍යෙෂ්ඨ කළමනාකාර කියන තනතුරට සමාන වුණා.

පෞද්ගලික ලේකම්වරියක් ලෙස ඉහළටම ගිය ඔබේ වෘත්තිය ජීවිතයේ හැරවුම් ලක්ෂයක් වෙන්නෙ අලෙවිකරණ ක්ෂේත්‍රයට පිවිසීමෙන්. කොහොමද අලෙවිකරණයට යොමුවුණේ?

මම කලින් ඔබට කියපු එල්.සී.සී.අයි.පී.එස්.සී. පාඨමාලාවේ එක විෂයක් තිබුණා Economics and External affairs කියලා. ඔය විෂය ඉගෙනගනිද්දි තමයි මට මාකටින්වල විෂය කාරණා ගැන යම් අවබෝධයක් ඇතිවුණේ. අලෙවිකරණය ගැන තිබුණු කැමැත්ත එතකොට තවත් වැඩි වුණා. මහරාජා ව්‍යාපාරයේ මූලිකත්වයෙන් ඩයලොග් ආයතනය ආරම්භ කරද්දි මහරාජා සමාගම් සමූහයේ සභාපති වුණු කිලී මහරාජා මහත්තයා මාව එක්කර ගත්තා ඩයලොග් එකට. ඩයලොග් ආයතනයේ ආරම්භක සාමාජිකයන් හත්දෙනා අතරින් එක්කෙනෙක් මම.

මහරාජා ආයතනයෙදි මට සැලකියයුතු ඉහළ වැටුපක් ලැබුණා. හැබැයි එතැන ඉන්නකොට මට දැනුණා මාකටින්වල පහළම පියවරේ ඉඳලා අත්දැකීම් මම ලබන්න ඕනි කියලා. ඒ නිසා මහරාජා ආයතනයෙන් ඉවත් වෙලා මම හේමාස් සමාගමට එක්වුණා Trainee Product Executive කෙනෙක් විදියට. ඒ කියන්නෙ මහරාජා ආයතනයෙදි දරපු තනතුරට වඩා බෙහෙවින් පහළ මට්ටමේ තනතුරකට. මහරාජා ආයතනයෙන් මට රුපියල් හැටදහසක වැටුපක් ලැබුණා. හේමාස් ආයතනයෙන් ආරම්භයේදි ලැබුණේ අටදහස් පන්සියයක වැටුපක්. මට එතැනදි වැදගත් වුණේ තනතුර සහ වැටුපට වඩා අලෙවිකරණ ක්ෂේත්‍රයේ ලබන අත්දැකීම්.

එහෙම ආරම්භ කරපු අලෙවිකරණ වෘත්තිය ගමන නිෂ්පාදන විධායක, සන්නාම කළමනාකරු, අලෙවි කළමනාකරු, අලෙවි සේවා කළමනාකරු, සහකාර සාමාන්‍යාධිකාරී, සාමාන්‍යාධිකාරී, අලෙවි ප්‍රධානී, අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක ලෙස ඉහළටම එන්න පුළුවන් වුණා. මම එහෙම වෘත්තිය ජීවිතයේ ඉදිරියටම ආවේ උසස් පෙළින් මගහැරුණු අධ්‍යාපන කටයුතුත් සම්පූර්ණ කරගන්න ගමන්. සී.අයි.එම්. කරලා පසු කාලයක මම සී.අයි.එම්. ලංකාවෙ සභාපතිනිය වුණා. ඒ කාලෙම මහා බ්‍රිතාන්‍යයේ සී.අයි.එම්.

අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකත්වයට පත්වුණා. සී.අයි.එම්. වගේම එම්.බී.ඒ. කළා. මම එම්.බී.ඒ. කළේ පී.අයි.එම්. එකේ. මෙරිට් පාස් එකකුත් ගන්න පුළුවන් වුණා. පස්සෙ කාලෙක ඩිජිටල් මාකටින් ඩිප්ලෝමාවකුත් කළා. මිනිසුන්ගෙ මනස ගැන වැඩි අවබෝධයක් ලබාගන්න මනෝ උපදේශනය ගැනත් ඉගෙනගත්තා. අදත් තවදුරටත් මම අධ්‍යාපන කටයුතු කරනවා.

ඔබ අලෙවිකරණ වෘත්තිය ජීවිතය ආරම්භ කළේ හේමාස් ආයතනයෙන්. එතැනින් පටන් අරන් මේතාක් පැමිණි වෘත්තිය ගමනෙදි ඔබ සේවය කළ ආයතන පිළිවෙලින් සඳහන් කරන්න පුළුවන්ද?

හොඳයි මම එය පිළිවෙලින් කියන්නම්. හේමාස් ආයතනයෙන් ෆීනික්ස් ඇඩ්වර්ටයිසින්. ෆීනික්ස් එකෙන් පස්සෙ රිටිස්බරි සහ මන්චී සමාගම. එතැනින් ලින්ක් නැචුරල්. ලින්ක් නැචුරල් සමාගමේ නිෂ්පාදනයක් වන සමහන් පැකැට්ටුවේ අදටත් තියෙන්නෙ මගේ මූලිකත්වයෙන් කරපු කවර නිර්මාණය. ලින්ක් නැචුරල් සමාගමෙන් පස්සෙ ග්‍රාන්ට් ඇඩ්වර්ටයිසින් ආයතනයේ වැඩ කළා අවුරුදු පහක් විතර.

එතැනින් පස්සෙ ඒෂියන් එලායන්ස් ඉන්ෂුවරන්ස් සමාගමේ සේවය කළා අවුරුදු නමයක්. දැන් සොෆ්ට්ලොජික් ඉන්ෂුවරන්ස් බවට පත්වෙලා තියෙන්නෙ එදා ඒෂියන් එලායන්ස් නමින් තිබුණු රක්ෂණ සමාගම. ඒෂියන් එලායන්ස් එකෙන් පස්සෙ මම එක්වුණේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට. ටෙලිකොම් ආයතනයෙන් සම්පත් බැංකුවට. එතැනින් පස්සෙ මම අන්තිමට සේවය කළේ ඩේවිඩ් පීරිස් සමාගමේ. ඔය සම්පූර්ණ වෘත්තිය ජීවිතයට වසර තිස්පහක්. දැන් මම මගේ ජීවිත අත්දැකීම් ඇසුරෙන් පුද්ගල සංවර්ධන දේශකයෙක් ලෙස කටයුතු කරනවා. මගේ නිදහසට බාධා නොවන ලෙස අලෙවිකරණ ක්ෂේත්‍රයට සම්බන්ධ උපදේශන සේවා සපයනවා. ඒ වගේම මගේම සමාගමක කටයුතුත් ආරම්භ කරලා තියෙනවා.

තිස්පස් වසරක වෘත්තිය ජීවිතයක් ඔබට තියෙනවා. ස්ථිර රැකියාවෙන් ඉවත්වෙලා තමන්ගේම ව්‍යාපාරයකට අතගහද්දි ඒක අවදානමක් කියලා දැනුණෙ නැද්ද?

මම ඔබට කලින් කියපු මහරාජා ආයතනයෙන් හේමාස් ආයතනයට යන තීරණය ගන්න වෙලාවෙත් මම එයට බයවුණේ නැහැ. රැකියාවේ තනතුර සහ වැටුප කියන කාරණා සලකනකොට එය විශාල තීරණයක්. මෙතැනදි මම තවත් කාරණයක් ඔබට කියන්න ඕනි. පාසල් අධ්‍යාපනයෙන් පසුව මම මගේ අධ්‍යාපන කටයුතුවලට රුපියලක්වත් අම්මගෙනුයි තාත්තාගෙනුයි ඉල්ලගෙන නැහැ. මම හම්බකරපු සල්ලිවලින් තමයි පාසල් කාලයෙන් පසු මගේ අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කරගත්තේ. මම මේ කාරණාවලින් කියන්න උත්සාහ කරන්නේ තීරණ ගන්න බයවෙන්න ඕනි නැහැ කියන එක සහ ලැබෙන ආදායම හරියට කළමනාකරණය කළොත් අපට අවශ්‍ය දේවල් කර ගන්න පුළුවන් කියන එක.

ස්ථිර රැකියාවෙන් ඉවත් වෙලා තමන්ගෙම දෙයක් කරන තීරණය ගන්න බය නොවුණේ එයට අවශ්‍ය පසුබිම අවුරුදු විස්සකට වැඩි කාලයක් තිස්සේ මම හදාගෙන ආපු නිසා. මම ඒ පසුබිම හදාගන්න පටන්ගත්තෙ මට වයස අවුරුදු තිහේදි මුහුණ දෙන්න වුණු සිදුවීමක් හින්දා. ඔය කාලෙ මගේ අම්මට සැත්කමක් කරන්න වුණා. අම්මා කැමති වුණේ නැහැ ඒ සැත්කම රජයේ රෝහලක කරන්න. ඒ නිසා පෞද්ගලික රෝහලක කළේ. හැබැයි රෝහලේ බිල ගෙවන්න මා ළඟ ඒ වෙලාවෙ සල්ලි තිබුණෙ නැහැ. අන්තිමට වෙන කරන්න දෙයක් නැතිව මගේ රත්තරං බඩු ඔක්කොම උගස් තියලා තමයි රෝහලේ බිල ගෙව්වේ.

එදා තමයි මට ඉතිරිකිරීමේ වටිනාකම හරියටම තේරුණේ. ඒ නිසා එදා ඉදලා මම ඉතිරිකිරීම හොඳින්ම කළා. හැබැයි මම එහෙම ඉතිරි කළේ ලෝබකමට හැමදේම පොදිගහගෙන නෙමෙයි. ලංකාව පුරා වගේම ලෝකයේ රටවල් ගණනාවක මම සංචාරය කළා. ඒ වගේම සමාජ සේවා කටයුතුත් සෑහෙන්න කළා. අදටත් කරනවා. ඔය හැමදේම අතරේ මම විනයක් ඇතිව ඉතිරිකිරීමත් කළා. ඒ වගේම ඉතිරිකරගත්ත දේ ආරක්ෂාකාරීව ආයෝජනය කළා. ඒ නිසා වෘත්තිය ජීවිතයේ මට ඇතියි කියලා හිතුණු තැනට ආවට පස්සෙ ස්ථිර රැකියාවෙන් ඉවත්වෙන තීරණය ගන්න අපහසු වුණේ නැහැ. ස්ථිර රැකියාව කරපු කාලෙ වගේම වෙනසකින් තොරව මගේ ජීවන විලාසිතාව පවත්වාගෙන යන්න පුළුවන් ආර්ථික ශක්තියක් මම ගොඩනගාගෙන තියෙනවා.

ඔබ විවාහයෙන් වෙන්වෙලා තනිකඩ ජීවිතයක් ගත කරන කෙනෙක්. ජීවිතයට සහකරුවෙක් හිටියනම් හොඳයි කියලා හිතෙන අවස්ථා නැද්ද?

එකට ජීවත්වෙන්න බැරි තරමට නොගැළපීම් තියෙනවා කියලා දැනුණු තැනදි ඉතා කෙටි කාලයකින් මමයි සැමියයි සුහදව වෙන්වුණේ. හැබැයි අදටත් ඔහු මගේ හොඳ මිතුරෙක්. විවාහයෙන් වෙන්වුණාට පස්සේ මට ප්‍රේම සම්බන්ධතා කිහිපයක්ම තිබුණා. ඒත් ඒවා විවාහය දක්වා ගියේ නැහැ. තවත් වැදගත් දෙයක් මම මෙතැනදි කියන්න ඕනි. ඒ තමයි විවාහ වෙලා හිටිය කාලෙදි මගේ සැමියගෙන්වත් ප්‍රේම සම්බන්ධතා තිබුණු කාලවල පෙම්වතුන්ගෙන්වත් මම කවදාවත් යැපිලා නැහැ. මම උපයපු මුදල්වලින් ස්වාධීන ආර්ථික ශක්තියක් ඇතිව මම හැමදාම ජීවත් වුණේ. අදටත් ජීවත් වෙන්නේ. ඒ වගේම මගේ දෙමාපියන් දෙන්නගේ සෑම වියදමක්ම දරමින් ඒ දෙන්නව සියයට සියයක්ම බලාගන්නෙත් මම.

සමහරු හිතන්නෙ මම වගේ තනිකඩව ඉන්න අයට පහසුවෙන් ළංවෙන්න පුළුවන් කියලා. ඔවුන්ගෙ ඕනෑ එපාකම් මම වගේ අයගෙන් සපුරගන්න පුළුවන් කියලා. එහෙම හිතලා මට ළංවෙන්න උත්සාහ කරපු සමහරුන්ට මම බැනලත් තියෙනවා.

මම මෙතැනදි කිවයුතුම තවත් දෙයක් තමයි ස්වාධීන ආර්ථික ශක්තියක් ගොඩනගාගෙන තනිකඩව ඉන්න කාන්තාවන් දිහා සමාජයේ බොහෝදෙනෙක් දකින විදිය ගැන. සාමාන්‍ය මනුෂ්‍යයෙක් විදියට සමහර අවස්ථාවල දැනෙන දුක වේදනාව හැරුණාම මම මේ ගෙවන්නෙ පසුතැවීම් නැති බොහොම තෘප්තිමත් ජීවිතයක්. හැබැයි සමාජයේ සමහරු හිතන්නෙ මම වගේ තනිකඩව ඉන්න අයට පහසුවෙන් ළංවෙන්න පුළුවන් කියලා. ඔවුන්ගෙ ඕනෑ එපාකම් මම වගේ අයගෙන් සපුරගන්න පුළුවන් කියලා. එහෙම හිතලා මට ළංවෙන්න උත්සාහ කරපු සමහරුන්ට මම බැනලත් තියෙනවා ලිංගික උවමනා ඉටුකරගන්න මට ළංවෙන්න එන්න එපා කියලා.

ඔබ ජීවිතයේ විවිධ කාලවල සෑහෙන සෞඛ්‍යමය අභියෝගවලට මුහුණ දුන්නු කෙනෙක්. ඒ ගැන කියන්න කැමතියි නම් එතැනින් අපේ මේ සංවාදය අවසන් කරන්න මම කැමතියි?

ඔව්. ජීවිතේ එක් එක් කාලවල මම සෑහෙන සෞඛ්‍යමය අභියෝගවලට මුහුණදීලා තියෙනවා. එක අවුරුද්දක මාස දහයක වගේ කාලයක් ඇතුළත මට දහතර පාරක් රෝහල්ගත වෙන්න වුණා. කොවිඩ් වසංගතය ආරම්භ වෙනකොට මගේ වෛද්‍යවරු මට අවධාරණයෙන් කියපු දෙයක් තමයි කොවිඩ් නම් හදාගන්න එපා හැදුනොත් බේරගන්න බැහැ කියලා. හැබැයි මට කොවිඩ් වැළඳුණා. කොවිඩ් හොඳවෙනකොටම ඩෙංගු හැදුණා. ඒ වගේම සැත්කම් ගණනාවකට මම මුහුණ දීලා තියෙනවා. ඔය හැමදේටම මුහුණ දීලත් මම ඔලුව කෙළින් තියාගෙන ජීවත් වෙනවා. වෛද්‍ය උපදෙස් අනුව නම් මම මේ වෙනකොට සෑහෙන බෙහෙත් ප්‍රමාණයක් බොන්න ඕනි කෙනෙක්. හැබැයි මම එහෙම බෙහෙත් බොන්නෙ නැහැ. මම අසනීප කළමනාකරණය කරගෙන ඉන්නෙ මානසික ශක්තියෙන්. අසනීපයක් වුණාහම ඒ ගැනම හිත හිතා ඉන්නෙ නැතිව මනස ශක්තිමත් කර ගත්තහම අපට අපවම පාලනය කරගෙන ලෙඩරෝග පරාජය කරන්න පුළුවන්.

ඉතින් අන්තිමට අපේ රටේ කාන්තාවන්ට දෙන පණිවිඩය මොකක්ද?

තමන් තුළ තියෙන ශක්තිය කිසිම වෙලාවක අවතක්සේරු කරන්න එපා. තමන්ගෙ ශක්තිය නිවැරදිව හඳුනාගත්තොත් විශ්ව ශක්තියත් ආශිර්වාද කරනවා. ජීවිතේ මුහුණ දෙන්න වෙන ඕනිම අභියෝගයකදි පසු බසින්නෙ නැතිව තමන්ගෙ ශක්තියෙන් තමන්ගෙ කකුල් දෙකෙන් හිටගන්න කියන එක තමයි මම අපේ රටේ කාන්තාවන්ට කියන්නේ.

■ හසිත කුරුප්පු

කොමලිගේ කොලම වෙත කවි පැන එවීමේදී
පද පේළි 4කින් යුත්
එක් කවියක් පමණක්
යොමු කිරීමට කාරුණික වන්න.

ප්‍රශ්නය

රූස්ස ගස් කාසි වෙලා කහවණු මළු පිරෙනකොට
වැහිබිඳු ටික නතරවෙලා පොළොවේ ඉරි ඇඳෙනකොට
ඇළ දෙළ ගං පාළුවෙලා ජල උල්පත් සිඳෙනකොට
කොමලියෙ ඇයිද නුඹත් නිහඬ කියනු මට

නුවන්ති හංසිනී උත්පලා - සඳලංකාව

පිළිතුර

කියලා කියලාම කටටත් මහන්සී
මුනිවත රකින්නේ ඒකයි දැන් හංසී
කපලා ගස්කොලන් අදිනා උන් අන්චී
ඊළඟ භවයකදි වේවා චිම්පන්සී

ප්‍රශ්නය

දුටුවෙම් දෙහක සිට කකුලක තිබෙන කොරේ
කිමදැයි හැමදම උඹලගෙ ගෙදර පොරේ
රට වටෙ හැමගෙ ඇස් කන් දැන් හොඳට ඇරේ
තිබෙනවා නොවෙද කොමලියෙ උඹෙ හිතක හොරේ

කේ.මිතුනි යසාරා - සඳලංකාව

පිළිතුර

කවුරුත් නැති වුණම ගෙනයන්නට කැන්ද
ඒ අය කරන්නෙම අන් අය හට නින්ද
කන්නෙයි අඳින්නෙයි මගෙ පඩියෙන් හින්ද
උත්තර නම් බඳින්නට ඕනෙද මන්ද

ප්‍රශ්නය

කවියට උපන් කවි කොමලිය බලන්නට
දවසක එනවමයි ඔය රුව දකින්නට
පවසක දැවෙන මේ සිත ගිනි නිවන්නට
කැමතිද කියන්නකො ළඳුනේ ඉතින් මට

මැණිකේ වන්නිනායක - කුරුණෑගල

පිළිතුර

කද මලු බැඳන් ඔබ එනකන් හනිකේ
ඇඟිලි ගැන ගැනම ඉන්නව මම මැණිකේ

ප්‍රශ්නය

කුඩා වියේදී මට කීවා කිවිඳු තුමෙක් අනාවැකී
එය දළු ලා ගෙන එනවා එය අමුතුම ජවියකී
කොමලි නගා නොහිටින්නට මගෙ කවිකම සිහිනයකී
උඩුගම සූරිය කිවිඳුව සිරස නමා පිළිගනිමී

කමලාවතී එදිරිසිංහ - පතිරගේවත්ත, යගිරල

පිළිතුර

මේ වැනි කොලමකුත් මෙහි අරඹා ඇත්තේ
ඔබ වැනි අයට අත දෙන්නයි කමලක්කේ
කවිකම් වලදි නැත කවදත් පසු බැස්සේ
දංගෙට වුණත් මම එමි කවියන් පස්සේ

ප්‍රශ්නය

හැම සති මැදම කියවනවා මා ධරණී
කොමලි දකින විට කරනවා සිත පෙරළී
දෑවැදි එපා ඇති ඔය සිනහව කොමලී
මගෙ ලොකු පුතුට දෙනවද ඔබෙ අත සියුමැලී

සී.දර්ශනිකා- ජනශක්තිගම , බෝපේ, පාදුක්ක.

පිළිතුර

ටිකදෙහොකට උඩදි එක කොල්ලෙක් බෝපේ
කෙල්ලෙකු හැර ගොසිනි කුසකට දී සාපේ
දැන් ඌ හොයාගන්නත් නැත මේ දීපේ
එනිසා කොහොම දෙන්නද මයෙ මනාපේ

ඔබේ කවි අභියෝග

කොමලිගේ කොලමට එවීමේදී 0712808985 හෝ dharanee.editor@liberty.lk යන ඊමේල් ලිපිනයට යොමු කරන්න.නැතිනම්, කොමලිගෙ කොලම, ධරණී පුවත්පත, නො.91, විජේරාම මාවත, කොළඹ 07. යන ලිපිනයට එවන්න

ඉස්සර මට කිව්වේ බනානා මෑන් කියලා ඒත් දැන් කියන්නේ පෑඩ්මෑන්

තනූජ චන්ද්‍රසේකර



කෙසෙල් කෙන්දෙන් කල නිර්මාණයක්

තමන් රටේ ජනාධිපති වුණොත් පාසල් දැරියන්ට නොමිලේ සනීපාරක්ෂක තුවා දෙනවයි කියලා සජිත් ප්‍රේමදාස මහත්තයා පහුගිය ජනාධිපතිවරණය සමයේ පොරොන්දුවක් වුණා. ඒක නොම්මර එකේ පොරොන්දුවක් වුණාට මොකද අපේ උන්දැලා ඒක අල්ලගත්තේ වැරදි තැනකින්. ඒකෙන් මේකෙන් වුණේ ඒ කාලේ සජිත් මහත්තයට 'පෑඩ්මෑන්' කියලා නමකුත් පටබැඳුනු එක. හැබැයි ඉතින් එතුමා ජනාධිපතිවරණයෙන් පරාජය වුණාට පස්සේ ඡන්ද පොරොන්දුවත් නිකන්ම යටගියා.

ඔය කාලෙම වැඩි සද්ද බද්ද නොකර ගාල්ල පැත්තේ තරුණයෙක් හරි අපූරු සමීක්ෂණයක් කරමින් හිටියා. ඒකට ඔහු රටේ විවිධ ක්ෂේත්‍රවල ඉන්න කාන්තා උදවිය එක්කාසු කරගෙන හිටියා. එතැනදි ඔහු බැලුවේ දැනට වෙළඳපොළේ තියෙන සනීපාරක්ෂක තුවා සම්බන්ධව මේ කාන්තාවන්ට ඇති ගැටලු මොනවද කියලා. ප්‍රධානම ගැටලුව වුණේ රුධිරය අවශෝෂණය කරන ප්‍රමාණය මදි කියන එක. අනෙක තමයි සනීපාරක්ෂක තුවායේ ප්‍රමාණය. තවත් ගැටලුවක් වුණේ භාවිතයේදී කකුල් කැපීම සහ චර්ම රෝගවලට ලක්වීම. ඉතින් මේ කාරණා ටික අහපු මේ ගාල්ලේ තරුණයාට ඕන වුණේ ඒ ගැටලු එකක්වත් නැති සනීපාරක්ෂක තුවායක් අලුතින්ම හදන්න.

"මං ඒ වෙනකොට කෙසෙල් ගස්වල කෙඳිවලින් ඇඳුම් ඇතුළු එක එක නව නිෂ්පාදන හදලා තිබුණා. අවසානයට හදලා තිබුණේ තුවාලයක් වුණාම ලේ නවත්තන්න තියන පෑඩ් එකක්. මට හිතුණා මං හදන මේ සනීපාරක්ෂක තුවායත් කෙසෙල් කෙඳිවලින්ම හදන්න ඕන කියලා. මොකද කෙසෙල් කියන්නේ හොඳින් ජලය උරාගැනීමේ ශක්තියක් තියෙන ගහක්. ඒ එක්ක මං අවුරුදු හතර හමාරක් තිස්සේ විවිධ පරේයිෂණ කරලා අන්තිමේ කෙසෙල් කෙන්දෙන් 100% ක් සෞඛ්‍යරක්ෂිත සනීපාරක්ෂක තුවායක් නිර්මාණය කළා."

මේ දිනවල 'ලංකාවේ පෑඩ්මෑන්' විදියට ප්‍රසිද්ධ වෙලා ඉන්න තනූජ චන්ද්‍රසේකර කතාබහට මුලපිරුවේ ඒ විදියට. දන්නවද ඔහු මේ වෙනකොටත් වෙළඳපොළේ තියෙන සනීපාරක්ෂක තුවාවලට දැඩි අභියෝගයක් වෙමින් කෙසෙල් කෙඳි උපයෝගී කරගෙන ඉතා සාර්ථකව සනීපාරක්ෂක තුවායක් හදලා ඒකට පේටන්ට් බලපත්‍රයත් අරගෙන ඉවරයි. ඒ විතරක් නෙවෙයි තනූජ තමයි කෙසෙල් කෙඳි යොදාගෙන සනීපාරක්ෂක තුවායක් නිෂ්පාදනය කරපු ලෝකයේ පළවැනියා විදියට සැළකෙන්නේ.

"මේ වෙනකොට වෙළඳපොළේ තියෙන සනීපාරක්ෂක තුවා එක්ක ගත්තම මං නිෂ්පාදනය කරපු සනීපාරක්ෂක තුවාවල විශේෂත්වයන් ගණනාවක්ම තියෙනවා. සාමාන්‍යයෙන් වෙළඳපොළේ තියෙන එකක රුධිරය අවශෝෂණය කිරීමේ ශක්තිය පැය හයට මිලිලීටර් 32ක් වගේ වෙනවා. ඒත් මම නිෂ්පාදනය කළ සනීපාරක්ෂක තුවායට පුළුවන් පැය තුනකදි රුධිරය මිලිලීටර් 58ක් උරාගන්න. ඒ වගේම සාමාන්‍ය එකකට වඩා මං හදපු මේ සනීපාරක්ෂක තුවාය ප්‍රමාණයෙන් ලොකුයි. ඒ නිසා කැපීම් එහෙම වෙන්නේ නෑ. අනික තමයි මේකෙන් චර්ම රෝග වගේ ආසාධන ඇතිවෙන්නෙ නැති බවත් අපි සහතික කරනවා. විශේෂම කාරණාව වෙළඳපොළේ තියෙන සනීපාරක්ෂක තුවායක් දිරාපත් වෙන්න අවුරුදු මිලියන 800ක් විතර යනවා. ඒත් මේක සති හයකින් දිරනවා. ඒ අතින් මේක කාන්තා සිරුරට වගේම පරිසරයටත් ඉතාම හිතකරයි."

ඒ කියපු විශේෂත්වයන් එක්ක බැලුවම මේ වෙනකොට වෙළඳපොළේ තියෙන සනීපාරක්ෂක තුවාවලට ඒක ලොකු අභියෝගයක් වෙයි කියලයි අපිට හිතුණේ.

යන්ත්‍රයේ ආධාරයෙන් කෙසෙල් කෙඳි ලබාගනිමින්

ඒත් තනූජගේ සනීපාරක්ෂක තුවාය වෙළඳපොළෙන් මිලදීගන්න නම් තවත් පුංචි කාලයක් බලාගෙන ඉන්න වෙයි කියලයි තනූජ 'ධරණී'ට කිව්වේ.

"දැන් තියෙන්නේ වෙළඳපොළට දාන්න විතරයි. ඒත් ඒකට තව මාස හතරක වගේ කාලයක් යයි. 2024 අලුත් අවුරුද්ද ඉලක්ක කරලා තමයි සනීපාරක්ෂක තුවාය මං වෙළඳපොළට දාන්න හිතන් ඉන්නේ. පහුගිය දවස්වල ඒකට නමක් බැලුවා. අවසානෙට 'නාරි' සනීපාරක්ෂක තුවා කියලා තමයි නම දැම්මේ."

තනූජ කියපු විදියට එහෙම සරල හුරුපුරුදු නමක් දාන්න හිතුවේ දැනට වෙළඳපොළේ තියෙන සනීපාරක්ෂක තුවා හැම එකම වගේ ඉංග්‍රීසි නම්වලින් තියෙන හින්දලු. ඒ හරහා මේක අපේ ලංකාවේ දෙයක් කියන එක කියන්නයි තනූජට ඕනවෙලා තියෙන්නේ. හැබැයි නමේ විතරක් නෙවෙයි මිලෙත් ලොකු වෙනසක් තියනවා කියලා හිතුනේ 'නාරි' සනීපාරක්ෂක තුවා පැකට්ටුවක මිල ඇහුවට පස්සේ.

තනූජ චන්ද්‍රසේකර

ඇත්තටම ඒ නමට මගේ කිසි විරුද්ධත්වයක් නෑ. මං ඒ නමට කැමතියි

"අද වෙනකොට සනීපාරක්ෂක තුවාවල අවශ්‍යතාවය තියෙන ලක්ෂ ගණනක පිරිසක් අපේ රටේ ඉන්නවා. ඒත් කියන්න කණගාටුයි එයින් බොහෝ ප්‍රමාණයක් ඔසප් දිනවලට සනීපාරක්ෂක තුවායක් භාවිතා කරන්නේ නෑ. ඒකට ලොකුම හේතුව වෙලා තියෙන්නේ ඒවයේ මිල. අනික තමයි දුෂ්කර පළාත්වල පාසල් දැරියෝ ඔසප් දිනවලට පාසල් එන එක අඩුයි කියලා වාර්තාවෙනවා. ඒකට හේතු වෙන්නෙත් ඔවුන්ගේ දෙමාපියන්ට ඔසප් දිනවලට සනීපාරක්ෂක තුවා පැකට් එකක් අරන් දෙන්න වත්කමක් නෑ. ඒකට නොදැනුවත්කමත් බලපානවා. ඒ නිසා කාටත් බරක් නොවෙන්න මං නිර්මාණය කරපු සනීපාරක්ෂක තුවා පැකට් එකක් රුපියල් 190ක් වගේ මිලකට දෙන්න මං තීරණය කළා. පැකට් එකක තුවා 10ක් තියෙනවා."

නාරි සනීපාරක්ෂක තුවායක්

තනූජ ඒ කතාව කියද්දි මට මතක් වුණේ ඉන්දියාවේ පෑඩ්මෑන්. අරුණාචලම් මුරුගනන්තම් කියන ඔහු තමන්ගේ බිරිඳ ඔසප් දවස්වලට කිළිටි රෙදි කෑලි පාවිච්චි කරන හැටි දැකලා දැඩි වේදනාවකට පත්වුණා. ඉතින් ඔහු ඇයට කඩෙන් සනීපාරක්ෂක තුවා පැකට් එකක් අරන් දෙන්න ගියත් ඒවගේ මිල තමිල්නාඩු ප්‍රාන්තයේ හිටපු දුප්පත් මනුස්සයෙක් වුණු අරුණාචලම්ට දරාගන්න වුණා. ඒ නිසයි ඔහු සනීපාරක්ෂක තුවායක් හදන්න තීරණය කළේ. ඊටපස්සේ ඔහුට ප්‍රශ්න, අභියෝග රැසකටම මුහුණදෙන්න වුණා. ගමෙන් විතරක් නෙවෙයි පවුලෙනුත් ඔහු කොන්වුණා. හැබැයි අන්තිමේ ඔහු සනීපාරක්ෂක තුවායක් හදලා ඒක ඉන්දියාවේ කාන්තාවන්ට සහන මිලකට ලබාදෙන්නත් කටයුතු කළා. මුලදි හැමෝම කොන්කරලා දාපු අරුණාචලම්ව 'පෑඩ්මෑන්' කියන නමින් ඉන්දියාවෙම ප්‍රසිද්ධ වුණේ එහෙම. ඒත් එක්කයි මට අහන්න හිතුණේ තනූජටත් අරුණාචලම්ට වගේ එහෙම ප්‍රශ්නවලට මුහුණපාන්න වුණේ නැද්ද කියලා.

"ඇත්තටම මට එහෙම ප්‍රශ්නවලට මුහුණදෙන්න වුණේ නෑ. ඒත් මේ නිෂ්පාදනය ගැන පරේයිෂණ කරලා අත්හදාබැලීම් කරලා හැමදේම කරන්න අවුරුදු හතරහමාරක කාලයක් ගතවුණා. ඒ වෙනුවෙන් මට උදව් කරපු මගේ කණ්ඩායමත් මේ වෙලාවේ මතක් කරන්න ඕනේ. මගේ ගෙවල් ගාල්ලේ වුණත් පෑඩ් හදන කර්මාන්තශාලාව තියෙන්නේ කෙසෙල් වගාවට ප්‍රසිද්ධියක් උසුලන තිස්සමහාරාමයේ. මේ විදියට කෙසෙල් කෙඳි භාවිතා කරලා පෑඩ් හදන එකත් ලොකු අභියෝගයක් තමයි."

තනූජ කියන්නේ තාමත් 29 හැවිරිදි තරුණයෙක්. ඔහු මේ වෙද්දි මෘදුකාංග ඉංජිනේරුවෙක්, නව නිපැයුම්කරුවෙක් වගේම සාර්ථක ව්‍යාපාරිකයෙක්. 'වස්ත්‍ර සිලෝන්' නමැති රෙදිපිළි ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා වෙන්නෙත් මේ තනූජමයි.

"වස්ත්‍ර සිලෝන් එකේ හදන සියලුම දේවල් හදන්නේ ස්වාභාවික අමුද්‍රව්‍ය යොදාගෙන විතරයි. මට මතකයි මං මුලින්ම හැදුවේ කෙසෙල් කෙඳිවලින් රෙදි. ඒක සාර්ථක වුණාම තමයි කෙසෙල් කෙඳිවලින් තව එක එක දේවල් හදන්න පටන්ගත්තේ. ඒක හින්දම මිනිස්සු මට 'බනානා මෑන්' කියලා නමකුත් දැම්මා. ඒ එක්කම කියන්න ඕන ලෝකයේ ඉහළ පෙලේ ආයතන සඳහා ලබාදෙන 'Green Building' කියන සහතිකය ඇතුළුව අපේ සියලු නව නිෂ්පාදනවලට ISO ඇතුළු තත්ත්ව සහතික ලබාගෙන තියෙනවා."

ඒ වගේම නාරි සනීපාරක්ෂක තුවාය නිෂ්පාදනය කරපු එක ගැන තනූජ හරි වටිනා කතාවක් කිව්වා. ඒ තමයි ඔහු මෙහෙම දේකට අතගැහුවේ ව්‍යාපාරයකට වඩා මේක ජාතික වගකීමක් කියන හැඟීමෙන්ලු. ඒක නිසා රටේ සමස්ත කාන්තාවෝ ගැනම හිතලා රටේ ජනාධිපතිතුමාගේ ඉඳන් කවුරු කවුරුත්ම තනූජගේ මේ වැඩේට අතදෙනවා නම් තමයි වටින්නේ.

"දැනටමත් නාරි සනීපාරක්ෂක තුවාය ගැන ගොඩාක් අය දන්නවා. ඒ වගේම මට ගොඩාක් අය උදව් කරනවා. ඉතින් ඒ හැමෝගේම සහාය ඇතුව තවත් පුංචි කාලයක් ඇතුළත මේ නිෂ්පාදනය අපේ වෙළඳපොළට එනවා."

තනූජ එහෙම කිව්වේ ලංකාවේ කාන්තා උදවිය ඔහුව විශ්වාස කරයි කියන දැඩි ආත්මවිශ්වාසයකින්.

"ඉස්සර මට 'බනානා මෑන්' කියලනේ කිව්වේ. දැන් ඒ නම යට ගිහින් හැමෝම කියන්නේ 'පෑඩ්මෑන්' කියලා. ඇත්තටම ඒ නමට මගේ කිසි විරුද්ධත්වයක් නෑ. මං ඒ නමට හරි කැමතියි. ඒ නමත් එක්ක මට මගේ නව නිෂ්පාදනය පහසුවෙන්ම කාන්තාවන් අතට පත්කරන්න පුළුවන්."

■ රුවන් එස්.සෙනවිරත්න

ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍ය
අචින්ත දිසානායක
කොතලාවල ආරක්ෂක
විශ්ව විද්‍යාල රෝහල

මාරයා ගැබ්ගෙලට එබෙන්න කලින් සුව නාරි සායනයට යන්න

කාන්තාවන්ට බහුලව වැළඳෙන පිළිකා වර්ග දෙකක් හඳුනාගෙන තියෙනවා. එකක් ගැබ්ගෙල පිළිකාව. අනික පියයුරු පිළිකාව. ඔය අතරින් ගැබ්ගෙල පිළිකාව වඩා භයානක වෙන්නෙ පිළිකාව උඩු දුවනතෙක්ම රෝග ලක්ෂණ කිසිවක් නොපෙන්වන නිසා. නමුත් වෛද්‍යවරුන් නම් කියන්නේ ගැබ්ගෙල පිළිකාව කල්තියා හඳුනාගත්තොත් ප්‍රතිකාර සහ සැත්කම්වලින් සුව කරන්න පුළුවන් කියලා. ඒත් ගැටලුව තමයි, මේ රෝගය හඳුනාගැනීම සඳහා යා යුතු සායන සහ කළ යුතු පරීක්ෂණ පිළිබඳව අපේ කාන්තාවන් දැනුවත් නැතිකම. ඒ නිසා ඒ දැනුවත්භාවය ලබාදීම වෙනුවෙන් අපි කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලේ ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍ය අචින්ත දිසානායකට කතා කළා. ඒ සංවාදයේ සටහනයි මේ.

වෛද්‍යතුමනි, මුලින්ම අපි කාන්තාවන්ගේ ගැබ්ගෙල සහ ගැබ්ගෙල පිළිකාව ගැන සරල පැහැදිලි කිරීමක් කරලා ඉමුද?

ඇත්තම කිව්වොත් අපේ වෛද්‍ය සායනවලට එන සමහරක් කාන්තාවෝ ඉන්නවා ගැබ්ගෙල කියන්නෙ මොකද්ද කියලවත් හරියට දන්නෙ නෑ. ඒ නිසා මුලින්ම මම ඒ ගැන කියලා ඉන්නම්. ඔය ගැබ්ගෙල කියන්නේ කාන්තාවන්ගේ යෝනි මාර්ගයත් ගර්භාෂයත් එකට එකතු වෙන ගර්භාෂයේ පහළම කොටසට. ඒ ආශ්‍රිතව ඇතිවෙන පිළිකාවට තමයි අපි ගැබ්ගෙල පිළිකාවක් කියලා කියන්නේ.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ දත්තවලට අනුව 2018දී විතරක් ගැබ්ගෙල පිළිකාවලට කාන්තාවන් 570,000ක් ගොදුරු වෙලා තියෙනවා. ඒ අතරින් 311,000ක් මරණයට පත්වෙලා. කොහොමද කාන්තාවන්ව මේ රෝගයට මේ තරම්ම ගොදුරු වෙන්නෙ?

කාන්තාවන්ව මේකට ගොදුරු වෙන්නෙ ඒ අයට ලිංගිකව සම්ප්‍රේෂණය වෙන වෛරස් එකක් නිසා. ඒකට අපි කියන්නේ හියුමන් පැපිලෝමා (HPV) වෛරසය කියලා. මේක HPV6, HPV11, HPV16, HPV18 වශයෙන් තවත් භයානක ප්‍රභේද සීයක් විතර තියෙන වෛරසයක්. ඒ ප්‍රභේදවලින් ගැබ්ගෙල පිළිකාවක් හැදෙන්න මූලිකවම බලපාන්නේ HPV16, 18 කියන ප්‍රභේද දෙක.

ඔය කියන HPV කියන වෛරසය ආසාදනය වීමට වැඩි අවදානමක් තියෙන්නෙ මොනවගේ කාන්තාවන්ටද?

අවුරුදු 35ට වැඩි ලිංගිකව සක්‍රීය ඕනම කාන්තාවකට HPV වෛරස් එක ආසාදනය වෙන්න පුළුවන්. ගොඩක් දෙනෙකුගේ ශරීර ප්‍රතිශක්තිය විසින් ඇඟ ඇතුළෙදිම ඒ වෛරසය විනාශ කරනවා. නමුත් එහෙම නොවෙන කාන්තාවන් පිරිසකුත් ඉන්නවා. ඒ අයට තමයි මේ අවදානම වැඩිපුර තියෙන්නේ.

කොහොමද එහෙම ප්‍රතිශක්තිය අඩුවෙන්නේ?

HIV හෝ වෙනත් ලිංගික රෝගයකට ගොදුරුවීම, යම් යම් ඖෂධ භාවිතය, බහුපුරුෂ සේවනයේ යෙදීම, දුම්පානය වගේ හේතු නිසා ඇතැම් කාන්තාවන්ගේ ශරීර ප්‍රතිශක්තිය දුර්වලයි. එවැනි කාන්තාවන්ට මේ වෛරසය ආසාදනය වුණොත් කාලයක් තිස්සේ ඇඟ ඇතුළෙම වර්ධනය වෙලා උඩු දුවන්න පුළුවන්. හැබැයි මම මේ කියන්නෙ අනිත් කාන්තාවන්ට මේකෙන් බලපෑමක් නෑ කියන එකම නෙවෙයි. පෙර කියපු පිරිසට මේ රෝගයේ අවදානම වැඩියි කියන එක.

HPV ආසාදනය වුණ කාන්තාවන්ට මුලින් මතුවෙන්න පුළුවන් රෝග ලක්ෂණ මොනවාද?

මුල් කාලේදි කිසිම රෝග ලක්ෂණයක් මතුවෙන්නෙ නැහැ. ඒකයි මේකේ තියෙන භයානකකම. රෝග ලක්ෂණ සියල්ලක්ම මතුවෙන්න පටන්ගන්නෙ රෝගය ශරීරය ඇතුළෙම වර්ධනය වෙලා පිළිකාවක් බවට පත්වුණාට පස්සෙ.

මොනවද ඒ රෝග ලක්ෂණ?

යම් කාන්තාවකට ලිංගික සංසර්ගයෙන් පස්සෙ රුධිර වහනයක් වෙනවා නම්, ඔසප් වීම අතරමැද කාලයේදී අනවශ්‍ය රුධිර වහනයක් වෙනවා නම්, යෝනි මාර්ගයෙන් අධික දුර්ගන්ධයක් එක්ක ශ්‍රාවයන් පිටවෙනවා නම් ඒ වගේ අයට ගැබ්ගෙල පිළිකාවක් තියෙන්න පුළුවන්. ඒ නිසා වැදගත්ම දේ තමයි ඒ වගේ රෝග ලක්ෂණ තියෙනවා නම් හැකි ඉක්මනින් ප්‍රසව හා නාරිවේද වෛද්‍යවරයෙක් මුණගැහිලා අවශ්‍ය කරන පරීක්ෂණ කරගන්න එක.

ඊට අදාළ පරීක්ෂණ මොනවද?

ගැබ්ගෙල පිළිකා පරීක්ෂාවකින් තමයි කාන්තාවකට ගැබ්ගෙල පිළිකාවක් තියෙනවාද නැද්ද කියලා දැනගන්නේ. ඒකට අපි කියන්නෙ පැප් ස්මියර් (pap smear) ටෙස්ට් එක කියලා.

මේ පරීක්ෂණ සිද්ද කරන වෛද්‍ය සායන අපේ රෝහල්වල තියනවද?

මේ වෙනකොට අපි රට පුරාම තියෙන පවුල් සෞඛ්‍ය නිලධාරී කාර්යාලවල පවුල් සෞඛ්‍ය නිලධාරිනියන් හරහා සුව නාරී සායන පවත්වනවා. අවශ්‍යතා තියෙන ඕනම කාන්තාවකට තමන්ට අදාළ MOH කාර්යාලයට ගිහිල්ලා මේ සුව නාරී සායන ගැන වැඩි විස්තර දැනගන්න පුළුවන්. එහෙමත් නැත්තම් ඕනෑම රෝහලක ප්‍රසව හා නාරිවේද සායනයකට සහභාගී වෙලා අදාළ පරීක්ෂාවන් සිද්ධ කරගන්නත් පුළුවන්.

පැප් ටෙස්ට් (pap test) එකක් කරගන්න නියමිත කාලයක් එහෙමත් තියෙනවාද?

ඔව්. මුල්ම පරීක්ෂාව පළවැනි ලිංගික සංසර්ගයට අවුරුදු පහකට පස්සෙ කරන්න පුළුවන් නම් හොඳයි. ඒ නැතත් අවුරුදු 35ට වැඩි යම් කාන්තාවක් ලිංගිකව සක්‍රීය නම් අනිවාර්යයෙන්ම අවුරුදු පහෙන් පහට අවුරුදු 65ක් වගේ වෙනකම් මේ පරීක්ෂණය කරගන්න ඕනෙ. ඒකෙන් පූර්ව පිළිකා තත්ත්වයක් තියෙනවා නම් කල්තියාම හඳුනාගැනීමේ හැකියාව තියෙනවා. සාමාන්‍යයෙන් ලිංගික සක්‍රීය කාන්තාවක් තමන්ගේ මුල්ම ලිංගික සංසර්ගයෙන් අවුරුදු පහකට පස්සෙ පළවැනි පරීක්ෂාව කරගන්නවා නම් හොඳයි. ඒ නැතත් අවුරුදු 35ත් 40ත් අතර කාන්තාවන් තමන් ලිංගිකව සක්‍රීය නම් ගැබ්ගෙල පිළිකා පරීක්ෂණයක් කරගැනීම අනිවාර්යයයි.

යම් කෙනෙක් ගැබ්ගෙළ පූර්ව අවධියේදීම දැනගෙන ප්‍රතිකාර කළොත් සම්පූර්ණයෙන්ම සුව කරගන්න පුළුවන්ද?

මෙතැනදි අවධානයක් දිය යුතු පූර්ව පිළිකා අවධි 2ක් තියෙනවා. එකක් සුළු වශයෙන් තියෙන වෙනස්කම්. අනික තීව්‍ර වශයෙන් තියෙන වෙනස්කම්.

ඔය දෙක අපි හඳුන්වන්නෙ ගැබ්ගෙල පිළිකාවේ low and high grade lesions තත්ත්වයන් විදියට. Low grade කියන්නෙ HPV ආසාදනය වෙලා හෝ සුළු වෙනස්කම් විතරක් පෙන්නුම් කරන රෝගීන්ට. එහෙම අයට අපි පළවැනි පැප් ටෙස්ට් එකෙන් මාස හයකට පස්සෙ තව එකක් නියම කරනවා. මොකද ඒ මාස හය ගතවෙනකොට සමහරුන්ගේ ශරීරයේ තියෙන ස්වභාවික ප්‍රතිශක්තියෙන්ම මේ වෛරස් එක නැතිවෙලා යනවා. හැබැයි ගොඩක් වෙලාවට අපි අර කලින් කතා කරපු දෙවැනි පිරිසට ඒ කියන්නේ high grade lesion තියෙන කාන්තාවන්ට තවදුර ප්‍රතිකාර අවශ්‍යයි. එහෙම අයව අපි කොල්පොස් කොපි colposcopy කියල වෙනත් පරීක්ෂණයකට යොමු කරනවා. ඒකෙදි වෙන්නේ ගැබ්ගෙලේ අසාමාන්‍යතා තියෙන තැන් විශාල කර හඳුනාගෙන එම ස්ථානවලින් පටක සාම්පල අරගෙන පරීක්ෂාකරන එක එවලෙම ප්‍රතිකාර කරන්නත් පුළුවන් ඒ ප්‍රතිඵල අනුව පිලිකා තත්ත්වයකට වර්ධනය වෙන්න කළින් ගැබ්ගෙලේ අසාමාන්‍ය කොටස ඉවත් කිරීමේ සැත්කමක් වුණත් කරගන්න පුළුවන්. ඒවගේම පවුලේ සම්පූර්ණ කාන්තාවක් නම් හෝ පිලිකා තත්ත්වයක් තියෙන කෙනෙකුට නම් ගැබ්ගෙලයි ගර්භාෂයයි දෙකම ඉවත් කරල ඊට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සහ උපදෙස් දෙනේන අපි කටයුතු කරනවා.

කොහොමද මේ කොල්පොස්කොපි පරීක්ෂණය කරන්නේ?

එතැනදි අපි මුලින්ම කරන්නෙ speculum කියන වෛද්‍ය උපාංගය අදාළ කාන්තාවගේ යෝනි මාර්ගයට ඇතුල් කරලා බුරුසුවක ආධාරයෙන් පිරිසිදු කරන එක. ඊටපස්සෙ තමයි පටක සාම්පල අරගෙන අන්වීක්ෂයක් මාර්ගයෙන් පරීක්ෂාවට ලක් කරන්නෙ.

අවසාන වශයෙන් කාන්තාවන්ට ගැබ්ගෙල පිළිකාවෙන් ආරක්ෂා වෙලා ඉන්න පුළුවන් විදිය ගැනත් පැහැදිලි කරමුද?

මෙහෙමයි. අපි කලිනුත් කිව්වනේ මේ වෛරසය කාන්තාවන්ට ලිංගිකව සම්ප්‍රේෂණය වෙන එකක් කියලා. ඒ නිසා කාන්තාවන්ට සහ ගැහැනු දරුවන්ට ලිංගිකව සක්‍රීය වෙන්න ප්‍රථමයෙන් HPV වෛරසයට එරෙහිව ක්‍රියාත්මක වෙන එන්නතක් අපි ලබා දෙනවා. ඒක අපේ රටේ ක්‍රියාත්මක කරන්න පටන්ගත්තා මෑතකදි. අපි අර කලින් කියපු විදියට ඕනෑම කාන්තාවකට සුව නාරී සායනවලට සහභාගී වීමෙනුත්, ප්‍රසව හා නාරිවේද සායනවලට සහභාගී වීමෙනුත් මේ ගැන තොරතුරු දැනගැනීමේ හැකියාව තියෙනවා. ඒ විතරක් නෙවෙයි ලිංගිකව සක්‍රීය නැති කාන්තාවන්ට වුණත් අවශ්‍ය නම් ඒ එන්නත ලබාගන්න පුළුවන්. ඒ ඇරුනම උපත් පාලන කොපු භාවිතයත් ගැබ්ගෙල පිළිකාවෙන් ආරක්ෂා වෙන්න තියෙන ඉතාමත් හොඳ පිළියමක්. ඒකෙන් HPV වෛරසය විතරක් නෙවෙයි ලිංගිකව සම්ප්‍රේෂණය වෙන වෙනත් වෛරස්වලිනුත් වැළකිලා ඉන්න පුළුවන්. ඊළඟට දුම් පානය කරන කාන්තාවන්ටත් ඒවගෙන් වළකින්න පුළුවන් නම් මේ ගැබ්ගෙල පිළිකාවෙන් ආරක්ෂා වෙන්න පුළුවන්.

■ ලිහිණි මධුෂිකා

කලින් දැනුම් නොදී ආයේ ඉස්කෝලේ පැත්ත පළාතෙ එන්න එපා කියලා එදා ප්‍රින්සිපල් කිව්වා

‘ලන්දු’ සින්දුව කියූ D-TAP අයියලා ආයෙත් ඇවිල්ලා

D-TAP
තරිඳු රොෂාන් | දයාන් අරවින්ද

කොච්චර වයසට ගියත් අපි සමහර නොස්ටැල්ජි නැත්තම් අතීත සුවඳ එක්ක පරණ මතකවලට හිතින් දුවන වෙලාවල් අනන්තයි. මේ ලිපිය ලියැවෙන්නෙත් මේ ළඟදි ෆේස්බුක් එකේ අතරමං වෙලා ඉද්දි දැකපු පෝස්ට් එකක් නිසා දැනුණු එහෙම හැඟීමක ප්‍රතිඵලයක් විදියට.

"අපි පොඩි කාලේ මගේ ආදර ලන්දු සිංදුව අහන්න රස රිසි ගී ඉවර වෙනකල්ම ඉන්න ඕනේ. ඒකට දැන් ඉන්න අයට, ඕන වෙලාවක ඕන සිංදුවක් අහන්න පුළුවන්."

ඒ පෝස්ට් එක දැකපුවාමයි අර කියාපු නොස්ටැල්ජියාව දැනුණේ. ඔය කියන කාලේ අපි පොඩියි. අර අසූවේ අනූවේ සෙට් එක කියන්නේ. ඒ කාලේ ටෙලිවිෂන් එකෙන් නැත්තම් රේඩියෝ එකෙන් අහපු දැකපු දෙයක් ඇර ස්මාර්ට් ෆෝන්, සෝශල් මීඩියා කියලා ගැජට් අපිට තිබුණේ නෑ. හැබැයි ඒ කාලේ ලස්සන සිංදු සෙට් එකක් තිබුණා. ඒවා අහන්න ලැබුණොත් ටීවී එකේ යන චාර්ට් ශෝ වලින් විතරයි. අපි ඉතින් ඕව බලන්න සතිඅන්තේ එනකල් පෙරුම් පුරනවා. ඒ සිංදු පොත්වල ලියලා තියාගන්නවා. ඉන්ටර්වල් එකේදි ඉස්කෝලේ යාළුවෝ එක්ක එකතු වෙලා ඒ සිංදු කියපු හැටිත් තාම මතකයි. ෆෝන් නැති කාලේ කට්ටියට පෙම් හසුන්වල ලියලා දුන්නෙත් ඔය සිංදු.

අර පෝස්ට් එකේ තිබුණු ‘මගේ ආදර ලන්දු... ඇයි ඔය නෙතු අග කඳුළු’ කියන සිංදුවත් ඒ කාලේ කෙල්ලො කොල්ලො පිස්සු වට්ටපු සිංදුවක්. දයාන් අරවින්දයි තරිඳු රොෂානුයි තමයි මේ සිංදුවේ අයිතිකාරයෝ. එතකොට මේ දෙන්නත් අවුරුදු දහඅටේ දහනවයේ පොඩි කොල්ලෝ. දැන් ඒ අයත් ලොකු වෙලා වෙනස් වෙලා කියලා දැක්කෙ අර පෝස්ට් එකෙන් ඉස්සරහට හොයාගෙන යද්දියි. ඒ නිසා ඉස්සර මතක ටිකක් ආයේ ආයේ අලුත් කරගන්න අපි ඒ දෙන්නත් එක්කලා ටිකක් කතා කළා. ඉතින් ඒ කතාබහේ සටහන මේ විදියට ලියන්නේ ඒ කාලේ D- TAPලට පිස්සු වැටිලා හිටපු පරපුරේ අය වෙනුවෙන්.

‘ලන්දු’ සිංදුව කියන්නේ දයාන්. ලන්දු සිංදුව ගැන අදටත් අමතක නොවෙන මතක ගොඩාක් තියෙනවා කියලයි කතාබහෙදි ඔහු කිව්වේ.

තරිඳු දයාන්

"පොඩි කාලේ ඉඳලා මට සිංදු කියන්න පුළුවන්. පාසල් විෂයක් විදියටත් මියුසික් කළා. මමයි තරිඳුයි දෙන්නම මාතර රාහුල විද්‍යාලයේ ඉගෙනගත්තේ. ඉස්කෝලේ මියුසික් වැඩවලදිම තමයි මම තරිඳුව අඳුනගත්තේ. පස්සේ අපි එකතු වෙලා එක එක සිංදු මෙලඩි කරන්න ගත්තා.

අපි මුලින්ම කළේ 'Mad Love' කියලා ඉංග්‍රීසි සිංදුවක්. සිංදු හැදුවට ඒවා ලේසියෙන් අප්ලෝඩ් කරන්න දැන් වගේ යූටියුබ් නැහැනේ. ඉතින් සිංදු හදාගෙන ගිහින් චැනල්වලට බාරදෙන්න ඕනේ. අපි දෙන්නම මාතර. ඒ කාලේ දැන් වගේ අධිවේගී මාර්ග නැහැ. මාතර ඉඳලා පැය 4 1/2ක් විතර කට්ට කාලා කොළඹට එනවා. කොළඹ ආවට පස්සේ සිංදු බාරදෙන්න ඕනේ කාටද කියලා දන්නෙත් නැහැ. අපි ඉතින් CD දහයක් විතර ගහගෙන ඇවිල්ලා චැනල් සේරටම බාරදීලා යනවා. ඔහොම දීලා දීලා 'Mad Love' සිංදුව ප්‍රසිද්ධ නාලිකාවක යන්න පටන්ගත්තා. ඊටපස්සේ අපි ‘නෙත් කොනින්’ කියලා තව සිංදුවක් කළා. ඒක නම් දීලා මාස තුනක් විතර යනකන් ප්ලේ වුණේ නැහැ. ඔහොම ඉන්න අතරේ තමයි ‘මගේ ආදර ලන්දූ... ඇයි ඔය නෙතු අග කඳුළු’ පද පේළිය මගේ ඔලුවට ආවේ. ඇත්තම කිව්වොත් ඉස්කෝලෙ යන කාලේ ඇත්තම අත්දැකීමක් නිසා තමයි ඒ සිංදුව ලියැවුණේ. පස්සේ සිංදුව ගැන තරිඳුට කිව්වා. සිංදුව හොඳයි කියලා හිතුණ නිසා පද සම්පූර්ණ කරලා මියුසික් දාලා රෙකෝඩ් කළා. එතකොට අපි ඉස්කෝලෙන් අස්වුණා විතරයි. ඉතින් කොළඹ ඇවිල්ලා සිංදුවක් රෙකෝඩ් කරන්න පුළුවන්කමක් අපිට තිබුණේ නැහැ. ඒ නිසා ගෙවල්වල අයගෙත් උදව් ඇතිව අවශ්‍ය ඉන්ස්ට්‍රුමන්ට් ටික විතරක් අරන් සිංදුව කළා. ලන්දු හැදුවේ 2006දි. රිලීස් කළේ 2007දී. රිලීස් කරන්න කලින් අපි දන්න අයට සිංදුව දුන්නා. ඉතින් ටීවී එකේ යන්නත් කලින්ම සිංදුව මාතර පැත්තේ ප්‍රසිද්ධ වුණා. පස්සේ දන්න නංගි කෙනෙක්වත් එකතු කරගෙන විෂුවල් එකත් කරලා කොළඹ ගිහින් සිංදුව බාරදුන්නා. උදේ දීපු සිංදුව එදා හවසම චාර්ට් ශෝ වල ප්ලේ වුණා. අපිට ඉතින් හරි සතුටුයි.

මිනිස්සු පුදුම විදියට 'ලන්දු' සිංදුවට ආදරේ කරන්න පටන්ගත්තා. ඒත් එක්කම දවසෙන් දෙකෙන් සිංදුව ලංකාව පුරාම හිට් වුණා. ඒකෙන් අපි එකපාර සෑහෙන ජනප්‍රිය වුණා. ටීවී ඉන්ටවීව්වලට, මියුසිකල් ශෝවලට ආරාධනා ලැබුණා."

ලන්දු සිංදුව D-TAPලට වාසනාව ගෙනාපු විදිය ගැන දයාන් කිව්වේ ඔහොමයි.

ඒ ජනප්‍රියත්වය එක්ක ලැබුණු ප්‍රතිචාර කොහොමද?

"ජනප්‍රියත්වය එක්ක අපි ලංකාව පුරාම මියුසිකල් ශෝ වලට ගියා. දවසක් අපි ශෝ එකකට යන්න පාර අයිනට වෙලා ඉද්දි හයියෙන් සද්ද කරගෙන ගෑනු ළමයි ගොඩාරියක් අපිව වට කරගත්තා. එවෙලේ නම් අපිත් හොඳටම බයවුණා. තව පාරක් මරු වැඩක් වුණා. දවසක් ලන්දු සිංදුව යද්දි ටීවී එක යටින් මැරුණු කෙනෙක් වෙනුවෙන් 'නිවන් සුව' පතලා නෝටි එකක් ගිහිල්ලා. අපිට කරදරයක් වෙලා කියලයි කට්ටිය හිතලා තියෙන්නේ. එදා ඉතින් අපිට එකදිගට කෝල් ආවා. ඒකත් මට කවදාවත් අමතක වෙන්නේ නැහැ. විශේෂම දේ මේ සිංදුවට තරුණ, බාල, මහළු හැමෝගෙම ප්‍රතිචාර තිබුණා. අපේ ගෙවල් ගාව අවුරුදු පහක පුංචි පුතෙක් හිටියා. ඒ බබා හැමදම මාව බලන්න එනවා. එයාට නිදාගන්න අනිවාර්යයෙන්ම ලන්දු සිංදුව දන්න ඕනෙලු. නැත්නම් එයා නිදාගන්නෙ නැතිලු. මේ ළඟදි මට නංගි කෙනෙක් මුණගැහුනා. එයා පොඩි කාලේ අම්මා කෑම කවන්නේ ලන්දු ගැන කියලලු. කෑම කෑවොත් ලන්දු දලා දෙනවා කිව්වහම ඒ ළමයා කෑම සේරම කනවලු."

දයාන් ඉස්සර කතා ගැන අපිත් එක්ක කිව්වේ හිනාවෙවී. කාලයක් පේන්න හිටියේ නැති හැබැයි අපිට කවදවත් අමතක වෙන්නේ නැති මේ කලාකරුවෝ එකතු වෙලා ආයෙත් අලුත් වැඩක් පටන් අරන්. මේ පරණ කතා, මතක අලුත් වුණේ ඒ වැඩේ නිසා කියලා අපිට කිව්වේ තරිඳු.

"ඉස්සර සිංදු කිව්ව කට්ටිය දැන් ආයෙත් එකතු වෙලා 'අලුත් කලාව' කියලා කොන්සට් එකක් කරනවා. දැනට ඒකේ කොන්සට් පහක් විතර කළා. ඒ හැම එකකටම 6000ත් පන්නලා සෙනඟ හිටියා. මේ කොන්සට් එකට වැඩිපුර එන්නේ අසූවේ අනූවේ සෙට් එක. ඒ කාලේ එයාලට අපිත් එක්ක සම්බන්ධ වෙන්න විදියක් තිබුණේ නැහැනේ. මේ අවස්ථාවත් එක්ක දැන් ඒ ජෙනරේෂන් එකේ අය ආයේ අපිව බලන්න එනවා."

මේ අලුතින් කරන සංගීත ප්‍රසංග බලන්න එන අය වුණත් ගොඩක් වෙලාවට කියන්නේ ඒ කාලේ මතක ගැනලු.

"ලන්දු සිංදුව ලියුම්වල ලියලා දීලා කසාද බැඳපු දෙන්නෙක් ශෝ එකකදි ඇවිල්ලා අපිට කතා කළා. සිංදු නිසා ක්‍රෂ් වුණු අය, යාළුවුණු අය ඕනතරම් ඉන්නවලු. ඒ කාලේ දයාන්ට ගෑනු ළමයි මාර කැමතියි. දයාන් නිසාම දයාන්ගේ හැඩරුව තියෙන අය එක්ක යාළුවුණු ගෑනු ළමයිත් ඉන්නවා. මේ මෑතකදිම තිබුණු කොන්සට් එකේදි අපිට ගොඩක් ප්‍රසිද්ධ කෙනෙක්ව මුණගැහුනා. එයාගේ වයිෆුත් ඒ කාලේ දයාන්ට කැමැත්තෙන් ඉඳලා තියෙනවා කියලා එයා අපිත් එක්ක කිව්වේ හිනාවෙවී."

පඳුරකට පයින් ගැහුවොත් විසිවෙන තරමට ගායකයෝ, නළුවෝ ඉන්නවනේ. හැබැයි එහෙම නැති ඒ කාලේ දයාන්ලට තරිඳුට තිබුණ ආදරය, පිළිගැනීම වෙනස් එකක් කියන කතාව ඇත්ත.

"මට හොඳට මතකයි දවසක් දයානුයි මායි අපේ ඉස්කෝලෙට (මාතර රාහුල විද්‍යාලය) ගියා. අපි ඉස්කෝලෙට ගිහින් ටික වෙලාවකින් ඉන්ටවල් දුන්නා. ඔන්න ඒ පාර D-TAP අයියලා ඇවිල්ලා කියලා මුළු ඉස්කෝලෙම ළමයි අපිව වටකරගෙන අපෙන් අත්සන් ගන්න පටන්ගත්තා. ඉන්ටවල් එක ඉවර වුණත් ළමයි ගියේ නැහැ. මහා ගාලගෝට්ටියයි. පස්සේ ප්‍රින්සිපල් ඇවිල්ලා බොහොම අමාරුවෙන් තමයි ළමයි ටික යැව්වේ. කලින් දැනුම් දෙන්නේ නැතිව ආයේ ඉස්කෝලේ පැත්ත පළාතට එන්න එපා කියලත් ප්‍රින්සිපල් එදා අපිට කිව්වා. සමහර ගෑනු ළමයි සල්ලි කොළ අරන් ආවා අපෙන් අත්සන් ගන්න. ඒ කාලේ අපිත් පොඩිනේ. අපිටත් ඉතින් එකපාර ලැබුණු ජනප්‍රියත්වය මැජික් එකක් වගේ."

තරිඳුලට, දයාන්ලට පාරේ බැහැලා යන්න බැරි තරමට 'අන්න D-TAP අයියලා' කිය කිය කට්ටිය පස්සේ එන කාලයක්ලු ඒක. හැබැයි ඒ කාලේ මේ උදව්වියට ආදරේ කළ අයට අදටත් මේ මුහුණු අමතක නැති එකයි වැඩේ.

"දැන් ඉතින් අපි පෙනුමෙන් වෙනස් වෙලානේ. ඒත් පාරේ යද්දි සමහරු අපේ මූණු දිහා බලාගෙන ඉඳලා D-TAP අයියලා නේද අහනවා. ඉස්සර අපේ නම්බර් හොයාගන්න මාර කට්ටක් කෑවා, ඒත් ලැබුණේ නැහැ කියලා සමහරු කියනවා. දුර පළාත්වලට ගියත් එහෙමයි. මේ අය අපේ සිංදුවට අපිට වඩා ආදරෙයි කියලා දැනෙද්දි අපිට මාර සතුටුයි."

ඉස්සර දයාන්ලගේ නම්බර් ඉල්ලගන්න ගෑනු ළමයි රේඩියෝ, ටීවී චැනල්වලට වද දෙනවලු. එහෙම කරලා නම්බර් අරන් කතා කරපු ගෑනු ළමයි නැතිව නෙමේලු.

"ලංකාවේ විතරක් නෙමෙයි වෙන රටවල ඉන්න ගෑනු ළමයිත් ඒ කාලේ කතා කළා. මේ සිංදුව නිසාම අපිට මුණගැහුනු යාළුවෝ, රසිකයෝ පවුල් අය වගේ ආශ්‍රය කරන අය අදටත් අපිත් එක්ක ඉන්නවා. ඒකයි සතුට."

D-TAPලා ළඟදිත් 'හිතට ළංවෙලා' කියලා අලුත් සිංදුවක් රිලීස් කළා. මතක කතා අවසානේ ඒ ගැනත් අපි දයාන්ගෙනුයි තරිඳුගෙනුයි අහලා බැලුවා.

"එකපාරටම ලංකාවට මල් සිංදු කලාවක් ආවනේ. ඒකත් එක්ක අපිටත් ඒ වගේ සිංදු හදන්න කියලා කට්ටිය කියන්න ගත්තා. ඒකත් එක්ක තමයි අපි ටිකක් මියුසික්වලින් අයින් වුණේ. අනික පෞද්ගලික වැඩත් එක්ක ටිකක් කාර්යබහුල වුණා. ළඟදි අපේ අලුත් සිංදුවක් රිලීස් වුණා. කාලෙත් එක්ක දැන් හැමදේම වෙනස් වෙලා. ඉතින් අර ඉස්සර තිබුණු වයිබ් එක ආයේ ඒ විදියටම අපේ රසිකයන්ට දෙන්න පුළුවන් වෙයිද කියලා අපි දන්නේ නැහැ. ඒත් ඉතින් අප්ඩේට් වෙන ගමන් අලුත් දේවල් ටිකක් කරන්න බලාපොරොත්තුවක් තියෙනවා. ඉස්සරහට බලමු."

■ **සෙව්වන්දි හෙට්ටිආරච්චි**

ඡායාරූප - රනුල් වින්දුල


සැප්තැම්බර් 02
සෙනසුරාදා
සවස 3.30 ට
එඩ්වඩ් චන්ද්‍රසිරි රචිත
රසින් සපිරි
මැලේ බොජුන්
RASA NYA PENUH MAKANAN MELAYU
මැලේ කෑම විෂයෙහි ලියවුණු
ප්‍රථම සිංහල ග්‍රන්ථය ජනගත කිරීමේ උළෙල
මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී
මුඛ්‍ය දේශනය දේශබන්දු ආචාර්ය පබිලිස් සිල්වා
ඒ සඳහා ඔබ සැමට ගෞරවනීය ආරාධනා !

අපේ පුංචි දූලා පුතාලාට දැන් පෙරපාසලේ පටන් ශිෂ්‍යත්වය දක්වාම හරිම පිළිවෙළට ඉගෙන ගන්න
මාසික අධ්‍යාපනික පුවත්පත් 6 ක්

ලියාපදිංචි පෙරපාසල් සඳහා විශේෂ වට්ටම්
අගෝස්තු කලාප දැන් වෙළෙඳපොළේ
මෙවර ශිෂ්‍යත්ව අනුමාන ප්‍රශ්න පත්‍ර 6ක් සමග පත්තරයම ප්‍රශ්න පත්තරයක්...
සෑම සෙනසුරාදා දිනකම උදෑසන 8.00 ට FM DERANA KIDS YOUTUBE නාලිකාව ඔස්සේ පැවැත්වෙන සම්මන්ත්‍රණයේදී මෙම ඉලක්ක ප්‍රශ්න පත්‍ර සාකච්ඡා කෙරේ.

දැන්වීම් සඳහා විමසන්න
ශෙහාන් 076 1393811
විශේෂ ඇණවුම් සඳහා විමසන්න 076 2568348
දිවයින පුරා පුවත්පත් නියෝජිතයින්ගෙන්, සරසවි පොත්හල්වලින් සහ අනෙකුත් පොත්හල්වලින් මිලදී ගතහැක

මී හරකෙක් ඉන්න උපන්දින කේක් එකක්

මුලින්ම හැදුවේ මම වෙන්න ඇති

කසුරි වාසනා සමරසිංහ

කසුරි සෑදූ මීහරක් කේක් නිර්මාණය

ඔලාපොරොත්තු කඩවුණු අම්මා කෙනෙක් අවසානයේ සාර්ථක ව්‍යාපාරිකාවක් වෙච්චි හැටියි අද අපි කියන්න යන්නේ. ඇගේ නම තමයි කසුරි වාසනා සමරසිංහ.

ඒ කසුරිගේ පළවැනි පුතා, අභිසෙස් දම්හිරුගේ පළවැනි උපන්දිනේ දවසලු. ඉතින් එදා අහළ පහළ උදවියට එහෙම කියලා ගෙදර පුංචි උපන්දින පාටියක් ගන්නයි කසුරි ලෑස්ති වෙලා ඉඳලා තියෙන්නේ. උපන්දින පාටියක් ගනිද්දි කේක් එකක් කපන්නේ නැතුව කොහොමද? ඒ හින්දා කසුරිත් වේලපහම දන්න කෙනෙකුට ලස්සන කේක් එකක් හදන්න ඕඩර් එකක් දීලා.

"ඒ කේක් එක අරගෙන ආවේ මගේ මහත්තයා. ගෙනැල්ලා හැමෝම ඉස්සරහා කේක් එක කපන්න තිබ්බමයි මං දැක්කේ කියපු විදියට හදලා නෑ කියලා. සෑහෙන්න දුක හිතුණත් කරන්නම දෙයක් නැතිකමට කේක් එක කැපුවා. හැබැයි මං එදා හිතාගත්තා ඊළඟ අවුරුද්දෙ පුතාගේ දෙවැනි උපන්දිනේ දවසට මගේ හිතේ තිබුණු කේක් එක හදන්නේ මමමයි කියලා."

ඒ සිතුවිල්ලෙන් ගමන පටන්ගත්තු කසුරි අද වෙනකොට 'My Birthday' නමින් තමන්ගේම කියලා කේක් ව්‍යාපාරයක් කරගෙන යන සාර්ථක ව්‍යාපාරිකාවක්. ඒ සාර්ථකත්වයේ ගමන ගැන ඇය 'ධරණී'ට කිව්වේ මෙහෙම කතාවක්.

"එදා එහෙම හිතුවට මොකද මං කේක් හදන්න දැනගෙන හිටියේ නෑ. ඒත් උවමනාව තියෙනවා නම් කරන්න බැරි දෙයක් නෑ කියනවනේ. පස්සේ පුතාගේ දෙවැනි උපන්දිනේ දවසේ මං යූටියුබ් එකෙන් බලාගෙන කේක් එකක් ගෙදරදිම හැදුවා. ඒ කේක් එක හොඳටම තිබුණු නිසා මට ආසාවක් ආවේ දිගින් දිගටම කේක් හදන්න ලොකු ආසාවක් ඇතිවුණා."

ඉතින් ඊටපස්සේ ඇය යූටියුබ් එකෙන් බලාගෙන දිගින් දිගටම කේක් හැදුවලු. ඒත් ඒ හැම කේක් එකක්ම 100%ක්ම සාර්ථක වෙලා නෑ. හැබැයි පටන්ගත්තු වැඩක් අතරමඟ නතරකරලා දන්නත් බෑනේ. ඔහොම ඉන්න අතරේ කසුරිට අපූරු කේක් ගුරුවරයෙක් මුණගැහිලා. වැඩේ කියන්නේ ඒ ගුරා ඉඳලා තියෙන්නේ කසුරිගේ ගෙදරමයි.

"මං කේක් හදන්න පටන්ගත්තේ 2016දී. මුලින් වැඩේ ලේසි වුණේ නෑ. හැබැයි මොකක්දෝ වාසනාවකට මගේ හස්බන්ඩ්ට කේක් හදන්න පුළුවන්කම තිබුණා. එයා මට සෑහෙන උදව් කළා. හරියට බැලුවොත් ඔහු තමයි මගේ පළමුවැනි ගුරුවරයා.

උවමනාවෙන් කේක් හැදුවොත් මාසෙට ලක්ෂයකට එහා හොයන්න පුළුවන්

ඒ සහාය එක්ක මං ඉක්මනට කේක් හදන්න ඉගෙනගත්තා. පස්සේ තමයි මේක ව්‍යාපාරයක් විදියට කරගෙන යන්න හිතුවේ."

ඕනම ව්‍යාපාරයක් සාර්ථක වෙන්න බලපාන්නේ ප්‍රචාරණය. කේක් හදන ප්‍රශ්නේ විසඳුනාට පස්සේ කසුරි ඊගාවට හිතුවේ ඒ ගැනලු.

"අපි ඉන්නේ මාලබේ. දන්න දන්න අයට කිව්වත් මුලදි මට එක ඕඩරයක්වත් ආවේ නෑ. ඔය අතරේ ෆේස්බුක් එකේ 'My Birthday' කියලා කේක් පේජ් එකක් පටන් අරන් කේක් ඕඩර් ගන්නවා කියලා මම හදපු කේක් ෆොටෝස් එක්කම දැම්මා. ඔන්න ඒ එක්ක දන්න කියන අයගෙන් මට ඕඩර්ස් එක දෙක එන්න ගත්තා. කේක්වල ප්‍රමිතිය හොඳ නිසා ටික දවසකින් බලාගෙන ඉන්දැද්දි ඕඩර් ගාණ වැඩි වුණා."

ව්‍යාපාරයක් සාර්ථක වෙද්දි බහුතරයක් හිතන්නේ ලාබය ගැන විතරයි. ඒත් අපේ කතා නායිකාව ඊට වඩා වෙනස්. කේක්වලට ඉල්ලුම වැඩිවෙනකොට කේක්වල ගුණාත්මකභාවය වෙනුවෙන් ඒ ගැන යම්කිසි හැදෑරීමක් කරන්න ඕන කියලයි ඇය හිතලා තියෙන්නේ.

"කේක් සම්බන්ධ NVQ Level 4 දක්වා ඉගෙනගත්තා. ඒත් එක්ක කේක් හදන්න තිබුණු ආසාවත් වැඩි වුණා. දවසින් දවස එකකට එකක් වෙනස් විදියට කේක් හදන නිසා හිතටත් සතුටුයි. මේ වෙනකොට මට වෙඩින් කේක්, බර්ත්ඩේ කේක්, අයිසිං මල් ඇතුළු ඕනම වර්ගෙක කේක් හදන්න පුළුවන්."

කේක් ව්‍යාපාර කරගෙන යන තරුණියෝ දැන් ඕනතරම් අපේ රටේ ඉන්නවා. ඒ අතරින් කසුරි වෙනස් වෙන්නේ කොහොමද කියන එකයි ඊළඟට අපි ඇයගෙන් ඇහුවේ.

"කේක් හදන ගොඩාක් අයට කස්ටමර් කියන කේක් එක ඒ විදියටම හදන්න බැහැ. හැබැයි ඒ කේක් එක ඒ විදියටම හදන්න අපිට වගකීමක් තියෙනවා. මොකද මේක සල්ලිවලට කරන ගනුදෙනුවක්නේ. මට නම් හැමවෙලාවෙම බලන්නේ කස්ටමර් ඉල්ලන කේක් එක ඒ විදියටම දීලා ඒ අයව සතුටු කරන්න. මේ ළඟකදි රට ඉන්න මල්ලි කෙනෙක් කිව්වා ලංකාවේ ඉන්න එයාගේ අම්මට උපන්දිනේට ලස්සන කේක් එකක් හදලා ගිහින් දෙන්න කියලා. එදා මං කේක් එක ගිහින් දුන්නම ඒ අම්මට ඇඬුනා. පස්සේ ඒ මල්ලිත් කිව්වා මං ලස්සනටම කේක් එක හදලා තිබුණා කියලා. ඒ සිදුවීම මට කවදාවත් අමතක වෙන්නේ නෑ. තව දවසක් මට අම්මා කෙනෙක් එයාගේ පුතාගේ උපන්දිනේට මී හරකෙක් ඉන්න බර්ත්ඩේ කේක් එකක් හදලා දෙන්න කිව්වා. මට එකපාරට හිනාගියා. පස්සේ තමයි ඒ අම්මා කිව්වේ එයාගේ පුතා මී හරකුන්ට හරිම ආසයි කියලා. මේ සැරෙත් ඒ අම්මා මටමයි ඒ දරුවගේ කේක් එක හදන්න දුන්නේ. එතකොටත් කිව්වා පුළුවන් නම් කේක් එකේ කොහේහරි මී හරකෙක්ව තියලා දෙන්න කියලා. මං හිතන්නේ මී හරකෙක් ඉන්න බර්ත්ඩේ කේක් එකක් ලංකාවේ මුලින්ම හදන්න ඇත්තේ මම වෙන්න ඇති."

ඒ තමයි කසුරිගේ තියෙන අපූරුම හැකියාව. ඇය කියන විදියට කස්ටමර් කෙනෙක් මොන ජාතියේ කේක් එකක් ඉල්ලුවත් නෑ බෑ නොකියා මොන විජ්ජාව දාලා හරි ඒක කියන පිළිවෙලටම හදලා දෙන එකලු දක්ෂකම කියන්නේ. ඉතින් කස්ටමර් කෙනෙක් මොන ජාතියේ කේක් එකක් ඉල්ලුවත් නෑ බෑ නොකියා ඒක කියන පිළිවෙලටම හදලා දෙන්න පුළුවන් එකයි කසුරිගේ දක්ෂකම. කසුරි මේ වෙනකොට 'Petals by K' (Sugar flowers and cake decorating academy) කියලා කේක් සම්බන්ධ ඇකඩමි එකකුත් පටන් අරන්. මුලදි හෙමින් ගමන ආවට මේ වෙද්දි ඇය කේක්වලින්ම ලොකු ගමනක් ඇවිත්. ඉතින් කසුරිගේ කේක් ව්‍යාපාරය තවත් දියුණුවෙන්න සුබපතන ගමන් 'ධරණී' කියවන අපේ කාන්තාවන්ට පුංචි පණිවිඩයක් දෙන්න කියලත් අපි ඇයට කිව්වා.

"කවුරුත් ගෙවල්වලට වෙලා නිකන් ඉන්න එපා. ඔයාලා කේක් හදන්න ඉගෙනගත්තොත් නම් ආයෙත් වෙන රැකියාවක් කරන්න ඕන නෑ. හැබැයි කරන වැඩේ හරියට තිතටම කරන්න. මොකද මනුස්සයෙක් ගොඩක් වෙලාවට කේක් එකක් ගන්නේ එයාලගේ විශේෂම දවසක් වෙනුවෙන්නේ. කේක් එක හරියට නැත්නම් ඒ දවසම ඉවරයි. ඒ නිසා සල්ලි හම්බ කරන්නම බලාගෙන කරන්නන් වාලේ කරන්නේ නැතිව සතුටින් ආසාවෙන් ඒ වැඩේ කරන්න. එහෙම කරන්න පුළුවන් නම් අමාරුවක් නැතිව මාසෙකට ලක්ෂෙකට එහා වුණත් මේකෙන්ම හොයාගන්න පුළුවන්."

■ රුවන් එස්.සෙනවිරත්න

සීතා පොන්නම්පෙරුම
ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා

හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළෙඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.

පාඩම් අංක 84

ලස්සන වුණාට 'නන්දා මාලනී' විකුණන්න බෑ

'වෙසක් කැකුළු අතු අග ඉඳ නටන විලාසේ...
ඉරෙත් හඳෙත් සිරි විඳ විඳ රඟන විලාසේ'

ඉන්ද්‍රාණි සේනාරත්න ගායනා කරපු ඒ කාලේ සිංදුවක්. මේ සිංදුව අදටත් වෙලාවකට අහන්න ලැබුණට සිංදුවේ කියන මල ගැන දැන් කාටත් අමතකයි.

වෙසක් කැකුළු කියන්නේ වෙසක් කාලෙට විතරක් පිපෙන උඩවැඩියා මල් වගේකට. වෙසක් කාලෙදි පිපුණට මොකෝ බක් මාසේ වෙනකල් මේ මල පරවෙන්නේ නැහැ. මේක ලංකාවට ආවේණික දුර්ලභ උඩවැඩියා මලක්. ඉස්සර කැලේ කොළේ මේ මල් ඇතිතරම් තිබුණට දැන් මේ මල එහෙමට හොයාගන්න බැරිතරම් දුලබ එකයි දුක.

ඕකිඩ් කියන්නේ අවුරුදු මිලියන ගාණකට කලින් ඉඳලා ලෝකේ තිබුණු මලක් කියලයි විද්‍යාඥයෝ කියන්නේ. හැබැයි ගෙවතු අලංකාරෙට මුලින්ම ඕකිඩ් වවලා තියෙන්නේ චීන්නුලු. ලෝකේ පුරාම ආසන්න වශයෙන් ඕකිඩ් වර්ග 28,000ක් විතර තියෙනවා. ඔය අතරේ ලංකාවට ආවේණික මල් වර්ග 64ක් විතර තියෙන එක ආඩම්බරයක්. අවුරුද්ද ගාණේ අලුත් ඕකිඩ් ප්‍රභේද හොයාගන්නවා. පේරාදෙණිය මල්වත්ත පැත්තේ ගියාම බලන්න පුළුවන් ඒ අලුත් අලුත් වර්ග. සමපෙට වැඩක් කරාපු වටින මිනිස්සුන්ගේ නම්වලින් අලුතින් හොයාගන්න උඩවැඩියා මල්වලට නම තියෙනවා. 1860-1863 ලංකාවේ හිටපු මැකාර්ති ආණ්ඩුකාරවරයාගේ බිරිඳව මතක් වෙන්න ඩෙන්ඩ්‍රෝබියම් මැකාති කියලා නම් කළ උඩවැඩියාවක් තියෙනවා. තව එතකොට විශාරද නන්ද මාලනිය මතක් වෙන්න 'නන්ද මාලනී ඇස්කොසෙන්ටා' කියලා මලකුත් තියෙනවා.

ඔය වගේ ලංකාවට විතරක් ආවේණික උඩවැඩියා වර්ග ගෙවල්වල වවන්නේ නැහැ. ඒකටම කියාපු මල් සෙට් එකක් වෙනමම තියෙනවා. ඕකිඩ් වගා කරලා ජීවිතේම ගොඩදගත්තු ව්‍යාපාරිකයෝ කොච්චර නම් අපේ රටේ ඉන්නවද. ආන්න ඒ ගොන්නට එකතු වෙන්න පුළුවන් විදියක් ගැනයි දැන් අපි කියලා දෙන්නේ.

සාර්ථක ඕකිඩ් වගාවක් කළොත් එච්චගේ පැළ වගේම මලුත් අලෙවි කරන්න පුළුවන්. ඕකිඩ්වලට විදෙස් රටවලිනුත් හොඳ ඉල්ලුමක් තියෙනවා. ඒ නිසා හරියට හදගත්තොත් ඕකිඩ්වලින් ගොඩ යන්න අමාරු නැහැ.

මුලින්ම කියන්න ඕනේ ඕකිඩ් කියන්නේ විශාල පරාසයකට පැතිරුණු කතාබහක්. වාණිජ වගාවක් කරන්න කැමති කෙනෙක්ට පහසුවෙන් වැටහෙන පොදු කාරණාවලින් තමයි මේ ලිපිය ලියැවෙන්නේ. ස්වයං රැකියාවක් විදියට ඕකිඩ් වවන්න කැමති නම් මුලින්ම පැළ කිහිපයක් වවලා බලන්න. අද වෙනකොට ඕකිඩ් පැළ අලෙවි කරන උදව්ය ඕනතරම් ඉන්නවා. මේ වගේ තැනකින් නැත්නම් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ඕකිඩ් පැළ මිලදී ගන්න පුළුවන්.

අර මුලදිත් කිව්වා වගේ හැම උඩවැඩියා වර්ගයක්ම ගෙවතු අලංකාරෙට ගන්නේ නැහැ. ගෘහාශ්‍රිත වගේම වාණිජ වගාවෙදිත් අපිට ගන්න පුළුවන් මල් වර්ග කිහිපයක් තියෙනවා.

- ඩෙන්ඩ්‍රෝබියම් (Dendrobium)
- පැලනොප්සිස් (Phalaenopsis)
- කැට්ලියා (Cattleya)
- මොකාරා (Mokara)
- ඔන්සිඩියම් (Oncidium)
- ටොලුමිනියා (Tolumnia)

ඕකිඩ් මල්වල මුල් පද්ධතියට හොඳට වාතය ඕනේ. ඕකිඩ් මල්වලට පස් දන්නේ නැතිව මාධ්‍යයේ හිස් අවකාශයක් තියන්නේ එකයි.

ඕකිඩ්වලට අව්ව, වැස්ස, සුළඟ ඔය හැමදේම ඕනේ. සෙවන තියෙන තැනක් නැත්නම් 50%ක් සූර්යාලෝකය ලැබෙන නෙට් එකක් අරගෙන ලී දෙකක පටලලා ආවරණයක් හදගන්න.

වගා බඳුන්

සිමෙන්ති, මැටි, ප්ලාස්ටික් බඳුන් උඩවැඩියා හිටවන්න යොදගන්න පුළුවන්. වියළි කාලගුණයක් තියෙන පැත්තක් නම් සිමෙන්ති සහ මැටි භාජන හොඳයි. මොකද ඒවගේ වතුර රැඳිලා හිටිනවනේ. නිතරම වහින පැත්තක් නම් ප්ලාස්ටික් භාජන ගන්න. එහෙම ගන්න ඕනම බඳුනක සිදුරු තියෙන්න ඕනේ කියන එකත් අමතක කරන්න එපා.

වගා මාධ්‍ය

ඕකිඩ් වගා මාධ්‍ය විදියට පොල් ලෙලි චිප්ස්, චිප්ල් ගල්, අඟුරු කැට, උළු කැට වගේ දේවල් යොදගන්න පුළුවන්. පොල් ගෙඩි චිප්ස් ගන්නවා නම් පොල් ගෙඩියක ලෙලි අඟල් 1/2, අඟල් 3/4 කෑලි වලට කපලා දවසක් වතුරේ තියලා අරගන්න. නිතරම වහින පැත්තක් නම් වගා මාධ්‍යට පොල් ලෙලි අඩුවෙන් දාන්න. නැත්නම් වතුර රැඳෙනවා. වැස්ස අඩු නම් පොල් ලෙලි වැඩි කරන්න. වගා මාධ්‍යට මේ හැම වර්ගයම දාන්න ඕනේ නැහැ. මේවගෙන් දෙක තුනක් 1:1 අනුපාතෙට දැම්මහම ඇති. උදහරණයක් විදියට පොල් ලෙලි +උළුකැට, පොල්ලෙලි+අඟුරු, පොල් ලෙලි +අඟුරු+උළුකැට. කැමති නම් වගා මාධ්‍ය විදියට කොහුබත්, චිප් ගල් (1:3) අනුපාතය ගන්නත් පුළුවන්. හැබැයි එහෙම ගන්නවා නම් සෘජුවම වැහිවතුර වැටෙන්න නොදී පොලිතීන් ආවරණයකින් වහන්න ඕනේ.

ඕකිඩ් පැළයක් හරියට හිටවගමු

අඟල් 6ක් වැඩුණු නිරෝගී ඕකිඩ් පැළයක් අරගෙන ඒකේ තියෙන මැරුණු මුල් ටික කපලා දාන්න. අඟල් 6ක් උස පැළයකට අඟල් 5ක් විෂ්කම්භය තියෙන වගා බඳුනක් අවශ්‍ය වෙනවා. පැළය හිටවන්න කලින් බඳුන් ජීවානුහරණය කරලා ගන්න. බඳුන්වල වගේම ශාබයේත් දිලීර නාශනය කරන්න ඕනේ. කැප්ටාන් (Captan) වගේ දිලීර නාශකයක් පාවිච්චි කරන්න. ඒකට කරන්න තියෙන්නේ කැප්ටාන් ද්‍රාවණයක පැළය විනාඩි 3ක් ගිල්වලා තියලා ගන්න එකයි.

පැලනොප්සිස්, කැට්ලියා, මොකාරා, ඔන්සිඩියම්, ටොලුමිනියා මේ විදියට පැළ කරන්න

මුලින්ම ගහේ මුල පොල්ලෙලි කෑල්ලක ඔතාගන්න. බඳුන පතුලට අඟුරු දගන්න. ඊටපස්සේ පොල්ලෙලි ඔතාගන්න ගහ තියලා වටේට අඟුරු පුරවන්න. පස්සේ ආයෙත් කැප්ටාන් ටිකක් ස්ප්‍රේ කරන්න. දවස් 21ක් විතර යනකොට අඟුරුවලට මුල් අදිනවා.

හැබැයි ඩෙන්ඩ්‍රෝබියම් පැළ කරන්නේ වෙන විදියකට

ඩෙන්ඩ්‍රෝබියම් පැළ කරද්දිත් දිලීරනාශක දියරයක විනාඩි 2/3ක් දාලා තියන්න. පස්සේ භාජනයකට අඟුරුඋළුකැට (1:1) පුරවලා ගහ හිටවන්න.

පොහොරයි වතුරයි හරියට දගන්න. ඕකිඩ් හිටෙව්වා වගේ නෙමේ ඇහැක් වගේ ආදරෙන් බලාගත්තේ නැත්නම් සේරම හබක්. ඕකිඩ්වලට පොහොරයි වතුරයි දන එක කාලසටහනයකට අනුව වෙන්න ඕනා වැඩක්.



සාමාන්‍ය කාලගුණයක් තියෙනවා නම් දවසට එකපාරක් වතුර දන්න

වියළි කාලගුණේට දවසට දෙපාරක් දන්න ඕනේ.

වතුර දනකොට උදේ 8ට කලින් නැත්නම් හවස 3ට කලින් වතුර දන්න ඕනේ.

සති දෙකක් යනකල් දවස් දෙකකට පාරක් පොහොර දන්න ඕනේ. ඊටපස්සේ අවධි අනුව පොහොර දන කාලය වෙනස් වෙනවා. පොහොර දියර බෝතලේකින් ස්ප්‍රේ කරන එකයි වැඩිය හොඳ.

මූලික අවධියේදී නයිට්‍රජන් පොහොර දන්න. ඒ වගේම මල් හටගන්න ආසන්න කාලෙදියි මල් හටගන්න කාලෙදියි පොස්පරස් පොහොර දන්න.

ඕකිඩ්වල පුටිකා විවර වෙන්නේ උදේ 4ට. එවෙලෙට පොහොර දන්න පුළුවන් නම් ගොඩක් හොඳයි. ඒ නැතත් උදේ 8 වෙන්න කලින් පොහොර ටික දගන්න ඕනේ.

පැළ කාලෙදි වගේම මල් පිපුණට පස්සෙත් පැළ අලෙවි කරන්න පුළුවන්. ශාබ ප්‍රභේද අනුව මල්වල මිල ගණන් වෙනස් වෙන්න පුළුවන්. උදාහරණයක් විදියට මල් සහිත ටොලුමිනියා පැළයක් දැන් වෙළෙඳපොළේ අලෙවි වෙන්නේ රුපියල් 9500. ඩෙන්ඩ්‍රෝබියම් මල් සහිත පැළයක් රුපියල් 750. කුඩා පැළයක් 150යි.

උඩවැඩියා වගාව ගැන තවත් විස්තර දැනගන්න අවශ්‍ය නම් 0714766819 අංකයට කතා කරන්න.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

ඒ වීඩියෝ එක බලලා බීම නතර කරපු මහත්වරු මට කතා කළා

ටික්ටොක් දොස්තර නෝනා වෛද්‍ය ප්‍රියා සම්මානි

'Giggle Doctors' කියන්නේ ලෝකයේ ජනප්‍රිය වෛද්‍යවරු කණ්ඩායමක්. ඔවුන් ඒ විදියට ජනප්‍රිය වුණේ හරි අපූරු වැඩකට අතගහපු හින්දා. වැඩේ තමයි ආබාධිත සහ අසාධ්‍ය මට්ටමේ ඉන්න රෝගී දරුවන්ට මානසික සුවය ගෙනැත් දීපු එක. ඔවුන් ඒක කළේ හරි අපූරු ක්‍රමයකට. ඒ දරුවන් ආස කරන විදියේ චරිත වෙස්වලාගෙන රෝහල්වල ඉන්න දරුවන් ඉදිරියට ඇවිත් ඔවුන්ව සතුටු කරලා. ඒ හරහා දරුවන්ට ඔවුන් ඉන්න තත්ත්වය අමතක කරන එකයි වෛද්‍ය කණ්ඩායමේ ලොකුම අරමුණ වුණේ. ඒ හින්දම 'Giggle Doctors' පටන්ගත්තු ඒ වැඩේට ලෝකයෙන්ම පැසසුම් ලැබුණා.

'Giggle Doctors' වෛද්‍ය කණ්ඩායම දරුවෝ ගැන හිතලා ඒ වගේ වැඩකට අතගහද්දි ලංකාවේ මිනිස්සුන්ගේ ජීවිත රැකගන්න ටික්ටොක් කරන අපේ රටේ වෛද්‍යවරියක් ගැනත් අපිට පසුගියදා අහන්න ලැබුණා. ටික්ටොක් එකට ගිහින් බලද්දි වැඩේ ඇත්ත. ඉතින් ගොඩාක් අය නටන කරන ටික්ටොක් ඇප් එක අස්සේ ජීවිත රැකගන්න 'ටික්ටොක්' (TikTok) කරන මේ අපූරු වෛද්‍යවරියට අපි කතා කළා. ඒ විතරක් නෙවෙයි මෙවර 'ධරණී' මුල් පිටුව ඇගේ රුවින් සරසන්නත් අපි තීරණය කළා. ඇය වෛද්‍ය ප්‍රියා සම්මානි.

"අපේ රටේ ඉන්න මිනිස්සු ගැන හිතලා ටික්ටොක් එකෙන් මට මේ වගේ දෙයක් කරන්න යෝජනා කළේ මගේ සැමියා පුලස්ති සේනාරත්න. එයත් මං වගේම වෛද්‍යවරයෙක්. එයාට කාලෙක ඉඳන් අදහසක් තිබිලා මිනිස්සුන්ට බෙහෙත් දෙන එකට එහා දෙයක් කරන්න ඕන කියලා. එහෙම හිතලා තමයි මට මේ යෝජනාව කළේ. අපේ අරමුණ තමයි ලෙඩකදි බෙහෙත් දෙනවට වඩා ලෙඩේ හැදෙන්න කලින් ඒ ලෙඩේ නොහැදෙන තැනට මිනිස්සු දැනුවත් කරන එක. මං හිතනවා මේ වෙනකොටත් අපේ වැඩේ 100%ක්ම සාර්ථකයි කියලා."

හැමෝම නටන කරන ටික්ටොක් එක මිනිස්සුන්ට වැදගත් තැනක් කරපු වෛද්‍ය සම්මානි කතාබහට මුලපිරුවේ එහෙම. ඇය කියපු විදියට ඇයව මේ වැඩේට උනන්දු කරවලා තියෙන්නේ සැමියා පුලස්ති වුණාට දැන් ටික්ටොක් එකේ වැඩේ ලස්සනට ඇදගෙන යන්නේ සම්මානි. ඇය ඒක කොච්චර හොඳට කරගෙන යනවද කිව්වොත් මිනිස්සුන්ට නීරස සෞඛ්‍ය කාරණා පවා ඇය හරිම ආකර්ෂණීය විදියට ඉදිරිපත් කරනවා.

"ඇත්තම කතාව මිනිස්සු වැඩිය සෞඛ්‍ය කාරණා ගැන අහන්න බලන්න එච්චර ආස නෑනේ. උනන්දුත් නෑ. උදාහරණයක් විදියට ටීවී එකේ දියවැඩියාව ගැන මොකක් හරි වැඩසටහන් යනවා කියලා හිතන්නකෝ. ඒ වෙලාවට හුඟාක් අය කරන්නේ ඉක්මණට චැනල් එක මාරු කරන එකනේ. නැත්නම් ටිවී එක වහලා දනවා. ගොඩක් වෙලාවට ඒක බැලුවොත් බලන්නේ දියවැඩියාව තියෙන කෙනෙක් විතරයි. ඒත් මං මිනිස්සු ආකර්ෂණය වෙන විදියට ඒක හරිම සරලව ඉදිරිපත් කරන්න හැම වීඩියෝ එකෙන්ම උත්සාහ කරනවා. ඒක හින්ද මිනිස්සුන්ට නීරස සෞඛ්‍ය කරුණු කාරණා පවා මට හරිම ලේසියෙන් මිනිස්සුන්ගේ ඔලුවලට දන්න පුළුවන් වෙලා තියෙනවා."

මේ වෙනකොට @drpiyasammani නමින් කරගෙන යන සම්මානිගේ ටික්ටොක් ගිණුම එක්ක එකතුවෙලා ඉන්න පිරිස එක් ලක්ෂ හතළිස් දහස් ගණනක්. ඒත් එක්කයි අපි අහලා බැලුවේ මේ වැඩේ වෙනුවෙන් ටික්ටොක් ඇප් එකම භාවිතා කරන්න හේතුව.

"දැන් ගොඩාක් අය ස්මාර්ට් ෆෝන් එක්ක ඉන්නේ. පොඩි විවේකයක් ලැබුණු ගමන් ෆෝන් එක අතේ. ඒත් එක්ක අපි දැක්කා දැන් ගොඩාක් අය ටික්ටොක් ඇප් එකත් භාවිතා කරනවා. ඒ එක්ක මමයි සැමියයි දෙන්නම හිතුවා මේ වැඩේට හරියන්නේ ටික්ටොක් ඇප් එකමයි කියලා."

හැබැයි ඉතින් අද ටික්ටොක් එකට ගියොත් තියෙන්නේම ජනප්‍රිය සිංදු කෑල්ලකට කවුරු හරි කෙනෙක් නටන වීඩියෝනේ. මිනිස්සු බලන්න කැමතිත් ඒ ජාතියේ වීඩියෝනේ. ඉතින් සෞඛ්‍ය ගැටලු වගේ මිනිස්සු ලොකු අවධානයක් යොමු නොකරන තාලේ වීඩියෝස් හදලා මේ විදියට අසීමිත ආකර්ෂණයක් ලබාගත්තේ කොහොමද කියලයි අපි ඊළඟට අහලා බැලුවේ.

"මුලදි නම් හීනෙකින්වත් හිතුවේ නෑ මෙඩිකල් කන්ටෙන්ට් වීඩියෝ කරලා ටික්ටොක් එකේ මෙච්චර හරියක් කරන්න පුළුවන් වෙයි කියලා. ඒත් අපි නිතරම හිතුවා කරන වීඩියෝ බරසාර නැතුව සරලව කරන්න. උදාහරණයක් විදියට බස් එකක යද්දි අපට වමනේ යන්නේ ඇයි, උදේට හිසරදය හැදෙන්නේ ඇයි වගේ සරල දේවල්. වැඩේ කියන්නේ පළවැනි වීඩියෝ එකේ ඉඳන්ම මිනිස්සු ඒ එක්ක එකතුවුණා. පස්සේ අපි හිතුවා මේක සැලසුමක් එක්ක කළොත් ලොකු දෙයක් කරන්න පුළුවන් වෙයි කියලා."

ඇත්තටම ඇය ටික්ටොක් එකට මුදාහැරලා තියෙන සමහර වීඩියෝස් මේ වෙනකොට මිලියන ගණනින් නරඹලයි තියෙන්නේ. ඒ අතරින් බොහෝ පිරිසක් මත්පැන් භාවිතය ගැන තිබුණු වීඩියෝව නරඹලා තියෙන හැටි අපි දැක්කා.

"ඒ වීඩියෝ එකේ මං කෙළින්ම කියලා දැම්මේ නෑ මත්පැන් බොන්න එපා කියලා. එහෙම කිව්වා නම් ඒක බලන එකක් නෑ කියලා හිතුණා. පස්සේ ටිකක් වෙනස් විදියට ඒක කළා. හෙඩින් එකට දැම්මේ ස්මාර්ට් විදියට බොන්නේ කොහොමද කියලා. වීඩියෝ එක පටන්ගන්නකොට හැමෝම වගේ හිතුවේ ඒ වීඩියෝවෙන් කියන්නේ මං මත්පැන් බොන්න ඕන කොහොමද කියලා උපදෙස් දෙනවා කියලා. ඒත් අන්තිමට තමයි පැහැදිලි වෙන්නේ මං කියන්නේ බොන්න එපා කියන එක කියලා. මං ඒක මෙහෙම කියනවටත් වඩා වීඩියෝ එක බැලුවම තේරෙයි."

ඊළඟට අපි වෛද්‍ය සම්මානිගෙන් ඇහුවේ ටික්ටොක් වීඩියෝ බලන අය අතරින් ලැබුණු විශේෂ ප්‍රතිචාර එහෙම තියෙනවද කියලා. ඒකට ඇය දුන්නේ මේ වගේ උත්තරයක්.

"වැඩිය ඕන නෑ ඒ මත්පැන් භාවිතය ගැන කරපු ටික්ටොක් එක ගැනම මං කියන්නම්කෝ. ඒක ගොඩාක් බලලා තිබුණේ මත්පැන් පාවිච්චි කරන අය. ඒකට ලැබිලා තිබුණු ප්‍රතිචාර එක්ක තමයි මට ඒක පැහැදිලි වුණේ. ඒක බලපු ගොඩාක් අය බොන එක අපි අඩුකළා, බොන එක නවත්තලා දැම්මා කියලා මැසේජ් එවලා තිබුණා. ඒකෙන්ම මට තේරුණා වැඩේ හිතුවටත් වඩා සාර්ථක වෙලා කියලා. ඒ වගේම සමහර වීඩියෝ නිසා සියදිවි නසාගන්න හිටපු අයත් ඒ තීරණය වෙනස් කරගෙන මට කතා කරලා තියෙනවා."

පුංචි ටික්ටොක් වීඩියෝ එකකට මනුස්සයෙක්

පාරේතොටේදී සමහරු මාව දැකලා අඳුරගන්නවා. ඒ වෙලාවට එයාලම අහනවා ඔයා නේද අර ටික්ටොක් කරන දොස්තර නෝනා කියලා

බොන එක නවත්තන්න පුළුවන් නම්, ජීවිතයක් මරණයෙන් බේරගන්න පුළුවන් නම් ඒ වීඩියෝ එකට පෙනී හිටපු පුද්ගලයට කොයිතරම් සතුටක්ද? සම්මානිගේ මූණෙන් විතරක් නෙවෙයි ඇගේ වචනවලත් ඒ සතුට අපි දැක්කා.

"මං ආවට ගියාට ටික්ටොක් වීඩියෝස් කරන්නේ නෑ. හොඳට සූදානම් වෙලා කරන්නේ. මුලින්ම කරන්නේ කාලීන සෞඛ්‍ය ගැටලුවක් හරි රෝගයක් හරි ගැන සමාජ මාධ්‍ය හරහා ප්‍රශ්නයක් අහන එක. එතකොට ඒකට මිනිස්සු විවිධ අදහස් යොමුකරනවනේ. ඒකෙන් අපිට පැහැදිලියි ඒ ගැන මිනිස්සුන්ගේ තියෙන දැනුවත්භාවය. ඒ එක්ක අපි පිටපතක් ලියනවා. කාටත් තේරෙන විදියට හරිම සරල විදියට තමයි ඒක ලියන්නේ. අන්න ඊටපස්සෙයි වීඩියෝ එක කරන්නේ. කිසිම දෙයක් කරන්නන් වාලේ හෝ දුවන ගමන් කරන්නේ නෑ."

වෛද්‍ය සම්මානි එහෙම කිව්වේ බෙල්ලේ තිබුණු වෙද නලාව අතටගන්න ගමන්. වෛද්‍යවරියක් විදියට ටික්ටොක් කරන එක වෘත්තීය ජීවිතයට ප්‍රශ්නයක් නැද්ද කියලා සම්මානිගෙන් අහලා බලන්න හිතුණේ ඔය අතරේ. ඇයි ඉතින් අපේ රටේ තරුණ තරුණියෝ ඇරුනම නෝනලා මහත්තුරු අවතක්සේරු කරන ඇප් එකක්නේ ටික්ටොක්.

"ඒක මිනිස්සු හදාගත්ත දෙයක්. අපේ රටේ එහෙම වුණාට පිටරටවල එහෙම ඒක හරිම සාමාන්‍යයි. උදාහරණයක් විදියට සිංගප්පූරුව, පිලිපීනය වගේ රටවල වෛද්‍යවරු, ඉංජිනේරුවෝ වගේම ගුරුවරු, නීතිඥවරු, මහාචාර්යවරු පවා එයාලගේ වෘත්තියට අදාළව ටික්ටොක් වීඩියෝස් කරනවා. අනික ටික්ටොක් වීඩියෝස්වල මං වෛද්‍ය වෘත්තියට නොගැළපෙන කිසිම දෙයක් කරන්නේ නෑනේ. මං කරන්නේ මිනිස්සු දැනුවත් කරන එක. කවුරුහරි මං ටික්ටොක් කරන එකෙන් වෛද්‍ය වෘත්තිය හෑල්ලු වෙනවා කිව්වත් මට ප්‍රශ්නයක් නෑ. ඒත් මගේ ටික්ටොක් එකක් බලලා එක මනුස්සයෙක් හරි නීරෝගී වෙනවා නම් ඒක තමයි මගේ සතුට."

ටික්ටොක් එකේ ඉහළ පහළ යද්දි සම්මානි පෙනිලා පෙනිලම දැන් ඇය මිනිස්සු අතරේ හරි ප්‍රසිද්ධ චරිතයක් වෙලානේ. ඒ එක්ක පාරේතොටේ යද්දි ඇයට ලැබෙන ප්‍රතිචාර ගැනත් නිකමට වගේ අපි අහල බැලුවා.

"පාරේතොටේදි සමහරු මාව දැකලා අඳුරගන්නවා. ඒ වෙලාවට එයාලම අහනවා ඔයා නේද අර ටික්ටොක් කරන දොස්තර නෝනා කියලා."

දැන් විවාහවෙලා කොළඹ, පාදුක්කේ හිටියට සම්මානිගේ උපන් ගම් පළාත බණ්ඩාරවෙලලු. බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබපු ඇය උසස්පෙළ සමත්වෙලා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට ඇවිත්. එතැනින් රෝහල් කීපයකම පුහුණු වෛද්‍යවරියක් විදිහට ඉඳපු සම්මානි මේ වෙනකොට රජයේ රෝහලක වෛද්‍යවරියක්.

"මගේ පවුලේ ඉන්නේ අම්මයි, තාත්තයි, අයියයි. මට පුංචි කාලේ නම් තිබුණේ ගුවන් සේවිකාවක් වෙන හීනයක්. ඒත් මගේ අම්මා දියතලාව මහරෝහලේ පරිපාලන අංශයේ සේවය කළා. අයියත් වෛද්‍යවරයෙක්. ඒ එක්ක මටත් හිතුණා වෛද්‍යවරයෙක් වෙන්න."

මේ වෙනකොට සම්මානි ටික්ටොක් විතරක් නෙවෙයි 'Dr. Priya's Health Tips' කියන ෆේස්බුක් පේජ් එක හරහා වගේම යූටියුබ් නාලිකාව හරහාත් සෞඛ්‍ය ගැටලු ගැන වැඩසටහන් කරන්න පටන් අරන්. ඒත් මොනවා කළත් ඇය අදටත් ප්‍රසිද්ධ ටික්ටොක් වීඩියෝස් කරන ලස්සන දොස්තර නෝනා විදියට. ඉතින් බෙහෙත්වලට බැරි දේවලුත් ටික්ටොක් ඇතුළු සමාජ මාධ්‍යවලින් කරන මේ සම්මානි දොස්තර නෝනාව මේ විදියටවත් අගය නොකර කොහොමද?

"ටික්ටොක් ගැන සමාජයේ තියෙන්නේ එච්චර හොඳ ආකල්පයක් නෙවෙයි. ඒත් ඒ හරහා සමාජයට වැදගත් කියන ගොඩාක් හොඳ දේවල් කරන්න පුළුවන්. හොඳම උදාහරණය මං. ඒ වගේම සෞඛ්‍ය කාරණා ගැන නොවුණත් හොඳ වීඩියෝස් කරන පිරිසක් දැන් ඉන්නවා. වෛද්‍යවරියක් විදියට මං කරන දේ ඕනෑම ක්ෂේත්‍රයක ඉන්න කෙනෙක්ට එයාලගේ ක්ෂේත්‍රයට අදාළව කරන්න පුළුවන්. හැබැයි තවමත් ගොඩාක් අය හිතන්නේ ටික්ටොක් එකෙන් කරන්න පුළුවන් නටන එක විතරයි කියලා. ඒත් මං කියනවා හොඳ සමාජයක් හදන්න පවා ටික්ටොක් එකට පුළුවන් කියලා."

වෛද්‍ය ප්‍රියා සම්මානි එහෙම කිව්වේ කතාබහ අවසානයේ කාට වුණත් ඇයගේ කතාවෙන් හිතන්න දෙයක් ඉතුරු කරලා.

■ **රුවන් එස්.සෙනවිරත්න**

ඡායාරූප - සිතුප ජයමාන්න
හැඩගැන්වීම - සනාරි අයාමා Kalopsia Beauty Lounge- මහරගම
පසුතලය - සෝලිස් හොටෙල්, පිටකෝට්ටේ

අම්මලා ළමයින්ට ගිල්ලන්ටමයි හිත

කොළඹ ජාතික රෝහලේ පුහුණු කිරීමේ හෙද නිලධාරිනී
පුෂ්පා රම්‍යානි ද සොයිසා

'ගෝනුන්ට රිලවුන්ට පැන යන්ටමයි හිත
අලියන්ට ළමයින්ට නලියන්ටමයි හිත'

කියලා කවියක් අපි අහලා තියනවනේ. ඕක දිවංගත ජනාධිපති ආර්.ප්‍රේමදාස මහත්තයා ඉස්කෝලෙ යන කාලේ ආචාර්ය මලලසේකර මහත්තයා කියපු කවියක්ලු.

පහුගිය දවසක කොළඹ ජාතික රෝහලේ පුහුණු කිරීමේ හෙද නිලධාරිනී පුෂ්පා රම්‍යානි ද සොයිසා මෙනෙවිය කියපු කතාවක් අහලා අපිට හිතුණේ 'අම්මලාට ළමයින්ට ගිල්ලන්ටමයි හිත' කියලත් ඕනනම් ඔය කවිය වෙනස් කරගන්න වුණත් බැරි නෑ කියලා. ඉතින් මේකයි කතාව...

පුංචි චණ්ඩින්ගේ බණ්ඩිය පුරවන එක හිතන තරම් ලේසිපහසු කටයුත්තක් නෙවෙයි තමයි. ඒ නිසා අම්මලා ඒ වැඩේට ගියාම ගෙදර හරියට දෙවැනි ලෝක යුද්දෙ කාලෙ වගේ වෙන බව අපි දන්නවා.

ඔය මොන දේ වුණත් පුංචි දරුවෙකුට කවන පොවනකොට අම්මාලා ඒ ගැන විශේෂ අවධානයක් දෙන්න ඕනේ. එහෙම නැති වුණොත් කෑම හිරවීමෙන් දරුවෙක් මිය යන්න වුණත් බැරි නෑ'

අනිත් කාරණාව තමයි දරුවන්ට කෑම හිරවුණාම අම්මලා වැරදි විදියට අයින් කරන්න යන එකෙනුත් දරුවන් මිය යන බවයි පුෂ්පා රම්‍යානි මෙනෙවිය ප්‍රකාශ කළේ.

"කෑම ටික හිර කරගෙන විතරක් නෙවෙයි අම්මලා ඒවා වැරදි විදියට ඉවත් කරන්න යන එකෙනුත් අනතුරට පත්වුණු ගොඩක් දරුවෝ රෝහල්ගත කරලා තියෙනවා. ඒකට ප්‍රධානම හේතුව තමයි අම්මලාගේ උවමනාවට දරුවන්ට බලහත්කාරෙන් කවන්න උත්සාහ කරන එක. දැන් ඔහොම කිව්වාම සමහරක් අම්මලා කියයි එහෙමවත් කවාගත්තෙ නැත්තම් මේ ළමයි දවසම හාමතේ කියලා. ඒත් අපේ රටේ අම්මලා තාමත් දරුවන්ට අවුරුදු දෙක තුනක් වෙනකම්ම ගෝනිබිල්ලන්ගේ සංස්කෘතියට බලෙන් කැව්වට පිටරට දරුවන්ට එහෙම නැහැ. ඒ අය යාන්තමට තමන්ගේ දරුවන්ට අවුරුද්දක් වෙනකොටම ස්වාධීනව කන බොන හැටි කියලා දෙනවා.

උදාහරණයක් විදියට නිතරම දරුවා කැමතිම කෑමක් හදලා දෙන්න උත්සාහ කරන්න ඕනේ. ඊටපස්සෙ ඒ අයට වෙනම ලස්සන පුංචි කෑම මේසයක් එහෙම ගෙනැත් දීලා කෑම බීමට ආසවක් ඇති කරවන්න පුළුවන් නම් වටිනවා. හැබැයි ඉතින් කොච්චර කිව්වත් ඕවා ප්‍රායෝගිකව කරන්න පුළුවන් දේවල් නෙවෙයි කියලා ගොඩක් අම්මාලා ඒ දේවල් කනකටවත් ගන්නේ නැහැ. ඒ නිසා ඒ අයට ඕන විදියට ගහලා බැනලා සැර වැර කරලා කවන්න උත්සාහ කරනවා. එතකොට අර දරුවෝ කෑම ටික කන්නේ කෑම අරුචියයි, අම්මට තාත්තාට තියෙන බයයි දෙකම එක්ක. ඔය කියන විදියේ අනතුරු වැඩිපුරම සිද්ධ වෙන්නෙ අන්න එහෙම වුණාම.

අවුරුදු දෙකක විතර කතා කරන්න පුළුවන් දරුවෙක් නම් ඒ ගැන වැඩිහිටියෙකුට කියන්න පුළුවන්. හැබැයි එහෙමත් බැරි අවුරුද්දක විතර දරුවෙක් නම් ගොඩක් වෙලාවට සිහි නැතුව ඇදගෙන වැටිලා මරණයට පත්වෙන්න තියෙන ඉඩ ප්‍රමාණය වැඩියි.

එහෙම වෙලාවට කිසිම විදියකින් අනවශ්‍ය විදියට කලබල වෙලා දරුවාගේ උගුරට අත දාලා කෑම ඉවත් කරන්න උත්සාහ ගන්න එපා. අවුරුද්දක වගේ දරුවෙකුට නම් මුලින්ම කරන්න ඕනේ ඒ දරුවගේ බෙල්ල හෙලවෙන්නෙ නැති වෙන්න හරහට අතට ගන්න එක. ඊටපස්සෙ තමන්ගේ වැලමිටෙන් දරුවගේ පිටට මද පහරවල් පහක් ගහන්න (උරපතු අතරට). එහෙම කරලත් කෑම පිටට නාවොත් ඇඟිලි දෙකකින් පපුවට මද තෙරපුම් පහක් ගහන්න.

හැබැයි අවුරුද්දකට වැඩි දරුවෙක් නම් ඔබ මුලින්ම කරන්න ඕනේ දරුවගේ උසේ ප්‍රමාණයට දණ ගහලා වාඩිවෙන එක. ඊටපස්සෙ ඔබේ නුපුරුදු අත දරුවගේ උදරයට යටින් තියලා පුරුදු අතින් පිටට පහරවල් පහක් ගහන්න (උරපතු දෙක අතරට). බැරි වෙලාවත් දරුවාට සිහි නැති වුණොත් පපුවෙන් 5cmක් විතර පහලට ඇඟිලි දෙකකින් පපු තෙරපුම් 15ක් විතර දෙන්න. හැකියාවක් තියෙනවා නම් දරුවගේ කටයි නහයයි දෙකම ඔයාලගේ කට ඇතුළට අරගෙන හුස්ම වාර 02ක් හෝ 05ක් දෙන්න."

එහෙමත් බැරි වුණොත් පුළුවන් තරම් ඉක්මනටම ළඟම තියෙන රෝහලකට ගෙනියන්න කටයුතු කරන්න.

කුඩා දරුවෙක් කෑමබීමකට අමතරව වෙනත් යමක් හිරකරගත්තද කිසිඳු ආකාරයකට උගුරට අත දමා එය ගැනීමට උත්සාහ නොකර මේ ආකාරයෙන් නිවැරදි ක්‍රමවේද අනුගමනය කළ යුතු බවයි ඇය කියන්නේ.

"මේ ළඟදි ටොනික් මූඩියක් හිරකරගෙන අවුරුදු දෙකක දරුවෙක් රෝහල්ගත කළා. ඒ දරුවා ටොනික් පියන් එක්ක සෙල්ලම් කරන ගමන් නොතේරුම්කමට එකක් කටේ දාගෙන. ඕක දැකපු හැටියේ කලබල වෙලා, අම්මා කිසිම හෙවිල්ලක් බැලිල්ලක් නැතුව දරුවාගේ කටට අත දාලා ඒක ගන්න උත්සාහ කරලා. ඒකෙන් වෙලා තියෙන්නෙ දරුවගේ උගුර ආසන්නයේ වගේ තිබිලා තියෙන ටොනික් මූඩිය තව ටිකක් උගුර මැදට තල්ලු වෙලා හිරවෙලා තියෙන එක. අන්තිමේදි ඒ විදියට දරුවා රෝහල්ගත කරනකොට අර ටොනික් මූඩියට උගුරේ නහර බරපතළ විදියට හානිවෙලා තිබුණා. රෝහල් කාර්ය මණ්ඩලය දරුවගේ ජීවිතය බේරගන්න කොයිතරම් මහන්සි ගත්තත් බොහොම අවාසනාවන්ත විදියට ඒ දරුවා මියගියා."

නිවැරදි ක්‍රමවේදය දැනගෙන අනුගමනය කිරීමෙන් දරුවන්ට විය හැකි එවැනි ජීවිත හානි වළක්වාගත හැකි බවයි ඇය අවසාන වශයෙන් කියා සිටියේ.

■ **ලිහිණි මධුෂිකා**

අක්කාගේ ගර්භාෂය නංගීට දන් දීලා

දීපංකර බුදුහාමුදුරුවන්ගේ කාලේ මහමේරු පර්වතය පලාගෙන ගිනිපුපුරු හතක් මතුවුණාලු. මේ ගිනිපුපුරු හතෙන් එළියට ඇවිත් තියෙන්නේ බිසෝවරු හත්දෙනෙක්ලු. ඒ තමයි මුදුන්මාල, ධර්මමාල, ගිරිමේකල, ඕම්කාර, රිද්දි, කොණ්ඩමාලා සහ රණකමාලා කියන අය. මේ අය මෙහෙම මනුස්ස ලෝකෙට ඇවිල්ලා තියෙන්නෙ දරු සම්පත් ලබන්න කියලයි ජනශ්‍රැති කතාවල සඳහන් වෙන්නෙ. හැබැයි ඉතින් මොකක්දෝ අවාසනාවකට මේ හත්දෙනාටම දරු සම්පත් ලබන්න වාසනාවක් තිබිලා නැහැ.

ඔහොම ඉන්නකොට රිද්දිමාලා දවසක් හීනයක් දැක්කලු. ඒ තමයි දීපංකර බුදුරජාණන් වහන්සේට නොයිඳුල් කපුවලින් සළුවක් වියලා දුන්නොත් හත්දෙනාටම දරු සම්පත් ලබන්න පුළුවන් කියලා. හැබැයි ඉතින් ඒ කාලේ වෙනකොට මුළු ලෝකයෙන්ම සාර්ථකව කපු වවලා තිබිලා තියෙන්නේ

අපේ රටේ විතරයි. ඒ නිසා ඒ වැඩේට මේ හත්දෙනාට ලංකාවට එන්න සිද්ධ වෙලා. පස්සේ ඉතින් මෙයාලා නේරංජන නදියෙන් නාලා කරලා එහෙම නැව් නැගලා මෙහේ ඉස්සන්ගොඩින් ගොඩබැස්සලු. එදා ඉඳන් හත්දෙනාම ඉස්සන්ගොඩට වෙලා කපු වැව්වයි කියලා තමයි කියන්නේ. එහෙම වවලා ලබාගත්තු නොයිඳුල් කපු අස්වැන්නෙන් දීපංකර බුදුහාමුදුරුවන්ට සළුවක් වියලා පූජා කළාම අර හීනේ හැබෑවටම හැබෑ වුණාලු.

දෙමව්පියන්ගේ දරු සෙනෙහස, මහාමේරු පර්වතයටත් වඩා ලොකුයි කියනවනේ. එහෙව් එකේ මේ අය දරු සම්පත් වෙනුවෙන් මහාමේරු පර්වතය පලාගෙන ආපු එක ගැන පුදුම වෙන්න කාරියක් නැහැ.

මේකත් ටිකක් ඒ වගේ කතාවක්. හැබැයි මේ කතාව අහන්න ලැබෙන්නේ එක්සත් රාජධානිය පැත්තෙන්.

මේ කියන කාන්තාව අවුරුදු 40ක දෙදරු මවක්. ඇයට අවුරුදු 34ක විවාහක බාල සහෝදරියක් ඉන්නවා. අක්කට දරුවෝ ලබන්න පින තිබුණාට මොකද නංගිට ඒ පින තිබිලා නැහැ. හේතුව ඇගේ ගර්භාෂය දරු කළලයක් දරාගෙන ඉන්න පුළුවන් ප්‍රමාණයට වර්ධනය වෙලා නැතිකම. කාලයක් තිස්සෙ ප්‍රතිකාර කළත් ඒවගෙන් කිසිම පලක් ප්‍රයෝජනයක් වෙලා නැහැ.

අන්තිමේදි නංගිට තමන්ගේ ගර්භාෂය පරිත්‍යාග කරලා හරි දරුවෙක් හදගන්න පිහිට වෙන්න මේ අක්කා තීරණය කරලා තියෙනවා. ඊටපස්සේ පහුගිය දවසක ඔක්ස්ෆර්ඩ් චර්චිල් රෝහලේදී මේ අක්කා තමන්ගේ ගර්භාෂය නංගීට පරිත්‍යාග කරලා තියනවා. සාර්ථකව ගර්භාෂ තැන්පත් කිරීමක් කළ ප්‍රථම ශල්‍යකර්මය විදියටයි මේක හඳුන්වන්නේ.

"මම මගේ වෘත්තීය ජීවිතයෙන් අවුරුදු විසිපහකටත් වඩා කාලයක් ගර්භාෂ බද්ධ කිරීම ගැන පරේයෂණ කරපු කෙනෙක්. ඒ අනුව මේ ශල්‍යකර්මය සාර්ථකව කරගන්න ලැබුණ එක ගැන අපි හැමෝටම ගොඩක් සතුටුයි. මේකට අපෙන් වෛද්‍යවරු විසිදෙනෙකුට ආසන්න කණ්ඩායමක් සම්බන්ධ වුණා. පැය නවයකුත් විනාඩි විස්සක් වගේ ඇතුළත ගර්භාෂය තැම්පත් කරලා පැය දහතක වගේ කාලයකදි සැත්කම සම්පූර්ණයෙන්ම සාර්ථකව නිමා කරගන්න අපිට පුළුවන්කමක් ලැබුණා."

ඔහොම කියන්නෙ සැත්කම කරපු වෛද්‍ය කණ්ඩායමේ නායක මහාචාර්ය රිචඩ් ස්මිත්.

කොහොම නමුත් මේ සැත්කම සාර්ථක වීමත් එක්ක දරුපල නොමැතිව ලතවෙන ලෝකෙ පුරා ඉන්න කාන්තාවන්ට තවත් අලුත් බලාපොරොත්තුවක් තබාගත හැකි බවයි ඔහු කියා සිටින්නේ.

■ ලිහිණි මධුෂිකා

ධරණී
ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත,
කොළඹ 07.
දුරකථන 0115 200 900
බෙදාහැරීමේ අංශය 0112 127204
දැන්වීම් අංශය 0112672601, 0112672603, 0761393811
ෆැක්ස් 0112 673 451
පුවත්පත නිවසටම ගෙන්වාගන්න
අමතන්න 076 1367 623

උගස් තැබූ රත්තරං
ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
රන් පවුම - 180,000/- 24KT 9999කැරට් 22 සඳහා ඉහල මිලක්
076 101 88 53
SL PROMO

රූපලාවන්‍යාගාරයක් සඳහා ඇබෑර්තු
රාජගිරියේ පිහිටි ප්‍රධාන රූපලාවන්‍යාගාරයක් සඳහා
Facial, Meni Care, Pedi Care
Foot Massage, Nail art
හොඳින් දන්නා අය සහ පුහුණුවන්නන් ඉතා ඉක්මණින් අවශ්‍යයි
ඉහල වැටුප් 0704080470

රු. 35000/- කට වැඩි ආදායමක්
විලාසිතා අත්පලඳනා, කරාබු සැකසීම.
- නිවසේ සිටම කරගෙන යා හැකිය
- නිෂ්පාදන භාර ගැනේ
- මුදල් එවලේම
- අමුද්‍රව්‍ය නිවසටම සැපයේ
වැඩි විස්තර සඳහා ඔබගේ Whatsapp අංකය SMS කරන්න.
070-6128955

උගස් රන් භාණ්ඩ
උගසට තබා සින්න වීමට යන රන් භාණ්ඩ අප ආයතනය විසින් ඔබ උගස් කල ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලකට මිලදී ගනු ලැබේ.
රන් පවුම 195,000
077 410 78 45
SL PROMO

ස්ථාවර බැංකු ඇබෑර්තු
★ දිවයිනපුරාම බැංකු කිහිපයක පවතින පුරප්පාඩු සඳහා ප්‍රාදේශීය මට්ටමින් අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.
බැ 40,000/-
18/40 ගැ/පි
(මැන් පවර් නොවේ)
0716 434 278 | 0703 346 072
0702 725 731 | 0761 125 624
0742 916 140 | 0718 853 997

දැන්වීම් සඳහා අමතන්න
0112 672 601
0112 672 603

පාසැල් ළමුන් හට ඉංග්‍රීසි ටියුෂන් Home Work ශිෂ්‍යත්ව පුහුණුව
3 වසරේ සිට උසස් පෙළ දක්වා.
London O/L
Spoken English
පන්ති පැවැත්වේ.
077 272 69 78

කාටිලේජ ගෙවීම / ඉදිමීම / වේදනාව / සන්ධි තදවීම සහිත
ආතරයිටිස් කෙටි කාලයකින් සුව කිරීම
පාරම්පරික ආලේපන ප්‍රතිකාරය
(නිවසටම ගෙන්වා ගැනීමට හැකිය)
අමතන්න 075 888 09 58
075 903 57 61
Ayurweda Sri Ravi Shailasha

නො. 17 පානදුර පාර, ඇල්ලගාව
වෛද්‍ය රවීන්ද්‍ර සමරජීව එම්. ඩී.
ශ්‍රී ලංකා ආ. වෛ. ස. ලි. ප. අංක 13470
Reg. No. ර / ක / 01310

වැඩිහිටි පියස
ඔබගේ දෙමාපියන් වැඩිහිටි පියසට භාරගැනීම ආරම්භ කර ඇත
071 813 05 78
077 508 32 99



ඒවසරයි

බියංකා නානායක්කාර ලියයි

137 කොටස

මං ඉල්ලුවේ හිනාවක් නෙවේ... ප්‍රශ්නෙකට උත්තරයක්

අංජනාගේ පැමිණීම වත්සලා ඇල්ලේපොලගේ හිතට ලොකු හයියක් විය. විජේසිංහ නෝනාගේ ගෙදර ඔවුන්ට වෙන්ව තිබුණේ කාමර දෙකක කොටසක් වුවද ඒ නිවසේ සාලය මිදුල හා කුස්සිය පරිහරණය කිරීමේ බාධාවක් ඔවුන්ට නොවීය. ඊටද ඒ මැද මිදුලක් සහිත ඒ විසල් නිවසේ බොහෝ තැනක් ඔවුන් යන්නට පෙර තිබුණේ මිනිස් ඇසුරක් නැති පාලුවකිනි. වියපත් ඔවුන් දෙදෙනා වැඩිපුර පරිහරණය කළේ ඔවුන් සිටි කොටස පමණි. වසර දෙක තුනකට වරක් ලංකාවට එන ඔවුන්ගේ දියණිය සහ පුතා නිවස ගරා වැටෙන්නට නොදී පෙනුම වෙනස් නොකර වරින් වර අලුත්වැඩියා කරන නිසා නිවස සුරැකී ඇත්තේය. විජේසිංහ නෝනාගේත් මව්පියන් ඉදිකර ඇති ඒ නිවසේ සමහර පැත්තක් අලුතින්ම බිත්ති බැඳී අලුත්වැඩියා වී තිබුණි.

"මොකද කල්පනාව..?"

අංජනා බැල්ම වෙනස් කර ඇස් මයුම විජේසිංහගේ ඇස් ළඟ තැබුවාය. ඈ මුවේ යන්තම් සිනාවක් විය.

"මං ඉල්ලුවේ හිනාවක් නෙවේ... ප්‍රශ්නෙකට උත්තරයක්."

මයුම විජේසිංහ උපැස් යුවලට යටින් ඈ දෙස බලමින් කීවේය.

"මොකද්ද දෙන උත්තරේ කියලයි හිතුවේ... මොකද ඒ කල්පනාවේ කෙලවරක් නැති කල්පනාවල් ගොඩක් තිබුණා."

අංජනා එවර සිනා නොවීම කීවාය. ඇය සිටියේ ඉස්සරහ දෙරෙහි උළුවස්සට හේත්තු වී අම්මා වැලෙහි රෙදි වනන දෙස බලාගෙනය.

"ඒ තරම් කල්පනාවල්... කල්පනා ලොව මල්වනේ වගේ නෙවේනේ..."

මයුම ඇයව යළි හිනාගැන්වීමට සේ කීවේය.

"අනේ නෑ මයුමයියා..."

අංජනා ඇල්ලේපොලට කියැවුණි.

"අන්න ෂෝක්... ඒකට මං හරි ආසයි... මෙච්චර කාලයක් වචන ඇහිඳ ඇහිඳ ඔයා මෙයා කිව්වට වඩා අයියා කිව්වම කොච්චර ලස්සනද?"

මයුම විජේසිංහගේ හිතේ සතුට වචනවලින් විතරක් නොව ඇස්වලින්ද එළියට පැන්න හැටි අංජනාට පෙනුණි.

"හා මීට පස්සෙ මං එහෙමම කතා කරන්නම්කෝ... ආවට පස්සෙම ගෙදර ගියෙ නෑ නේද ඔයා..?"

අංජනාට හදිසියේම මතක් වූයේ පෙරදා වත්සලා ඇල්ලේපොල කියූ කතාවකි. අම්මාට විජේසිංහ නෝනා කියා තිබුණේ ඔහු මේ පාසලට ආවද එකම දවසක හෝ ගමට ගියේ නැති බවකි. අංජනාගේ ප්‍රශ්නයෙන් මයුමගේ මුහුණේ පෙනුම මදක් වෙනස් වුණේය.

"ගියෙ නම් නෑ තමයි..."

"ඉතින් ඒක හොඳ නෑනෙ මයුමයියා... ඔයා එනකම් අම්මා අප්පච්චි මග බලාගෙන ඇතිනෙ..."

"එහෙම වාසනාවන්ත කාලයක් තිබුණා ඔය අනුපගෙ, අගස්තිගෙ වයසෙදි වගේ... අපේ තාත්තා නැතිවුණේ මං සාමාන්‍ය පෙළ පන්තියේ ඉන්නකොට. හැබැයි එතකොට අක්කලා දෙන්නම බැඳලා..."

"අනේ පව්නේ... එහෙම වුණාම අපි අසරණ වෙනවද කියලා දැන් මාත් දන්නවනෙ... ඉතින් ඔයාලගෙ තාත්තා කොහෙද වැඩ කළේ?"

"අපේ තාත්තා රස්සාවක් කළේ නෑ. කඩයක් කළේ. හොඳට බිස්නස් තිබ්බා. එක පාරට බිස්නස් පාඩුවෙන්න ගත්තා. කඩේ කරගන්න බැරිවුණා. අන්තිමට වැහුවා. ඊටපස්සෙ තමා තාත්තා නැතිවෙන්නේ..."

මයුම විජේසිංහගේ කතාව අසා සිටියදී අංජනාගේ හිතට දුකක් දැනුණි. ඇයට ඒ කතාවෙන් පිට පනින්න ඕනෑ වුණත් මයුමට කතාව නැවැතීමට සිතක් නැතුවා සේය.

"ඒ වෙද්දී තාත්තා පෙෂර් ෂුගර් වගේ ලෙඩ ගණනාවකට බේත් බොනවා. ඕවා ක්ලිනික් එකෙන් මාසෙටම ගෙනත් තියාගන්නේ. දවසක් රෑ තාත්තා ඒ බේත් පෙති ඔක්කොම බීලා. එච්චරයි. එදා ඉඳලා තාත්තා අපිට නෑ..."

මයුම විජේසිංහගේ හඬත් අමුතු වී තිබුණි.වත්සලා වැලේ රෙදි වනමින් සිටියද ඒ මොහොතේ එහි නොවූවාය. අම්මා එතැනින් මෑත්වෙනු නොදුටුවේ මයුම විජේසිංහගේ කතාවට එතරම් සිත ගොස් තිබූ නිසාය.

"ඉතින් අම්මා ඉන්නවනේ..."

"හ්ම්..."

"ඇයි මොකද?"

"තාත්තා නැතිවෙලා තුන් මාසෙන්ම ජීවත්වෙලා ඉන්නැද්දිම අපිට අම්මා නැතිවෙලා ගියා. එයා හරි ඉක්මනට වෙනස්වුණා අංජනා. එයාව කඩේටම ආව සේල්ස් රෙප් කෙනෙක් රවට්ටන් තිබුණා. තාත්තා ඉන්නැද්දිත් ඒ සම්බන්ධෙ තිබිලා කියලා අපි දන්නෙ පස්සෙයි. සමහරවිට තාත්තා යන්න ගිය ආසන්නම හේතුවත් ඒක වෙන්න ඇති. එයා අපි කිව්ව දේ ඇහුවෙ නෑ. එතැනින් අපේ සම්බන්ධකම් ඉවර වුණා. මං ගුරු පත්වීම ලැබෙනකම් ඉගෙනගත්තෙ අක්කලා දෙන්නගෙම ගෙවල්වල ඉඳලා. මට යනවනම් යන්න තියෙන්නෙ ඒ කාගෙ හරි ගෙදර. ඒකත් අනවශ්‍ය කරදරයක්. ඒ නිසා මෙහෙ සැපයි..."

මයුමගේ වචන හැසිරවිල්ල කෙතරම් හැඩද කියා අංජනාට හිතුණි. පැය ගාණක් දවස් ගාණක් කියන්නට විස්තර පිරුණු කතාවක් ඔහු විනාඩි ගාණකින් ඉවරවෙන සේ වචන ගානකට ගැළපුවේය.

"අනේ සොරි මං දැනන් හිටියෙ නෑ ඔයාට ඔය වගේ දුක කතාවක් තියෙන්නේ කියලා."

අංජනා සැබෑවටම පසුතැවිලි වුණාය.

"ඒකට කමක් නෑ. කොහොමත් මං කියන්න හිටියෙ ඔය විස්තර. අඩුතරමේ මට ලොකු මහත්තයාටවත් කියාගන්න බැරිවුණා මගෙ කතාව. මං මේ ලෝකෙ තනිවෙච්ච කෙනෙක් අංජනා. ඇත්තටම අගස්තිලා එක්ක මේ ගෙවන ජීවිතේ මට සතුටක්..."

මයුම විජේසිංහ කීවේ අංජනාගේ ඇස් දිහා බලාගෙනය.

අංජනා යන්තම් සිනාසුණාය.

"අපි පස්සෙ කතා කරමු... දැන් අම්මත් එක්ක ඉඩමට යන්න ඕනි. හොඳම දෙයක් මං කියන්නද..? ඔයා දැන් කවුරුහරි හොඳම කෙනෙක් හොයලා කසාද බඳින්න..."

ගෙතුළට යන්නට පෙර අංජනා කීවේ විහිලුවට නොවේ.

ඇය කාමරයට යද්දී වත්සලා ඇල්ලේපොල ඉඩමට යන්නට අලුත් ඔසරියකින් සැරසෙමින් සිටියාය. සෙනරත් ඇල්ලේපොල මිලදී ගත් ඉඩම තිබුණේ ගුරු නිවාසයේ සිට නම් පයින් යන දුරය. විජේසිංහ නෝනලාගේ ගෙදර සිට යන්නට ඒ වගේ දෙගුණයක් දුර විය.

"අපි පයින්ම යමු... කතා කර කර යනකොට දුර දැනෙන එකක් නෑ..."

වත්සලා ඇල්ලේපොල කීවේ ගෙයින් එළියට බහින්නට පෙරය. අංජනා ද ඊට කැමති වුණේය. එය සෙනසුරාදා දිනයක් වුවත් අගස්ති සහ අනූපා නිවසේ වූයේ නැත. ඔවුන් දෙදෙනා උපකාරක පන්තිවලට ගොස් සිටියහ. දෙදෙනාගේම පන්ති නිමවන්නේ සන්ධ්‍යා කාලයේය.

"මොකද මයුම ළමයා කියන්නේ..?"

වත්සලා මද දුරක් යද්දී නිහඬතාවය බින්දය. කතා නොකළත් ඉස්සරහට හමුවෙන මිනිසුන්ට වත්සලා සිනාසෙද්දී අංජනාද ඔවුන් හා සිනාසුණාය.

"එයා පව් කියලත් හිතෙනවා. මයුමගෙ පවුලේ තියෙන්නෙ මාර දුක හිතෙන කතාවක්..."

අංජනා එතෙක් වෙලා මයුම කී කතාව ඒ ලෙසින්ම වත්සලා හා කීවාය.

"හැම අම්මෙක්ම ඔහොම නොවුණාට ඔහොම අම්මලත් ඉන්නවා කියලා ඔයත් දැනගෙන ඉන්න."

"ඒකනේ. අම්මා කියන නමටත් හොඳ නෑ."

අංජනා කීවේ හද තුළ ඇතිවූ සිතුවිල්ලය.

"කොහොම වුණත් ඔයා වැඩිය ඒ දරුවා එක්ක කතාවට නොයා ඉන්න. තේනුක පුතා දැනගත්තොත් සැක හිතයි..."

"එහෙම නම් වෙන්නෙ නෑ අම්මා. එයාට මාව විශ්වාසයි."

"මං මේ අනූපා ගැනත් බයේ ඉන්නේ. තරුණ හිත්නේ. ඕවට අපිට සීමා මායිම් ලකුණු කරලා වැටවල් බඳින්න බෑනේ."

වත්සලා කියද්දී අංජනාගේ හිතේ සියුම් සැකයක් ඉහිරුණේය.

කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.